සිංහල

සංයුත්ත නිකාය -1

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

ඛන්ධක වර්ගය

1.ඛන්ධ සංයුත්තය

මූලපණ්ණාසකය

1.නකුලපිතු වර්ගය

1. නකුලපිතු සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ භග්ග ජනපදයෙහි සුංසුමාරගිරි නුවර ළඟ හෙසකලා මුව වනයෙහි වැඩ වසති. එකල නකුලපිය ගෘහපති භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, මම දැන් ජරාවෙන් දිරා ගියෙමි. වෘද්ධයිඃ මහලුයිඃ වයස්ගතයිඃ අවසාන කාලයට පැමිණියෙමි. ලෙඩ ඇහ ඇත්තෙමිඃ නිතර ලෙඩ ඇත්තෙමි. ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේත්, භාග්‍යවතුන් වහන්සේ ගේ මනවඩන භික්ෂූන් වහන්සේලාත් නිතර දක්නට නැති වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට බෝහෝ කල් හිත සැප පිණිස අවවාද කරනු මැනව, අනුශාසනා කරනු මැනවැ" යි සැලකළේය.

ගෘහපතිය, ඒක එහෙම තමයි, ගෘහපතිය ඒක එහෙම තමයි. මේ ශරීරය ලෙඩ සහිතයි. බිත්තරයක් වගෙයි. සියුම් සිවියකින් වැසී තිබෙයි. ගෘහපතිය, මේ කය පරිහරණය කරන කවුරු නමුත් මොහොතක් වත් නිරෝගිය යි පිළිගත්තේ නම් එය මෝඩකම මිස වෙන කුමක් ද? එනිසා ගෘහපතිය, මෙසේ හික්මිය යුතුයි. "ලෙඩ ශරීරයක් ඇති මගේ සිත ලෙඩ නොවේවා "යි මෙසේ ඔබ හික්මිය යුතුයි.

ඉක්බිති නකුලපිය ගෘහපති භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව යතුටින් පිළිගෙන වැද පැදකුණු කොට ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත පැමිණ වැද පසෙක හිදගත්තේ ය. පසෙක හුන් නකුලපිය ගෘහපතිට සැරියුත් තෙරණුවෝ "ගෘහපතිය, ඔබේ ඉන්ද්‍රිය බොහොම පැහැදිලියි. මුහුණේ ශොභාව පිරිසිදුයි. කලඵලියි. අද බුදුරජාණන් වහන්සේ වෙතින් බණක් අහන්නට ලැබුණේ දැයි වදාළහ. "සචාමීනි, මොකද නැත්තේ? සචාමීනි, මම දැන් භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් අමාවෙන් අභිෂෙක කරන ලද්දේ වෙමි. ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් අමාවෙන් ඔබ අභිෂෙක කරන ලද්දේ කොහොම ද? "සචාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ ළඟ ගොස් වැඳ පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට "සචාමීනි, මම දැන් ජරාදුර්වලයි... මට අනුශාසනා කළ මැනවැයි සැලකළෙමි. සචාමීනි, මෙසේ කී පසු භාග්‍යවතුන් වහන්සේ මට.. ගෘහපතිය, ඒක එහෙමයි... ලෙඩශරීර ඇති මගේ සිත ලෙඩ නො වේවා" කියා මෙසේ ඔබ විසින් හික්මිය යුතුය යි වදළහ. සචාමීනි, භාග්‍යවතුන් වහන්සේ දහම් අමාවෙන් මා අභිෂෙක කොට වදළේ මෙහෙමයි.

"ගෘහපතිය, "සචාමීනි, කොපමණකින් ලෙඩ ශරීර ඇතිව ලෙඩසිත් ඇත්තේ වෙයි ද? කොපමණකින් ලෙඩ ශරීර ඇතිව ලෙඩසිත් නැත්තේ වේද"යි වැඩිදුරටත් භාග්‍යවතුන් වහන්සේගෙන් විමසන්නට සිතුණේ නැද්ද?" සචාමීනි, සැරියුත් තෙරුන් වහන්සේගෙන් මේ කීමේ අර්ථය දැන ගැනීමටයි අප දුර සිටත් මත් එන්නේ. මේ කීමේ අර්ථය සැරියුත් තෙරුන් වහන්සේට ම වැටහෙන්නේ නම් හොඳයි.

"ගෘහපතිය, එහෙනම් අහන්න, හොඳින් මෙනෙහි කරන්න. කියන්නම්. "එසේය සචාමීනියි" නකුලපිය ගෘහපති සැරියුත් තෙරුන්ට පිළිතුරු දුන්නේ ය. සැරියුත් තෙරණුවෝ මෙසේ වදළහ.

ගෘහපතිය, ලෙඩ ශරීර ඇතිව ලෙඩ සිත් ඇති වන්නේ කෙසේ ද? ගෘහපතිය, මේ ලෝකයෙහි ආර්යයන් නො දකින, ආර්ය ධර්මයෙහි අදක්ෂ ආරය ධර්මයෙහි නො හික්මුණු නුගත්

පෘථග්ජනයා රූපය ආත්මයයි හෝ ආත්මය රූප ඇත්තකියි හෝ ආත්මයෙහි රූපය පවතියි හෝ රූපයෙහි ආත්මය පවතියයි හෝ රූපය මමයි. මගේ රූපයයි කියා හෝ තණ්හාදිට්ඨි වශයෙන් ගිලගෙන සිටී. මම රූපය වෙමි. මගේ රූපය යි ගිලගෙන සිටින ඔහු ගේ ඒ රූපය ජරාමරණයෙන් පෙරළෙයි. වෙනස් වෙයි. රූපය පෙරළීමෙන්, වෙනස් වීමෙන් ඔහුට දුක් දෙමනස් උපායාස උපදී. වෙදනාව, සංඥව, සංස්කාර, විඤ්ඤාණ ආත්මය යි හෝ ආත්මය වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ ඇත්තකැයි හෝ, ආත්මයෙහි.. විඤ්ඤාණ පවතී යයි හෝ... විඤ්ඤාණයෙහි ආත්මය පවතියයි හෝ දකී. විඤ්ඤාණය මමයි. මාගේ විඤ්ඤාණයයි ගිලගෙන සිටී. වැළඳගෙන සිටින ඔහුගේ විඤ්ඤාණ පෙරළෙයි. වෙනස් වෙයි. විඤ්ඤාණය පෙරළීමෙන් වෙනස්වීමෙන් ඔහුට දුක් දෙමනස් උපායාස ඇති වෙයි. ගෘහපතිය, මෙසේ ලෙඩශරීරයත් ලෙඩ සිතත් ඇති වෙයි.

ගෘහපතිය, ලෙඩ ශරීරය ඇතිවත් ලෙඩ නැති සිතක් ඇති වන්නේ කෙසේ ද? ගෘහපතිය, මේ ලෝකයෙහි ආර්යයන් දක්නා, ආර්ය ධර්මයෙහි දක්ෂ, ආර්ය ධර්මයෙහි හික්මුණු උගත් ආර්ය ශ්‍රාවකයා රූපය ආත්මයයි නො දනී. ආත්මය රූප ඇත්තකැයි හෝ නො දනී. ආත්මයෙහි රූපය පවතියි හෝ රූපයෙහි ආත්මය පවතී යයි හෝ නො දනී. රූපය මමයි මගේ රූපයයි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො ගෙන නො මැඩෙනසුලුව සිටී. රූපය මම ය මගේ රූපයයි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො ගෙන වැළඳ නො ගන්නා ඔහු ගේ එම රූපය ජරාමරණයෙන් පෙරළෙයි. වෙනස් වෙයි. රූපය පෙරළීමෙන් වෙනස් වීමෙන් ඔහුට දුක් දෙමනස් උපායාස නුපදී.

වෙදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ ආත්මය යි නො දකී... වෙදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ මමයි මගේ වෙදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණයයි තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගෙන නො මැඩෙනසුලුව වසයි. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගෙන නො වැළදගන්නා ඔහු ගේ වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ, ජරාමරණයෙන් පෙරළෙයි. වෙනස් වෙයි. වේදනා.. විඤ්ඤාණ පෙරළීමෙන්,

වෙනස් වීමෙන් ඔහුට දුක් දෙම්නස් උපායාස තුපදී. ගෘහතිය, මෙසේ ලෙඩ ශරීරයත් ලෙඩ නැති සිතත් වෙයි.

සැරියුත් තෙරණුවෝ මේය වදළහ. සතුටු සිත් ඇති නකුලපිය ගෘහපති ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහක්සේ ගේ දේශනාව සතුටින් පිළිගත්තේ ය.

2. දෙවදහ සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි ශාක්‍යයන් ගේ දෙවදහ නම් නියම්ගම වසන සේක. එකල අපර දිග ජනපදයට යනු කැමති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ "සවාමීනි, අපි අපරදිග ජනපදයට යාමටත් එහි විසීමටත් කැමැත්තෙමු"යි සැලකළහ.

"මහණෙනි, ඔබ සාරිපුත්තගෙන් ඇසුවහු ද?" සවාමීනි, අපි සැරියුත් තෙරුන්ගෙන් නො ඇසුවෙමු." "මහණෙනි, සාරිපුත්තගෙන් අසව්. මහණෙනි, සාරිපුත්ත පණ්ඩිතයෙකි. සබ්‍රහ්මචාරීන්ට අනුග්‍රහ කරන්නෙකි." එසේය ස්වාමීනි,"යි භික්ෂූහු පිළිතුරු දුන්හ.

එකල ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි ගස් ගොමුවක වැඩ වසති. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගී වැඳ පැදකුණු කොට සැරියුත් තෙරුන් වෙත ගියහ. ගොස් සැරියුත් තෙරුන් සමග සතුටු සාමීචි කථා කොට නිමවා පසෙක හුන්හ. පසෙක හුන් ඒ භික්ෂූහු "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, අපි අපරදිග ජනපදයට යාමටත්, එහි වසන්නටත් කැමැත්තෙමු. භාග්‍යවතුන් වහන්සේගෙනුත් ඇසුවෙමුයි සැලකළහ.

"ඇවැත්නි, වෙනත් රාජ්‍යවලට ගිය භික්ෂූන්ගෙන් ප්‍රශ්න අසන ක්ෂත්‍රිය පඬිවරුත්, බ්‍රාහ්මණ පඬිවරුත්, ගෘහපති පඬිවරුත්, ශ්‍රමණ පඬිවරුත් සිටිති. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු "ආයුෂ්මතුන් ගේ ශාස්තෘන් වහන්සේ කිනම් වාද ඇත්තෙක් ද? කුමක් කියන්නෙක් දැයි විමසති, මොක ද? යම් සේ පිළිතුරු දෙන ආයුෂ්මතුන් වහන්සේලා

භාග්‍යවතුන් වහන්සේ විසින් වදළ දෙය ප්‍රකාශ කරන්නෝත් නම් භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නින්ද නො කරන්නෝත් නම්, දහමටත් අනුකූලව පවසන්නෝ නම් කරුණු සහිත යම් වාදානුවාදයක් ගර්හා කටයුතු බවට පැමිණෙන්නේත් නැත් නම් එසේ ධර්මය මැනවින් ඇසූහු ද? මනාව ඉගෙන ගත්තාහු ද? මනාව මෙනෙහි කළාහු ද? මනාව දරුවාහු ද? මනාව අවබොධ කළාහු ද."

ඇවැත්නි, අපි ආයුෂ්මත් සැරියුත් තෙරුන් ගෙන් මේ කියමනේ අර්ථය දැන ගැනීමට ඇත සිට එන්නෙමු. මේ වචනයේ තේරුම ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට වැටහෙන්නේ නම් ඉතා මැනවි.

ඇවැත්නි, එහෙනම් අසව්, හොඳින් මෙනෙහි කරව්, කියන්නෙමි. ඇවැත්නි, එසේය යි ඒ භික්ෂූහු සැරියුත් තෙරුන්ට පිළිතුරු දුන්හ. " ඇවැත්නි, වෙනත් රාජ්‍යවලට ගිය භික්ෂූන්ගෙන් ප්‍රශ්න අසන ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ පණ්ඩිතයෝ සිටිති. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ආයුෂ්මතුන් ගේ ශාස්තෘන් වහන්සේ කුමන වාද ඇත්තෙක් ද? කුමක් කියන්නෙක් දැයි විමසති.

ඇවැත්නි, මෙසේ ඇහුවම ඔබලා ඇවැත්නි, අප ගේ ශාස්තෘන් වහන්සේ ඡන්දරාගය නැසීම පවසන සේකැයි මෙසේ ප්‍රකාශ කරව්. ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කළාමත් මත්තෙහිත් ප්‍රශ්න අසන ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ පඬිවරු සිටිති. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ආයුෂ්මතුන් ගේ ශාස්තෘන් වහන්සේ කුමක ඡන්දරාගය නැසීම කියන්නාහු දැයි විමසති.

ඇවැත්නි, මෙසේ ඇහුව ම ඔබලා "ඇවැත්නි, ශාස්තෘන් වහන්සේ රූපයෙහි ඡන්දරාගය නැසිය යුතුය යි පවසන සේක. වේදනාවෙහි, සංඥාවෙහි, සංස්කාරයෙහි, විඥානයෙහි ඡන්දරාගය නැසිය යුතුය යි පවසන සේකැයි මෙසේ ප්‍රකාශ කරව්. ඇවැත්නි, මෙහෙම ප්‍රකාශ කළත් මත්තෙහිත් ප්‍රශ්න අසන ක්ෂත්‍රිය.. ශ්‍රමණ පඬිවරු සිටිති. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ආයුෂ්මතුන් ගේ ශාස්තෘන් වහන්සේ කවර ආදීනවයක් දැක රූපයෙහි.. විඥානයෙහි ඡන්දරාගය නැසිය යුතුය යි පවසනසේක්ද යි විමසති.

ඇවැත්නි, මෙහෙම ඇහුවම ඔබලා "ඇවැත්නි, රූපයෙහි.. සංඥාවෙහි පහ නො වූ රාග ඇති, පහ නො වූ ඡන්ද ඇති, පහ නො වූ ප්‍රේම ඇති, පහ නොවූ පිපාස ඇති, පහ නො වූ පරිදහ ඇති,පහ නො වූ තෘෂ්ණා ඇති ඔහුට රූපය... සංඥාව පෙරළීමෙන්, වෙනස් වීමෙන් සොක - පරිදෙව - දුකඛ - දෙමනස්ස - උපායාස උපදි. ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ මේ ආදීනව දක රූපයෙහි... විඤ්ඤාණයෙහි ඡන්දරාගය නැසීම පවසන සේකැයි ප්‍රකාශ කරවි.

ඇවැත්නි, මෙසේ ප්‍රකාශ කළාමත් මත්තෙහි ප්‍රශ්න අහන ක්ෂත්‍රිය.. ශ්‍රමණ පඩිවරු සිටිති. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ආයුෂ්මතුන් ගේ ශාස්තෘන් වහන්සේ කිනම් ආනිශංසයක් දක රූපයෙහි... විඤ්ඤාණයෙහි ඡන්දරාගය නැසීම පවසන සේක්දැයි අසති. ඇවැත්නි, මෙසේ ඇසුවම ඔබලා "ඇවැත්නි, රූපයෙහි... විඤ්ඤාණයෙහි පහ වූ රාග, ඡන්ද, ප්‍රේම, පිපාසා, පරිදහ, තෘෂ්ණා ඇති පුද්ගලයාට ඒ රූප.. විඤ්ඤාණයෙහි පෙරළීමෙන් වෙනස් වීමෙන් සොක - පරිදෙව - දුකඛ - දෙමනස්ස - උපායාස නුපදි. ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ මේ අනුසස් දක රූපයෙහි... විඤ්ඤාණයෙහි ඡන්දරාගය නැසීම පවසන සේකැයි ප්‍රකාශ කරවි.

ඇවැත්නි, අකුසල දහම්වලට පැමිණ වාසය කරන්නාට ඉහාත්මයෙහිත් දුක් නැති, තැවීම් නැති, දැවීම් නැති සැප විහරණයක් වන්නේ නම්, කය බිඳී මරණින් මතු සුගතිය බලාපොරොත්තු විය යුතු නම් භාග්‍යවතුන් වහන්සේ මේ අකුසල දහම් දුරු කිරීම ප්‍රශංසා නො කරන සේක. ඇවැත්නි, අකුසල දහම් වලට පැමිණ වාසය කරන්නාට ඉහාත්මයෙහිත් දුක්, තැවීම්, දැවීම් ඇති දුක් විහරණයන් වේද, කය බිඳී මරණින් මතු දුගතියත් කැමති විය යුතුද, එබැවින් භාග්‍යවතුන් වහන්සේ අකුසල දහම් දුරු කිරීම ප්‍රශංසා කරන සේක.

ඇවැත්නි, කුසල් දහම්වලට පැමිණ වාසය කරන්නාට ඉහාත්මයෙහිත් දුක්, තැවීම්, දැවීම සහිත දුක් විහරණයක් වන්නේ නම් කය බිඳී මරණින් මතු දුගතිය බලාපොරොත්තු විය යුතුත් නම්

භාග්‍යවතුන් වහන්සේ කුසල් දහම් රැස් කිරීම ප්‍රශංසා නො කරන සේක. ඇවැත්නි, කුසල් දහම්වලට පැමිණ වාසය කරන්නාට ඉහාත්මයෙහිත් දුක් තැවීම් දැවීම් රහිත සැපවිහරණයක් වන්නේත් නම්, කය බිඳී මරණින් මතු සුගතිය බලාපොරොත්තු විය යුතුත් නිසා කුසල් දහම් රැස් කිරීම ප්‍රශංසා කරන සේක.

පැරියුත් තෙරුන් වහන්සේ මෙය වදළ සේක. සතුටු සිත් ඇති භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් පැරියුත් තෙරුන් වහන්සේ ගේ දෙශනාව පිළිගත්හ.

3. හාලිදිකානි සූත්‍රය

එක් කලෙක ආයුෂ්මත් මහාකච්චාන තෙරුන් වහන්සේ අවන්ති ජනපදයෙහි කුරරඝර නුවර ළඟ පපාත පර්වතයෙහි වසති. එකල හාලිදිකානි ගෘහපති මහාකච්චාන තෙරුන් වෙත පැමිණ වැඳ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයේ දී නිවාසය අත හැර නිවාසයෙහි නො හැසිරෙන ගම හා නො වසන, කාමයන්ගෙන් මිදුණු සසර පෙරටු නො කළ භික්ෂුව කොහොම නම් ජනකාව සමඟ විරුද්ධ කථා නො කරන්නේ ද? " කියා වදළ සේක.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් වදළ මේ කියමනේ අර්ථය විස්තර වශයෙන් දත යුත්තේ කෙසේද?" යි සැළකළේය.

ගෘහපතිය, රූපස්කන්ධය විඤ්ඤාණයේ නිවාසයයි. රූපස්කන්ධයෙහි බැඳුණු විඤ්ඤාණය නිවාසයෙහි හැසිරෙන්නායයි කියනු ලැබේ. වෙදනාස්කන්ධය,... සංස්කාරස්කන්ධය නිවාසයයි. වෙදනාස්කන්ධයෙහි.. සංඛාරස්කන්ධයෙහි බැඳුණු විඤ්ඤාණය නිවාසයෙහි හැසිරෙන්නා යයි කියනු ලැබේ. ගෘහපතිය, මෙසේ නිවාසයෙහි හැසිරෙන්නා නම් වෙයි.

ගෘහපතිය, නිවාසයෙහි නො හැසිරෙන්නේ කෙසේ ද? ගෘහපතිය, රූපස්කන්ධයෙහි යම් රාගයක්, යම් ඡන්දයක්, යම් සතුටක්, යම් තණ්හාවක්, යම් උපයක්, යම් උපාදානයක්, අකුසල් සිතට

සථාන වූ අනුසය ධර්මයක් වෙයි ද? ඒවා තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදි. මුලිනුපුටා දමන ලදි. කරටි කැපූ තල්ගස් මෙන් කරන ලදි. නැවත හට නො ගන්නා ලෙස කරන ලදි, වෙදනා... සංඛාර ස්කන්ධයෙහි යම් ඡන්දයක්... අනුසයක් වෙයිද ඒවා... නැවත හට නො ගන්නා ලෙස කරන ලදි. එබැවින් තථාගතයන් වහන්සේ අනොකසාරී නම් වෙති. ගෘහපතිය, අනොකසාරී නම් වන්නේ මෙහෙමයි.

ගෘහපතිය, නිවාසයෙහි හැසිරෙන්නේ කෙසේ ද? ගෘහපතිය, රූප නිමිත්ත නැමති නිවාසයෙහි උපන් කෙලෙස්වල පැහිරීම. බැඳීම නිවාසයෙහි හැසිරීම නම් වෙයි. ශබ්ද.. ධර්ම නිමිත්ත නැමති නිවාසයෙහි උපන් කෙලෙස්වල පැහිරීම, බැඳීම නිවාසයෙහි හැසිරීමයි. ගෘහපතිය, නිවාසයෙහි හැසිරෙන්නේ මෙසේ ය.

ගෘහපතිය, නිවාසයෙහි නො හැසිරීම වන්නේ කෙසේ ද? ගෘහපතිය, රූප නිමිත්ත නැමති නිවාසයෙහි කෙලෙස්වල පැහිරීම, බැඳීම තථාගතයන් වහන්සේ ප්‍රහීණ කළහ. මුලිනුපුටා දමුහ. කරටි කැපූ තල්ගසක් මෙන් කළහ. නැවත නො හටගන්නා ලෙස කළහ. මතු නුපදනා ලෙස කළහ. එබැවින් තථාගතයන් වහන්සේ අනොකසාරී නිවාසයෙහි නො හැසිරෙන්නායයි කියනු ලැබේ. ශබ්ද නිමිත්ත... ධර්ම නිමිත්ත නැමති නිවාසයෙහි කෙලෙස්වල පැහිරී. බැඳීම තථාගතයන් වහන්සේ ප්‍රහීණ කළහ... එබැවින් නිවාසයෙහි නො හැසිරෙති කියනු ලැබේ.

ගෘහපතිය, ගමෙහි ඇසුර ඇත්තෙක් වන්නේ කෙසේ ද? ගෘහපතිය, මේ සසුනෙහි සමහරු ගිහියන් සමග මිශ්‍රව එකට සතුටු වෙමින් දුක් වෙමින් සුවපත් කල සුවපත් වෙමින් දුක්පත් කල්හි දුක්වෙමින් වසති. කටයුතු කර්මාන්ත ඇති වූ විට තවත් එහි යෙදෙති. ගෘහපතිය, මෙසේ ගමෙහි ඇසුර ඇති වෙයි.

ගෘහපතිය, කෙසේ ගමෙහි ඇසුර ඇති නො වන්නේ වෙයි ද? මේ සසුනෙහි සමහරු ගිහියන් සමග මුසු නො වී, සමග සතුටු නො වෙමින්, සමග ශෝක නො කරමින්, සුවපත් කල්හි සුවපත් නො වෙමින්, දුක්පත් කල්හි දුක්පත් නො වෙමින් වසති. කටයුතු කර්මාන්ත ඇති වූ විට එහි නො යෙදෙති. ගෘහපතිය, මේසේ ගමෙහි ඇසුර ඇතිවන්නේ නො වෙයි.

ගෘහපතිය, කෙසේ කාමයන්ගෙන් හිස් නො වන්නේ වේ ද? ගෘහපතිය, මේ සසුනෙහි සමහරු වැනූ කාමවල පහ නො වූ රාග ඇතිව පහ නොවූ ඡන්ද, ප්‍රේම, පිපාස, දැවිලි, තණ්හා ඇතිව වසති. මෙසේ කෙලෙසකාමවලින් හිස් නො වන්නේ වෙයි.

ගෘහපතිය, කෙසේ නම් කාමයන්ගෙන් සිස් වන්නේ වේ ද? ගෘහපතිය, මේ ශාසනයෙහි සමහරු කාමවල පහ වූ රාග, ඡන්ද, ප්‍රේම, පිපාස, දැවිලි, තණ්හා ඇතිව වසති. ගෘහපතිය, මෙසේ කාමවලින් හිස් වූයේ වෙයි. ගෘහපතිය, කෙසේ සසර පෙරටු කොට නොමැත්තේ වේ ද? ගෘහපතිය, මේ ශාසනයෙහි සමහරෙකුට මතු මෙවන් රූප ඇත්තේ වෙමි. වෙදනා, සංඥ, සංස්කාර, විඥන ඇත්තේ වෙමියි මෙසේ අදහස් නො වෙයි. ගෘහපතිය. මෙසේ සසර පෙරටු කොට නැත්තේ වෙයි.

ගෘහපතිය, කෙසේ නම් ජනතාව සමග විරුද්ධ කථා කරන්නේ වෙයි ද? ගෘහපතිය, මේ ශාසනයෙහි සමහරු මෙසේ කථා කරති. තෝ මේ සසුන නො දන්නෙහිය. මම මේ සසුන දනිමි. කිම? තෝ මේ සසුන දන්නෙහි ද? තෝ වරදවා පිළිපදින්නෙහිය. මම නිවැරදිව පිළිපදිමි. පළමු කිව යුත්ත පසුව කියන්නෙහිය. පසුව කිවයුත්ත පළමු කියන්නෙහි ය. මගේ කියමන අර්ථවත් ය. තොපගේ අර්ථවත් නො වෙයි. තෝ බෝහෝ කල් පුරුදු කළ දේ පෙරළී ගියේ ය. තට වාදරොපණය කරන ලදි. වාදයෙන් මිදීමට උක්සාහ ගන්න. නිග්‍රහ කරන ලදි. හැකි නම් මිදෙන්න. ගෘහපතිය, මෙසේ ජනතාව සමග විරුද්ධ කථා කරන්නේ වෙයි.

ගෘහපතිය, ජනතාව සමග විරුද්ධ කථා නො කරන්නේ කෙසේ ද? ගෘහපතිය, මේ සසුනෙහි සමහරු මෙබඳු කථා නො කරති. තෝ මේ සසුන නො දන්නෙහිය... හැකි නම් මිදෙන්න ගෘහපතිය, මෙසේ ජනතාව සමග විරුද්ධ කථා නො කරන්නේ වෙයි.

ගෘහපතිය, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක වර්ගයෙහි මාගන්දිය ප්‍රශ්නයෙහි ලා ගෙය හැර ගෙයි නො හැසිරෙන, ගමෙහි ඇඳුර නො කරන, කාමයන්ගෙන් හිස් වූ, යසර පෙරටු නො කළ, මුනිවරයා ජනයා සමග විරුද්ධ කථා නො කරන්නේ යයි යමක් වදළ සේක් නම් ගෘහපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදළ මේ කථාවෙහි අර්ථය විස්තර වශයෙන් මෙසේ දත යුතු යි.

4. දුකියහාලිද්දිකානි සූත්‍රය

එක් සමයෙක්හි ආයුෂ්මත් මහාකච්චාන තෙරහු අවන්ති ජනපදයෙහි කුරරඝර පපාත පර්වතයෙහි වසති. ඉක්බිති හාලිද්දිකානි ගෘහපති මහාකච්චාන තෙරුන් වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍ර ප්‍රශ්නයෙහි දී යම් ඵ මහණ බමුණු කෙනෙක් නිවනෙහි මිදුණාහු ද, මුවුහු ඒකාන්තයෙන් නිෂ්ටාවට පැමිණියාහු ය. ඒකාන්තයෙන් යොග ක්ෂය කළාහුය. ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාව ඇත්තහුය. ඒකාන්තයෙන් කෙළවරට පැමිණියාහු ය. දෙවිමිනිසුන්ට ශ්‍රෙෂ්ඨයහ යි දෙශනා කරන ලදි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදළ මේ කියමනෙහි අර්ථය විස්තර වශයෙන් කෙසේ දත යුතු දැයි" සැලකළේය.

ගෘහපතිය, රූපස්කන්ධයෙහි යම් ඡන්දයක්, රාගයක්, සතුටක්, තණ්හාවක්, උපයක්, උපාදනයක්, අකුසලයිතට ස්ථානයක්, අනුසයක් වෙයි නම්, ඒවා ක්ෂය වීමෙන්, විරාගයෙන්, නිරොධයෙන්, දුරලීමෙන්, බැහැර කිරීමෙන් සිත මනාව මිදුණේයයි කියනු ලැබේ. වෙදනා... විඤ්ඤාණ ස්කන්ධයෙහි යම් ඡන්දයක්... අනුසයක් වෙයි නම් ඒවා ක්ෂය වීමෙන්.... සිත මනාව මිදුණේ ය යි කියනු ලැබේ.

ගෘහපතිය, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍ර ප්‍රශ්නයෙහි සැකෙවින් වදරන ලද දෙශනාවෙහි අර්ථය විස්තර වශයෙන් දත යුතුයි.

5. සමාධිභාවනා සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත දෙවිරම වසන සේක. එහි දී භික්ෂූන් අමතා මෙය වදළහ. මහණෙනි, සමාධිය වඩවි. මහණෙනි, සමාධිගත භික්ෂුව ඇති සැටියෙන් දනී. කුමක් ඇති සැටියෙන් දනී ද? රූපයේ හට ගැනීමත්, නැති වීමත්, වෙදනාවේ ඇති වීමත්, නැති වීමත්, සංඥාවේ ඇති වීමත් නැති වීමත් සංස්කාරයේ ඇති වීමත් නැති වීමත් විඤ්ඤනයේ ඇති වීමත් නැති වීමත් දනී.

මහණෙනි, රූපයේ හට ගැන්ම කුමක් ද? වේදනාවේ හට ගැන්ම කුමක් ද? සංඥාවේ හට ගැන්ම කුමක් ද? සංස්කාරයේ හට ගැන්ම කුමක් ද? විඤ්ඤනයේ හට ගැන්ම කුමක් ද?

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු නම සතුටු වෙයි. මැනවින් කියයි. බැසගෙන සිටී. කුමක් ගැන සතුටු වෙයි ද? මැනවැයි කියයි ද? බැස ගෙන සිටී ද? රූපයට සතුටුවෙයි. මැනවැයි කියයි. එහි බැස ගෙන සිටී. රූපය ගැන සතුටු වන, මැනවැයි කියන, එහි බැස ගෙන සිටින ඔහුට තණ්හාව උපදී. රූපයෙහි යම් තණ්හාවක් වෙයි ද? එය උපාදනය යි. උපාදන ප්‍රත්‍යයෙන් ඔහුට භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාති වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ, සෝක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස ඇති වෙයි. මෙසේ මුළු මහත් දුක්රාශියේ හට ගැනීම වෙයි.

වෙදනා, සංඥ, සංස්කාර, විඤ්ඤන කැමති වෙයි. මැනවි කියයි. බැස ගෙන සිටී. වෙදනා... විඤ්ඤන කැමතිවන, මැනවැයි කියන එහි බැස ගෙන සිටින ඔහුට තණ්හාව උපදී. එය උපාදනයයි. උපාදන ප්‍රත්‍යයෙන්.... උපායාස ඇති වෙයි. මෙසේ මුළු මහත් දුක් රාශියේ හට ගැනීම වෙයි. මහණෙනි, මේ රූපයේ... විඤ්ඤනයේ හට ගැනීමයි.

මහණෙනි, රූපයේ නැති වීම කුමක් ද? වෙදනා.. විඤ්ඤනයේ නැති වීම කුමක් ද? මේ සඳහනෙහි භික්ෂු නම කැමති නො වෙයි. මැනවැයි නො කියයි. එහි බැස ගෙන නො සිටී. කුමක් කැමති නො වන්නේ ද? මැනවැයි නො කියන්නේ ද? බැස ගෙන නො

සිටින්නේ ද? රූපය... විඤ්ඤාණය කැමති නොවෙයි, මැනවැයි. නොකියයි. එහි බැස ගෙන නොසිටී. රූපය.. විඤ්ඤාණය කැමතියි නොකියන, මැනවැයි නොකියන, එහි බැස ගෙන නොසිටින ඔහුට රූපයෙහි යම් තණ්හාවක් ඇද්ද එය නිරුද්ධ වෙයි. තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වෙයි. භව නිරෝධයෙන් ජාති නිරෝධය වෙයි. ජාති නිරෝධයෙන් ජරාමරණ සොක පරිදේව දුකඛ දොමනස්ස උපායාස නිරෝධය වෙයි. මෙසේ මුළු මහත් දුක් රාශියේ නිරෝධය වෙයි. මහණෙනි, මේ රූපයෙහි.... විඤ්ඤාණයෙහි නිරෝධයයි.

6. පටිසල්ලාන සූත්‍රය.

මහණෙනි, කාය විවේකයෙහි යෙදෙව්. මහණෙනි, විවේකයෙහි යෙදුණු භික්ෂුව ඇති සැටියෙන් දැන ගනී. කුමක් ඇති සැටියෙන් දනී ද? රූපයෙහි ඇති වීම නැති වීම දනී, වේදනා.. සංඥාවේ ඇති වීම නැති වීම දනී. මහණෙනි, රූපයේ... විඤ්ඤාණයේ ඇති වීම කුමක් ද?

මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව කැමති වෙයි. මැනවැයි කියයි. එහි ගිලී සිටී. කැමති වන්නේ කුමක් ද? කුමක් මැනවැයි කියා ද? කුමක ගිලී සිටී ද? රූපය.. විඤ්ඤාණය කැමති වෙයි. මැනවැයි කියයි. එහි ගිලී සිටී. රූපය... විඤ්ඤාණය කැමති වන මැනවැයි කියන, එහි ගිලී සිටින ඔහුට තණ්හාව ඇති වෙයි. එය උපාදානයයි. උපාදාන හේතුවෙන්... උපායාස ඇති වෙයි. මෙසේ මුළු මහත් දුක් රැසේ ඇති වීම වෙයි. මහණෙනි, මේ රූප... විඤ්ඤාණයේ ඇති වීමයි.

මහණෙනි, රූපයෙහි... විඤ්ඤාණයෙහි නැති වීම කුමක් ද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂු නම කැමති නොවෙයි. මැනවැයි නොකියයි. එහි නොගිලෙයි. කුමක් කැමති නොවෙයි ද? මැනවැයි නොකියයි ද? කුමක නොගිලෙයි ද? රූපය... විඤ්ඤාණය කැමති නොවෙයි. මැනවැයි නොකියයි. එහි නොගිලෙයි.

රූපය... විඤ්ඤාණය කැමති නොවන, මැනවැයි නොකියන, එහි නොගිලෙන ඔහුට රූපයෙහි... විඤ්ඤාණයෙහි යම් තෘෂ්ණාවක් ඇත් නම් එය නැති වෙයි. තණ්හාව නැති වීමෙන්... උපායාස නැති වෙයි. මෙසේ මුළු මහත් දුක් රැසේ නැති වීම වෙයි. මහණෙනි, මේ රූපයෙහි... සංඥාවෙහි නැති වීම යි.

7. පඨම උපාදානපරිඤ්ඤා සූත්‍රය

මහණෙනි, ඔබලාට මම ය මාගේ ය යන උපාදානයෙන් ඇති වන භයත් අනුපාදානයෙන් ඇති වන අභයත් දේශනා කරමි. එය අසව්. මනාව මෙනෙහි කරව්. කියමියි වදළහ. එසේය ස්වාමීනියි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

මහණෙනි, උපාදානයෙන් වන භය කුමක් ද? මහණෙනි, මෙහි ආර්යයන් නොදක්නා, ආර්ය ධර්මයෙහි අදක්ෂ, ආර්ය ධර්මයෙහි නොහික්මුණු, සත්පුරුෂයන් නොදක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, සත් පුරුෂ ධර්මයෙහි නොහික්මුණු නුගත් පෘථග්ජන මිනිසා රූපය ආත්මය යි හෝ ආත්මය රූපවත්ය යි හෝ ආත්මයෙහි රූපය පවතී කියා හෝ රූපයෙහි ආත්මය පවතී කියා හෝ දකී. ඔහු ගේ රූපය පෙරළෙයි. වෙනස් වෙයි. ඔහු ගේ ඒ රූපය පෙරළීමෙන් වෙනස් වීමෙන් විඤ්ඤාණය රූප පරිවර්තනයට අනුව පෙරළෙයි. රූප පෙරළියට අනුව පෙරළුණු සිතින් උපන් තණ්හා භයත්, අකුශල ධර්මත් ඔහු ගේ කුසල් සිත මැඩ ගෙන සිටී. සිත මැඩීමෙන් තැති ගැනීම් ඇත්තේ ත්, දුක් ඇත්තේ ත්, අපෙක්ෂා ඇත්තේ ත් වෙයි. දැඩි කොට ගැනීමෙන් බියට පත් වෙයි.

වේදනා.... සංඥාව ආත්මය යි හෝ ආත්මය වේදනා... සංඥාවය යි හෝ ආත්මයෙහි වේදනා.. සංඥා පවතීයයි හෝ දකී. වේදනා.. සංඥා පෙරළෙයි... වේදනා.. සංඥා පෙරළියට අනුව පෙරළුණු සිතින් උපන් තණ්හා භයත්, අකුසල ධර්මත් ඔහු ගේ කුසල් සිත මැඩ ගෙන පවතී. සිත මැඩීමෙන් තැති ගැනීම් ඇත්තේ ත්, දුක් ඇත්තේ ත්, අපෙක්ෂා ඇත්තේ ත් වෙයි. දැඩි කොට ගැනීමෙන් බියට පත් වෙයි. මහණෙනි, මෙසේ වනාහි උපාදානයෙන් බිය ඇති වෙයි.

මහණෙනි, අනුපාදනයෙන් අභය ඇති වන්නේ කෙසේ ද? මහණෙනි, මෙහි ආර්යයන් දකින, ආර්ය ධර්මයෙහි දක්ෂ, ආර්ය ධර්මයෙහි හික්මුණු, සත්පුරුෂයන් දකින, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු උගත් ආර්ය ශ්‍රාවකයා රූපය ආත්මයයි හෝ ආත්මය රූපයයි හෝ ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ නො දනී. ඔහු ගේ ඒ රූපය පෙරළෙයි. වෙනස් වෙයි. රූපය පෙරළීමෙන් වෙනස් වීමෙන් ඔහු ගේ විඤ්ඤාණය රූප පරිවර්තනයට අනුව නො පෙරළෙයි. රූප පෙරළියට අනුව පෙරළුණු සිතින් උපන් තණ්හා භයත් අකුසල ධර්මයත් ඔහු ගේ සිත මැඩ ගෙන නො සිටී. සිත මැඩීමෙන් තැති ගැනීම් ඇත්තේ ත් දුක් ඇත්තේ ත් අපෙක්ෂා ඇත්තේ ත් නො වෙයි. දැඩි කොට ගැනීමෙන් බියට පත් නො වෙයි.

වේදනා.. විඤ්ඤාණ ආත්මයයි හෝ ආත්මය වේදනා.. විඤ්ඤාණයයි හෝ වේදනා... විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි හෝ ආත්මයෙහි වේදනා... විඤ්ඤාණ ඇතැයි හෝ නො දනී. ඔහුගේ ඒ වේදනා... විඤ්ඤාණ පෙරළෙයි. වෙනස් වෙයි. වේදනා... විඤ්ඤාණ පෙරළීමෙන් වෙනස් වීමෙන් ඔහු ගේ විඤ්ඤාණය වේදනා... විඤ්ඤාණ පරිවර්තනයට අනුව නො පෙරළෙයි. පෙරළුණු සිතින් උපන් තණ්හා භයත්, අකුසල ධර්ම ත් ඔහු ගේ සිත මැඩ ගෙන නො සිටී. සිත මැඩීමෙන් තැති ගැනීම්, දුක්, අපෙක්ෂා ඇත්තේ ත් නො වෙයි. දැඩි කොට ගැනීමෙන් බියට පත් නො වෙයි. මහණෙනි, මෙසේ අනුපාදනයෙන් අභය වෙයි.

8. දුතිය උපාදපරිකස්සනා සූත්‍රය

මහණෙනි, දැඩි කොට ගැනීමෙන් ඇති වන භයත් දැඩි කොට නො ගැනීමෙන් ඇති වන අභයත් ඔබලාට දෙශනා කරමි. එය මනාව අසව්. මෙනෙහි කරව්. දෙසන්නෙමි. මහණෙනි, දැඩි කොට ගැනීමෙන් උපදනා භය කෙසේ ද?

මහණෙනි, මෙහි නුගත් පෘථග්ජනයා රූපය... විඤ්ඤාණය මගේ ය. මම වෙමි. මා ගේ ආත්මය යි දකියි. ඔහුගේ ඒ රූපය...

විඤ්ඤාණය පෙරළෙයි. වෙනස් වෙයි. රූපයේ... විඤ්ඤාණයේ පෙරළීමෙන් වෙනස් වීමෙන් ඔහුට සොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස උපදී. මහණෙනි, මෙසේ දැඩි කොට ගැන්මෙන් බිය උපදී.

මහණෙනි, දැඩිව නො ගැනීමෙන් අභය වන්නේ කෙසේ ද? මහණෙනි, මෙහි උගත් ආර්ය ශ්‍රාවකයා රූපය... විඤ්ඤාණය මගේ නො වෙයි. මම නො වෙමි. මගේ ආත්මය නො වේය යි විදර්ශනා නුවණින් දකී. ඔහු ගේ ඒ රූප.... විඤ්ඤාණ පෙරළෙයි. වෙනස් වෙයි. රූප..විඤ්ඤාණ පෙරළීමෙන් වෙනස් වීමෙන් ඔහුට සොක, පරිදෙව, දුක්ඛ, දෙමනස්ස, උපායාස නූපදී.

මහණෙනි,මෙසේ දැඩි කොට නො ගැනීමෙන් අභය ඇති වෙයි

9. පඨම අතීතානාගත සූත්‍රය

මහණෙනි, අතීත අනාගත රූප අනිත්‍යයි. වර්තමාන රූප ගැන කියනුම කවරේ ද? මහණෙනි, මෙසේ දකින උගත් ආර්ය ශ්‍රාවකයා අතීත රූපයෙහි අපෙක්ෂා රහිත වෙයි. අනාගත රූපය නො පතයි. වර්තමාන රූපයේ කලකිරීම පිණිස නො ඇලීම පිණිස නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි. අතීත අනාගත වේදනා... සංඥා අනිත්‍යයි වර්තමාන වේදනා... සංඥා ගැන කියනුම කවරේ ද? මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා අතීත වේදනා... සංඥාවෙහි අපෙක්ෂා රහිත වෙයි. අනාගත වේදනා... සංඥා නො පතයි. වර්තමාන වේදනා... සංඥාවෙහි කලකිරීම පිණිස, නො ඇලීම පිණිස නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි.

10. දුතිය අතීතානාගත සූත්‍රය

මහණෙනි, අතීත අනාගත රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ දුකයි. වර්තමාන රූප... විඤ්ඤාණ ගැන කියනුම කවරේ ද? මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා අතීත රූප... විඤ්ඤාණයෙහි අපෙක්ෂා රහිත වෙයි. අනාගත රූප... විඤ්ඤාණ නො පතයි. වර්තමාන

රූප... විඤ්ඤාණයෙහි කලකිරීම පිණිස නො ඇලීම පිණිස, නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි.

11. තතිය අතීතානාගත සූත්‍රය

මහණෙනි, අතීත අනාගත රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ අනාත්මයි. වර්තමාන රූප-විඤ්ඤාණ ගැන කියනුම කවරේ ද? මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා අතීත රූප.. විඤ්ඤාණ ගැන අපෙක්ෂා රහිත වෙයි. අනාගත රූප.. විඤ්ඤාණ නො පතයි. වර්තමාන රූප.. විඤ්ඤාණයෙහි කලකිරීම් පිණිස නො ඇල්ම පිණිස, නැති කිරීම පිණිස පිළිපන්නේ වෙයි.

2. අනිත්‍ය වර්ගය

1. අනිත්‍ය සූත්‍රය

මහණෙනි, රූපය අනිත්‍ය යි, වෙදනාව අනිත්‍යයි, සංඥාව අනිත්‍යයි, සංස්කාර අනිත්‍යයි, විඤ්ඤාණය අනිත්‍යයි. මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා රූපයෙහි කලකිරෙයි, වෙදනාවෙහි කලකිරෙයි, සංඥාවෙහි කලකිරෙයි, සංස්කාරයෙහි කලකිරෙයි, විඤ්ඤාණයෙහි කලකිරෙයි.කලකිරෙමින් නො ඇලෙයි. නො ඇලෙන්නේ මිදෙයි.

2. දුකඛ සූත්‍රය

මහණෙනි, රූපය දුකයි, වෙදනාව දුකයි, සංඥාව දුකයි, සංස්කාර දුකයි, විඤ්ඤාණය දුකයි. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරී නො ඇලෙයි නො ඇලී මිදෙයි. මිදුණු පසු.. රහත් බව සඳහා අනිකක් නැතැයි දනී

3. අනත්ත සූත්‍රය

මහණෙනි, රූපය අනාත්මයි. වෙදනා... සංඥා අනාත්මයි. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... සංඥාවෙහි, කලකිරෙයි. මිදුණු පසු... රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

4. යදනිච්ච සූත්‍රය

මහණෙනි, රූපය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් එය අනාත්මයි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. එය මගේ ආත්මය නො වෙයි. මෙසේ

මෙය යම්යක් ප්‍රඥාවෙන් ඇති සැටියෙන් දක්ක යුතු ය. වෙදනා... සංඥා අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් එය අනාත්ම යි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි මම නො වෙමි. එය මගේ ආත්මය නො වෙයි. මෙසේ මෙය සම්‍යක් ප්‍රඥාවෙන් ඇති සැටියෙක් දක්ක යුතු ය. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... සංඥාවෙහි කලකිරෙයි. කලකිරී නො ඇලෙයි. නො ඇලී මිදෙයි මිදුණේ... මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

5. යංදුක්ඛ සූත්‍රය

මහණෙනි, රූපය දුකයි. යමක් දුක් නම් එය අනාත්මයි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි. මෙසේ එය ඇති සැටියෙන් මනා තුවණින් දක්ක යුතු ය. වෙදනා... සංඥා දුකයි.... මනා තුවණින් දක්ක යුතු ය. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා.. මිදෙයි. රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

6. යදනත්ත සූත්‍රය

මහණෙනි, රූපය... සංඥාව අනාත්මයි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. එය මගේ ආත්මය නො වෙයි. මෙසේ එය ඇති සැටියෙන් දක්ක යුතුය. මහණෙනි, මෙසේ දන්නා ආර්ය ශ්‍රාවකයා.... මිදෙයි.... රහත් බව පිණිස අනිකක් නැතැයි දනී.

7. පඨම හෙතු සූත්‍රය.

මහණෙනි, රූපය... සංඥා අනිත්‍යයි. රූපය... සංඥාව ඉපදීමට යමක් හේතු වේ නම්, ප්‍රත්‍ය වේ නම් එයක් අනිත්‍යයි. මහණෙනි, අනිත්‍යයෙන් හට ගත් රූප... සංඥා කොහොම නම් නිත්‍ය වෙයි ද? මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා... මිදෙයි රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

8. දුතිය හෙතු සූත්‍රය

මහණෙනි, රූපය... සංඥාව දුකයි. රූප... සංඥා ඉපදීමට යමක් හේතු වේ ද, ප්‍රත්‍ය වේ ද එයත් දුකයි මහණෙනි, දුකෙන් හටගත් රූප... සංඥා කොහොම නම් සැප වේ ද? මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා.... මිදෙයි. රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

9. තතිය හෙතු සූත්‍රය

මහණෙනි, රූප... සංඥා අනාත්මයි. රූප... සංඥා ඉපදීමට යමක් හේතු වෙයි නම් ප්‍රත්‍යය වෙයි නම් එයත් අනාත්මයි. අනාත්මයෙන් හට ගත් රූප... සංඥා ආත්ම වන්නේ කොහොම ද? මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා.. මිදෙයි. රහත් බව පිණිස අනිකක් නැතැයි දනී.

10. ආනන්ද සූත්‍රය

ඉක්බිති අතඳ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පසෙක හිඳ "ස්වාමීනි, නිරොධය, නිරොධය යි කියයි. ස්වාමීනි, කුමන ධර්මයක නිරොධය, නිරොධය යි කියනු ලැබේ දැයි" මෙය සැලකළහ.

ආනන්ද, රූප... සංඥා අනිත්‍යයි. හෙතු ප්‍රත්‍යයෙන් කරන ලදි. හේතු ප්‍රත්‍යයෙන් උපන්නේ ය. නැසෙනසුලුයි. විනාශවන සුලුයි. නො ඇලීම ස්වභාව කොට ඇත්තේ ය. නැසීම ස්වභාව කොට ඇත්තේ ය. එය නැති කිරීම නිරොධයයි කියනු ලැබේ. ආනන්ද, මේ ධර්මවල නිරොධයෙන් නිරොධයයි කියනු ලැබේ.

3. භාර වර්ගය

1. භාර සූත්‍රය

මහණෙනි, බරත්, බර අදින්නාත්, බර ඉසිලීමත්, බර බහා තැබීමත් දෙශනා තරම්. එය අසව්, මනාව මෙනෙහි කරව් යි වදළහ.

මහණෙනි, බර නම් කුමක් ද? ඊට පංච උපාදන ස්කන්ධය යි කිව යුතු ය. කුමන පසක් ද? රූප උපාදන ස්කන්ධය, වෙදනා උපාදනස්කන්ධය, සඤ්ඤ උපාදනස්කන්ධය, සංඛාර උපාදනස්කන්ධය, විඤ්ඤණ උපාදනස්කන්ධය යි. මහණෙනි, මෙය බර නම්. මහණෙනි, බර අදින්නා කවරෙක් ද? ඔහුට පුද්ගලයා යි කිව යුතුය. මෙ නම් ඇති මෙ නම් ගොත්‍ර ඇති යම් මේ ආයුෂ්මතෙක් ඇද්ද, මහණෙනි, මොහු බර අදින්නායි කියනු ලැබේ. මහණෙනි, බර ඉසිලීම කුමක් ද? පුනර්භවය ඇති කරන නන්දිරාග සහිත ඒ ඒ රූපාදි අරමුණුවල ඇලෙන යම් ඒ තණ්හාවක් වේද එනම් කාම තණ්හා, භවතණ්හා, විභවතණ්හා යන මෙයයි. මහණෙනි, මෙය බර ඉසිලීමය යි කියනු ලැබේ.

මහණෙනි, බර බහා තැබීම කුමක් ද? එම තණ්හාවේ ම යම් ඉතිරියක් නැති, නැසීමක්, අත් හැරීමක්, මිදීමක්, නො ඇල්මක් වෙයි ද මෙය මහණෙනි, බර බහා තැබීමය යි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. මෙසේ වදරා සුගතයන් වහන්සේ නැවත.- මෙසේක් වදළහ.

බර නම් ඒකාන්තයෙන් පංචස්කන්ධය යි. බර අදින්නා පුද්ගලයා යි. බර ඇදීම දුක යි. ලොව බර බහා තැබීම සැපයි.

මහබර බහා තබා වෙනත් බරක් නො ගෙන තණ්හාව මුල් සහිතව උදුරා කෘෂ්ණා රහිත වූයේ පිරිනිවියේ නම් වෙයි.

2. පරිඤ්ඤ සූත්‍රය

මහණෙනි, පරිඤ්ඤෙය්‍යා[1] ධර්මත් පරිඤ්ඤ [2] ධර්මත් දෙශනා කරම්. එය අසව්. මැනවින් මෙනෙහි කරව්. දෙශනා කරම්. මහණෙනි, ඉක්ම විය යුතු ධර්ම මොනවා ද? මහණෙනි, රූපය ඉක්ම විය යුතු ධර්මයකි. වෙදනාව, සංඥාව, සංස්කාර, විඥානය ඉක්ම විය යුතු ධර්මයකි. මහණෙනි, ඉක්මවිය යතු ධර්ම මේවා ය.

මහණෙනි, ඉකමවීම කුමක් ද? මහණෙනි, යම් රාගය නැති කිරීමක්, දෙවිෂය නැති කිරීමක්, මොහය නැති කිරීමක් වෙයි ද මෙය ඉක්මීම යි.

3. අභිඥාන සූත්‍රය

මහණෙනි, රූපය ඤාතපරිඤ්ඤා [3] වශයෙන් නො දන්නේ, තීරණපරිඤ්ඤා [4] වශයෙන් නො දන්නේ, පහානපරිඤ්ඤ [5] වශයෙන් නොඉක්මවන්නේ අත් නො හරින්නේ දුක් නැසීම පිණිස නුසුදුස්සෙක් වෙයි. වෙදනා... සංඥ ඤත පරිඤ්ඤ වශයෙන් නො දන්නේ අත් නො හරින්නේ දුක් නැසීම පිණිස නුසුදුස්සෙක් වෙයි.

මහණෙනි, රූපය... සංඥ ඤතපරිඤ්ඤ වශයෙන් දන්නේ තීරණපරිඤ්ඤ වශයෙන් දන්නේ පහානපරිඤ්ඤ වශයෙන් ඉක්ම වන්නේ අත් හරින්නේ දුක් නැසීමට සුදුස්සෙක් වෙයි.

---

1. සඟමුලින් දත යුතු ධර්ම, එනම් ඉක්ම විය යුතු ධර්ම
2. සඟමුලින් දැනීම එනම් ඉක්මවීම.
3. බෙදවෙන් කොට දැනීම
4. අනිත්‍ය දුක් වශයෙන් තීරණය කොට දැනීම
5. මාර්ග ඥානයෙන් දුරුකිරීම දැනීම

4. ඡන්දරාග සූත්‍රය

මහණෙනි, රූපයෙහි යම් ඇලීමක් තිබේ ද එය දුරු කරව්. මෙසේ ඒ රූපය දුරු වූයේ, මුල්සුන් වූයේ කරටි කැපූ තල්ගසක් මෙන් වූයේ, නැති වූයේ මත්තෙහි උපදනා සුභාව නැත්තේ වෙයි. වේදනා... විඤ්ඤාණයෙහි යම් ඇලීමක් තිබේද එය දුරු කරව්. මෙසේ ඒ වේදනා... විඤ්ඤාණ දුරු වූයේ, මුල්සුන් වූයේ කරටි කැපූ තල්ගසක් මෙන් වූයේ නැති වූයේ මතු උපදනා සුභාව නැත්තේ වෙයි.

5. පඨම අස්සාද සූත්‍රය

මහණෙනි, බුදු වීමටත් පෙර බුදු නො වූ බෝසත් වූ ම මට රූපයේ ආස්වාදය කුමක් ද? ආදීනව මොනවා ද? නිස්සරණය කුමක් ද? වේදනාවේ... විඤ්ඤාණයේ ආස්වාදය කුමක් ද? ආදීනව මොනවාද? නිස්සරණය කුමක් දැයි මෙබඳු අදහසක් පහළ විය.

මහණෙනි, ඒ මට රූපය නිසා යම් සැපක් සතුටක් ඇති වේ නම් එය රූපයේ ආස්වාදය යි. යම් රූපයක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුභාවයක් ඇත්තේ නම් එය රූපයේ ආදීනවයි, රූපයෙහි යම් ඡන්දරාගය දුරු කිරීමක් පහ කිරීමක් ඇත් නම් එය රූපයේ නිස්සරණය යි. වේදනාවේ... විඤ්ඤාණයේ සැපක් සතුටක් ඇති වේ නම් එය වේදනාවේ.... විඤ්ඤාණයේ ආස්වාදයයි. යම් වේදනාවක්, විඤ්ඤාණයක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුභාව ඇත්තේ නම් එය වේදනාවේ... විඤ්ඤාණයේ ආදීනවයි. වේදනාවේ... විඤ්ඤාණයේ යම් ඡන්දරාගය දුරු කිරීමක් පහ කිරීමක් ඇත් නම් එය වේදනා... විඤ්ඤාණ නිස්සරණය යි. යන අදහස ඇති විය.

මහණෙනි, මම යම් තාක් මේ උපාදාන ස්කන්ධ පහේ ආස්වාදය ආස්වාද වශයෙනුත්, ආදීනව ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත් ඇති සැටියෙන් අවබොධ නො කළෙමි ද ඒ තාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්වප්‍රජාව

අතර මම අනුත්තර සම්මාසම්බොධිය අවබොධ කෙළෙමියි ප්‍රතිඥා නො කළෙමි. ඤාණදර්ශනය පහළ විය. මගේ වෙතොවිමුක්තිය සථිරය. මේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නොමැත.

6. දුතිය අසසාද සූත්‍රය

මහණෙනි, මම රූපයේ ආසවාදය සොයමින් හැසුරුණෙමි. රූපයේ යම් ආසවාදයක් වෙයිද එය අවබොධ කළෙමි. රූපයේ ආස්වාදය යම් තාක් ද ඒ තාක් මම ප්‍රඥාවෙන් මනාව දිටිමි. මහණෙනි මම රූපයේ ආදීනව පර්යේෂණය කරමින් හැසුරුණෙමි. රූපයේ යම් ආදීනවයක් ඇත් ද එය අවබොධ කළෙමි. රූපයේ ආදීනව යම් තාක් ද ඒ තාක් මම ප්‍රඥාවෙන් මනාව දිටිමි. මම මහණෙනි, රූපයේ නිස්සරණය පර්යේෂණය කරමින් හැසුරුණෙමි. මහණෙනි, මම රූපයේ යම් නිස්සරණයක් වෙයි ද එය අවබොධ කළෙමි. රූපයේ නිස්සරණය යම් තාක් ද ඒ තාක් මම ප්‍රඥාවෙන් මනාව දිටිමි.

මහණෙනි, මම වේදනා... විඤ්ඤාන ආස්වාදය පර්යේෂණය කරමින් හැසුරුණෙමි.... වේදනා... විඤ්ඤාන නිස්සරණය යම් තාක් ද ඒ තාක් මම ප්‍රඥාවෙන් මනාව දිටිමි.

මහණෙනි, මම යම් තාක් මේ උපාදාන ස්කන්ධ පහේ ආස්වාදය ආස්වාද වශයෙනුත්, ආදීනව ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත්, ඇති සැටියෙන් අවබොධ නො කළෙමිද ඒ තාක් මහණෙනි, මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි දෙවිමිනිසුන් සහිත මහණ බමුණන් සහිත සත්වප්‍රජාව අතර අනුත්තර සම්මා සම්බොධිය මනාව අවබෝධ කළෙමියි ප්‍රතිඥා නො කළෙමි.

මහණෙනි, මම යම්දක.. ඇති සැටියෙන් මනාව අවබොධ කළෙමි ද.. සත්වප්‍රජාව අතර අනුත්තර සම්මා සම්බොධිය අවබොධ කළෙමියි ප්‍රතිඥා කළෙමි. මාගේ වෙතොවිමුත්තිය සථිරය. මේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නැතැයි මට ඤාණදර්ශනය පහළ විය.

7. තතිය අසඝාද සූත්‍රය

මහණෙනි, රූපයෙහි ආස්වාදයක් නැති නම් සත්වයෝ රූපයෙහි නො ඇලෙති. යම් හෙයකින් රූපයේ ආස්වාදයක් තිබේ ද එහෙයින් සත්වයෝ රූපයෙහි ඇලෙති. මහණෙනි, රූපයේ ආදීනවයක් නැත් නම් සත්වයෝ රූපයෙහි නො කලකිරෙති. මහණෙනි. යම් හෙයකින් රූපයේ ආදීනවයක් ඇත් ද එ හෙයින් සත්වයෝ රූපයෙහි කලකිරෙති. මහණෙනි, රූපයේ නිස්සරණයක් නැත් නම් සත්වයෝ රූපයෙන් නො නික්මෙති. මහණෙනි, යම් හෙයකින් රූපයේ නිස්සරණයක් ඇද්ද එහෙයින් සත්වයෝ රූපයෙන් නික්මෙති. මහණෙනි, වෙදනාවෙහි... විඤ්ඤාණයෙහි ආස්වාදයක් නැත් නම් සත්වයෝ 'වෙදනා... විඤ්ඤාණයෙහි නො ඇලෙති යම් හෙයකින් වෙදනාවෙහි... විඤ්ඤාණයෙහි ආස්වාදයක් ඇද්ද එහෙයින්.. ඇලෙති. මහණෙනි, වෙදනාවෙහි... විඤ්ඤාණයෙහි ආදීනවයක් නැද්ද.... නො කලකිරෙති. යම්හෙයකින්.. ආදීනවයක් ඇද්ද, එහෙයින්... කලකිරෙති... නිස්සරණයක් නැත් නම්.. නො නික්මෙති. නිස්සරණයක් ඇත් නම්.. නික්මෙති.

මහණෙනි, සත්වයෝ යම් තාක් කල් මේ පංච උපාදන ස්කන්ධයේ ආස්වාදය ආස්වාද වශයෙනුත්, ආදීනව ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත් යථා තත්වය අවබොධ නො කළාහුද මහණෙනි, ඒතාක් මරුන් සහිත, බඹුන් සහිත දෙවියන් සහිත ලෝක වාසී සක්තු දෙවිමිනිසුන්, මහණබමුණන් සහිත ප්‍රජාව බැහැරව, වෙන්ව, මිදී, සීමා නො කර ගත් සිතින් යුතුව නො විසූහ.

මහණෙනි, සත්වයෝ යම් තාක් කල් මේ පංච උපාදන ස්කන්ධයේ ආස්වාදය ආස්වාද වශයෙනුත්,.. ඒ තාක් ප්‍රජාව බැහැරව වෙන්ව, මිදී, සීමා නො කොට ගත් සිතින් යුතුව වාසය කරති.

8. අභිනන්දන සූත්‍රය

මහණෙනි, යමෙක් රූපය සතුටින් පිළිගනී ද, ඔහු දුක සතුටින් පිළිගන්නේ වෙයි. යමෙක් දුක සතුටින් පිළිගනීද ඔහු දුකින් නො මිදුණේය යි කියමි. යමෙක් වෙදනා... විඤ්ඤාන සතුටින් පිළිගනී ද ඔහු දුක සතුටින් පිළිගනී. දුක සතුටින් පිළිගනී නම් දුකින් නො මිදුණේය යි කියමි.

මහණෙනි, යමෙක් රූපය... විඤ්ඤාන සතුටින් නො පිළිගනිද, ඔහු දුක නො පිළිගනී. යමෙක් දුක සතුටින් නො පිළිගනිද ඔහු දුකින් මිදුණේය යි කියමි.

9. උප්පාද සූත්‍රය

මහණෙනි, රූපයේ යම් ඉපදීමක්, පැවැත්මක්, හට ගැන්මක්, පහළ වීමක් වෙයි ද, එය දුකේ ඉපදීම යි. රෝගවල පැවැත්ම යි. ජරාමරණයේ පහළ වීමයි. වෙදනා... විඤ්ඤානයේ යම් ඉපදීමක් වෙයි ද එය රෝගවල පැවැත්මයි. ජරාමරණයේ පහළ වීමයි. වෙදනා... විඤ්ඤානයේ යම් ඉපදීමක් වෙයිද එය රෝගවල පැවැත්ම යි. ජරාමරණයේ පහළ වීම යි.

මහණෙනි රූපයේ... විඤ්ඤානයේ යම් නිරොධයක්, සන් සිඳීමක් නැති වීමක් වෙයිද එය දුකේ නිරුදධියයි. සංසිඳීමයි. නැති වීමයි.

10. අඝමූල සූත්‍රය

මහණෙනි, ඔබලාට දුකත් දුකට මුලත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, දුක කුමක් ද? මහණෙනි, රූපය දුකයි. වෙදනාව දුකයි. සංඥාව දුකයි. සංස්කාර දුකයි. විඤ්ඤාණය දුකයි. මේ දුකය යි කියනු ලැබේ.

මහණෙනි, දුකට මුල කුමක් ද? නැවත නැවත ඉපදීම ඇති කරන නන්දිරාගය සහිත ඒ ඒ භවයෙහි ඇලෙන යම් ඒ තණ්හාවක් වෙයිද, එනම් කාමතණ්හා, භවතණ්හා විභව තණ්හාවයි. මහණෙනි, මේ දුකට මූලයි.

11. පහඩිගු සූත්‍රය

මහණෙනි, මබලාට බිඳෙනසුලු දේත් නො බිඳෙනසුලු දේත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, කුමක් බිඳෙනසුලු ද? කුමක් නො බිඳෙනසුලු ද?.

මහණෙනි, රූපය, වෙදනා, සංඥාව, සංස්කාර, විඥානය බිඳෙනසුලුයි. ඒ රූපයේ.... සංඥාවේ යම් නිරොධයක්, සංයිදිමක්, නැති වීමක් වෙයි ද එය නො බිඳෙනසුලුයි.

4 නතුමහාක වර්ගය

1. පඨම නතුමහාක සූත්‍රය

මහණෙනි, යමක් මබලා ගේ නො වෙයි නම් එය දුරු කරව්. එය දුරු කිරීම මබලාට හිතසැප පිණිස පවතී. මහණෙනි, කුමක් මබලා ගේ නො වෙයි ද? මහණෙනි, රූපය... විඥානය මබලා ගේ නො වෙයි. එය දුරු කරව්. එය දුරුකිරීම මබලාට හිත සැප පිණිස පවතී.

මහණෙනි, යම් සේ මේ ජෙතවනාරාමයෙහි තණ, දැව අතු, කොළ යමක් තිබේද එවා ජනයා ගෙන යන්නේ හෝ, පුළුස්සන්නේ හෝ කැමැත්තක් කරන්නේ නම් එවිට මබලාට ජනයා අප ගෙන යන්නේ ය, පුළුස්සන්නේ ය, කැමැත්තක් කරන්නේ ය කියා සිතෙන්නේ ද?

"නැත ස්වාමීනි, ඒ කුමක් නිසා ද? ස්වාමීනි, ඒ තමා හෝ තමා සම්බන්ධ හෝ නො වෙයි. මහණෙනි, එමෙන් රූපය... විඥානය මබලා ගේ නො වෙයි. එය දුරුකරව්. එය දුරු කිරීම මබලාට හිත සැප පිණිස වෙයි.

2. දුතිය නතුමහාක සූත්‍රය

මහණෙනි, යමක් මබලා ගේ නො වෙයි නම් එය දුරු කරව්. එය දුරුලීම මබලා ගේ ම හිත සැප පිණිස පවතී.

මහණෙනි, කුමක් මබලා ගේ නො වෙයි ද? මහණෙනි, රූපය... විඥානය මබලා ගේ නො වෙයි. එය දුරු කරව්. එය දුරලීම මබලාට හිත සැප පිණිස වෙයි. මහණෙනි, යමක් මබලා ගේ නො වෙයි නම් එය දුරු කරව්. එය දුරුලීම මබලාට හිත සැප පිණිස පවතී.

3. පඨම භික්ෂු සූත්‍රය

එකල්හි එක්තරා භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ "ස්වාමිනි, මම භාග්‍යවතුන් වහන්සේගෙන් යම් බණක් අසා තනිව සමූහයෙන් වෙන්ව නො පමාව කෙලස් තවන වීර්ය ඇතිව නිවනට යොමු කළ සිතින් වසමිද එවැනි බණක් මට කෙටියෙන් දෙසතු මැනවැයි සැලකළේය.

භික්ෂු නම, යමක් අත් නො හැර පවතී නම් එයින් රාගියා, දුෂ්ටයා, මොඩයා යන නම් ලබයි. යමක් අත් නො හැර නො පවතී නම් එයින් ඒ නම් නො ලබයි. "ස්වාමිනි, දැන ගතිමි, සුගතයන් වහන්ස, දැන ගතිමි යි කීය. භික්ෂු නම, මා සැකෙවින් කී ධර්මයේ විස්තර ඔබ කෙසේ දන්නෙහි ද?

ස්වාමිනි, රූපය... විඤ්ඤානය අත් නො හැර පවතී නම් එයින් රාගියා,දුෂ්ටයා, මෝඩයා යන නම් ලබයි. ස්වාමීනි, යම් හෙයකින් රූපය... විඤ්ඤානය අත් නො හැර නො පවතී නම් එයින් ඒ නම් නො ලබයි. ස්වාමිනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටියෙන් වදළ මේ බණේ අර්ථය මම විස්තර වශයෙන් මේ අන්දමට දනිමි.

භික්ෂු නම, සාධු, සාධු, ම විසින් කෙටියෙන් වදළ බණේ අර්ථය විස්තර වශයෙන් ඔබ දන්නෙහිය. ඉතා හොඳයි. භික්ෂු නම, ඉදින් රූපය... විඤ්ඤානය අත් නො හැර පවතී නම් එයින් රාශියා යන නම් ලබයි. ඉදින් රූපය... විඤ්ඤානය අත් නො හැර නො පවතී නම් එයින් ඒ නම් නො ලබයි කියා මා කෙටියෙන් කී ධර්මයේ අර්ථය විස්තර වශයෙන් දත යුතුයි.

ඉක්බිති ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහනසේ ගේ දෙශනය සතුටින් පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගිට සකසා වැඳ පැදකුණු කොට ගියේ ය. අනතුරුව උන්වහන්සේ තනිව සමූහයෙන් වෙන්ව නො පමාව කෙලෙස් තවන වීර්යය ඇතිව නිවනට යොමු කළ සිතින් වසන සේක් යමක් සඳහා කුලපුත්‍රයෝ මනාව ගිහිගෙන් නික්ම සසුන් ගත වෙත් ද ඒ උතුම් බඹසර අවසන උතුම් රහත් බව ඉහාත්මයෙහි ම දැන ප්‍රත්‍යක්ෂ කොට එළඹ වීසූහ. ජාතිය ක්ෂය විය.. උන්වහන්සේ එක් රහත් නමක් වූහ.

4. දුතිය භික්ෂු සූත්‍රය

ඉක්බිති එක්තරා භික්ෂු නමක් භාග්‍යවතුන් වහනසේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමිනි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා මට තනිව සමූහයෙන් වෙන්ව නො පමාව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව විසිය හැකි යම් ධර්මයක් දෙශනා කරනු මැනවැයි සැලකළේ ය.

භික්ෂු නම , යමක් අත් නො හැර පවතී ද එය ඒ සමග මැරෙයි. යමක් නැසේ ද ඒ හේතුවෙන් රාගියා, දුෂ්ටයා, මෝඩයා යන නම් ලබයි, යමක් අත් නො හැර නො පවතීද, එය ඒ සමග නො මැරෙයි. යමක් මැරෙයිද ඒ හේතුවෙන් නම් නො ලබයි.

ස්වාමීනි, මම තේරුම් ගතිමි. සුගතයන් වහන්ස, මම තේරුම් ගතිමි. භික්ෂු නම, ම විසින් සැකෙවින් ප්‍රකාශ කළ ධර්මයේ අර්ථය විස්තර වශයෙන් ඔබ කෙසේ තේරුම් ගත්තෙහි ද?

ස්වාමීනි. ඉදින් රූප අත නො හැර පවතී ද, එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරේ නම් එයින් නම් ලබයි. වෙදනා... විඤ්ඤාන අත නො හැර පවතී ද, එය ඒ සමග මැරෙයි. යමක් ඒ සමග මැරේ නම් එයින් නම් ලබයි, ස්වාමීනි, ඉදින් රූප.. විඤ්ඤාන අත නො හැර නො පවතීද එය ඒ සමග නො මැරෙයි. කියා භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටියෙන් වදළ ධර්මයේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දැන ගතිමි.

භික්ෂු නම, සාධු. සාධු යමක් රූප... විඤ්ඤාන අත නො හැර නො පවතීද එය ඒ සමග නො මැරෙයි.. කියා මවිසින් කෙටියෙන් ප්‍රකාශ කළ ධර්මයේ අර්ථය විස්තර වශයෙන් මෙසේ දත යුතුයි.

ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ දෙශනාව සතුටින් පිළිගෙන.. එක්තරා රහත් නමක් වූහ.

5. පඨම ආනන්ද සූත්‍රය

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ වැඳ පසෙක හුන්හ. පසෙක හුන් අනඳ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ.

"හොඳයි, ආනන්ද මබෙන් "ආයුෂ්මත් ආනන්ද කවර දෙයක උපත පෙනේ ද? විනාශය පෙනේ ද? පවත්නා දෙයෙහි ජරාව පෙනේදයි මෙසේ ඇසුවොත් කුමක් ප්‍රකාශ කරන්නෙ හි ද?"

ස්වාමීනි, ඉදින් මගෙන් ආයුෂ්මත් ආනන්ද, කවර දෙයක උපත පෙනේද.. ජරාව පෙනේදයි ඇසුවොත් " ඇවැත්නි, රූපයේ... විඤ්ඤාණයේ උපත පෙනෙයි. විනාශය පෙනෙයි. ජරාව පෙනෙයි." කියා මම මෙසේ ප්‍රකාශ කරමි.

සාධු, සාධු, ආනන්ද, මබගෙන් ඇසුවොත් රූපයේ... විඤ්ඤාණයේ උපත පෙනෙයි. විනාශය පෙනෙයි. ජරාව පෙනෙයි කියා මෙසේ ප්‍රකාශ කරන්නෙහි ය.

6. දුතිය ආනන්ද සූත්‍රය

හොඳයි, ආනන්ද, ඔබගෙන් ආයුෂ්මත් ආනන්ද, කවර ධර්මයක උපත පෙනුණේ ද, විනාශය පෙනුණේ ද, ජරාව පෙනුණේ ද කවර ධර්මයක උපත පෙනෙන්නේ ද, විනාශය පෙනෙන්නේ ද, ජරාව පෙනෙන්නේ ද, කවර ධර්මයක උපත පෙනෙයිද, විනාශය පෙනෙයිද, ජරාව පෙනෙයිදයි ඇසුවොත් කෙසේ පිළිතුරු දෙන්නෙහි ද?. ස්වාමිනි, ඇවැත්නි, කවර ධර්මයක උපත පෙනුණේද... පෙනෙයිදයි මගෙන් මෙසේ ඇසුවොත් "ඇවැත්නි, යම් රූපයක්.... විඤ්ඤානයක් ඉකුත් වීද, නැකිවීද, වෙනස් වීද ඒ රූපයේ.... විඤ්ඤානයේ උපත පෙනුණේය. විනාශය පෙනුණේය. ඇවැත්නි, යම් රූපයක්... විඤ්ඤානයක් නූපන්නේද, පහළ නො වූයේ ද එම රූපයේ... විඤ්ඤානයේ උපත පෙනෙයි. විනාශය පෙනෙයි. ජරාව පෙනෙයි කියා පිළිතුරු දෙමියි සැලකළහ.

සාධු. සාධු. ආනන්ද, යම් රූපයක්.. විඤ්ඤානයක් ඉකුත් වීද නැති වීද වෙනස් වීද, ඒ රූපයේ... විඤ්ඤානයේ උපත පෙනුණේ ය. යම් රූපයක්... විඤ්ඤානයක් නූපන්නේද ඒ රූපයේ... විඤ්ඤානයේ උපත පෙනෙන්නේය... යම් රූපයක්... විඤ්ඤානයක් උපන්නේ ද ඒ රූපයේ... විඤ්ඤානයේ උපත පෙනෙයි... මෙසේ ඔබ ප්‍රකාශ කරන්නෙහිය.

7. පඨම අනුධම්ම සූත්‍රය

මහණෙනි, ධර්මානුධර්ම ප්‍රතිපදාවට පිළිපන් භික්ෂුවට මෙය අනුකූල ධර්මයයි. රූපයෙහි යම් කලකිරීම් බහුලව විසීමක් කරයි ද, වේදනාවෙහි යම් කලකිරීම් බහුලව විසීමක් කරයි ද සංඥාවෙහි යම් කලකිරීම් බහුලව විසීමක් කරයිද, සංස්කාරයෙහි යම් කලකිරීම් බහුලව විසීමක් කරයිද, සංඥාවේ යම් කලකිරීම් බහුලව විසීමක් කරයිද මෙය අනුකූල ධර්මය යි.

හෙතෙම රූපයෙහි... සංඥාවෙහි කලකිරීම් බහුලව වසන්නේ රූපය... විඤ්ඤාන පිරිසිඳ දනී. ඔහු රූප... විඤ්ඤාන- දනීමෙන් ජරා මරණ සොක පරිදෙව-දුක්ඛ-දෙමනස්සවලින් මිදෙයි. දුකින් මිදෙයි කියමි.

8. දුතිය අනුධම්ම සූත්‍රය

මහණෙනි, ධර්මානුධර්ම ප්‍රතිදාවට පිළිපන් භික්ෂුවට අනුකූල ධර්මය මෙය යි. රූපයෙහි... විඤ්ඤානයෙහි යම් අනිත්‍ය දැකීමක් ඇතිව වාසය කරයිද, අනිත්‍යය දකිමින් වාසය කරන ඔහු රූපය... විඤ්ඤාන පිරිසිඳ දනී. පිරිසිඳ දන්නා ඔහු රූපයෙන්... විඤ්ඤානයෙන් මිදෙයි. ජාතිජරාමරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසවලින් මිදෙයි. දුකින් මිදේයයි කියමි.

9. තතිය අනුධම්ම සූත්‍රය

මහණෙනි, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන භික්ෂු තමට මෙය අනුකූල ධර්මය යි. රූපයෙහි... විඤ්ඤානයෙහි දුක දකිමින් වසන්නේ රූපය... විඤ්ඤානය පිරිසිඳ දනී. පිරිසිඳ දන්නා ඔහු රූපයෙන්... විඤ්ඤානයෙන් මිදෙයි. ජාතිජරාමරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසවලින් මිදෙයි. දුකින් මිදේයයි කියමි.

11. චතුත්ථ අනුධම්ම සූත්‍රය

මහණෙනි, ධර්මානුධර්ම පතිපදාවෙහි යෙදෙන භික්ෂු තමට මෙය අනුකූල ධර්මයි. රූපයෙහි... විඤ්ඤානයෙහි අනාත්මය දකිමින් වසන්නේ රූපය... විඤ්ඤානය පිරිසිඳ දනී. පිරිසිඳ දන්නා ඔහු රූපයෙන්... විඤ්ඤානයෙන් මිදෙයි... දුකින් මිදේ යයි කියමි.

5 අතතදීප වර්ගය

1. අතතදීප සූත්‍රය

මහණෙනි, තමා පිහිට කොට ගෙන තමා පහන කොට ගෙන සරණ කොට ගෙන වාසය කරව්. අනුන් පිහිට කොට ගෙන වාසය නො කරව්. දහම පහන කොට ගෙන දහම පිහිට කොට ගෙන දහම සරණ කොට ගෙන වාසය කරව්. අනුන් පිහිට කොට වාසය නො කරව්. මහණෙනි, තමා පහන කොට තමා පිහිට කොට තමා සරණ කොට අනුන් පිහිට නො කොට, දහම පහන කොට දහම පිහිට කොට දහම සරණ කොට අනුන් සරණ නො කොට වසන මබලා විසින් සොක-පරිදෙව-දුකඛ-දෙමනස්ස-උපායාස කුමක් ජාති කොට ඇත් ද? කුමක් ප්‍රභව කොට ඇත්දයි කාරණය ම විමසිය යුතුය.

මහණෙනි, සොක... උපායාස කුමක් ජාති කොට ඇද් ද? කුමක් ප්‍රභව කොට ඇද් ද? මහණෙනි, මෙහි ආර්යයන් නො දන්නා ආර්ය ධර්මයෙහි අදක්ෂ, ආර්ය ධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු නුගත් පෘථග්ජනයා රූපය ආත්මය වශයෙන් දකී. ආත්මය රූපවන්යයි හෝ දකී. ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකී. ඔහු ගේ ඒ රූපය වෙනස් වෙයි. අන් ආකාරයට පත් වෙයි. රූපයේ වෙනස් වීම අන් ආකාරයට පත්වීම නිසා ඔහුට සොක... උපායාස ඇති වෙයි.

වෙදනා... සංඥාව ආත්මය වශයෙන් දකී ආත්මය වෙදනා-සංඥාවයයි දකී. ආත්මයෙහි වෙදනා-සංඥා ඇතැයි හෝ දකී.

වෙදනා-සංඥාවෙහි ආත්මය ඇතැයි හෝ දකී. ඔහු ගේ ඒ වෙදනා සංඥා වෙනස් වෙයි. අන් ආකාරයට පත් වෙයි. වෙදනා-සංඥාවල වෙනස් වීම අන් ආකාරයට පත් වීම නිසා ඔහුට සොක... උපායාස ඇති වෙයි.

මහණෙනි, රූපයේ... විඥානයේ අනිත්‍ය බව වෙනස් වන බව, නො ඇලිය යුතු බව නැති කළ යුතු බව දන, රූප... විඥාන පෙරත්, දැනුත්, හැම රූපයම... විඥානයම අනිත්‍යයි, දුකයි, වෙනස් වන සුලුය යි මෙසේ මෙය මනා නුවණින් බලන්නාට යම් සොක-උපායාසයක් ඇත් නම් එය දුරු වෙයි. ඒවා දුරු කිරීමෙන් තැති නො ගනී. තැති නො ගෙන සුවසේ සිටී. සුවසේ වසන භික්ෂුව තදඩගනිබ්බුනය යි කියනු ලැබේ.

2. පටිපද සූත්‍රය

මහණෙනි, සක්කාය සමුදය ගාමිනී පටිපදවත්,[1] සක්කාය නිරොධගාමිනි පටිපදවත් [2] දෙශනා කරමි. එය අසව්. මහණෙනි, සක්කාය සමුදයගාමිනි පටිපදව කුමක් ද? මහණෙනි, මෙහි ආර්යයන් නො දක්නා ආර්ය ධර්මයෙහි අදක්ෂ ආර්ය ධර්මයෙහි නො හික්මුණු, සත්පුරුෂයන් නො දක්නා, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු නුගත් පෘථග්ජනයා රූපය... විඥානය ආත්ම වශයෙන් දකී. ආත්මයෙහි රූප... විඥාන දකී. රූප... විඥානයෙහි ආත්මය දකී. රූප-විඥානයෙහි ආත්මය දකී. මහණෙනි, මේ සක්කාය සමුදය ගාමිනී පටිපදයයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මෙය දුකඛසමුදයගාමිනී සමනුපස්සනාය යි කියනු ලැබේ. මෙය ම මෙහි අර්ථයයි.

---

1. පංචස්කන්ධය පිළිබඳ මමයයි ගැනීම දුකයි. එය හටගන්නා පටිපදවයි. එනම් දුකඛ සමුදය ගාමිනී සමනුපස්සනාවයි. දිටියී වශයෙන් ගැනීමයි.
2. දුකඛනිරොධගාමිනී සමනුපස්සනාවයි.

මහණෙනි, සක්කාය නිරොධගාමිනී පටිපදව කුමක් ද? මහණෙනි, මෙහි ආර්යයන් දකින, ආර්ය ධර්මයෙහි දක්ෂ, ආර්ය ධර්මයෙහි හික්මුණු, සත්පුරුෂයන් දකින, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු උගත් ආර්ය ශ්‍රාවකයා රූපය... විඤ්ඤානය ආත්ම වශයෙන් නො දකී. ආත්මය රූපවත්... විඤ්ඤානවත්යයි නො දකී. රූප.. විඤ්ඤානයෙහි ආත්මය නො දකී. ආත්මයෙහි රූප විඤ්ඤාන නො දකී. මහණෙනි, මේ සක්කාය නිරොධ ගාමිනී පටිපදවය යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මෙය දුක්ඛනිරොධගාමිනී සමනුපස්සානය යි කියනු ලැබේ. මෙය ම මෙහි අර්ථය යි.

3. පඨම අනිච්චතා සූත්‍රය

මහණෙනි, රූපය... විඤ්ඤානය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් එය අනාත්මයි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි. මෙසේ මෙය ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකිය යුතුයි... දකින්නහු ගේ සිත නො ඇලෙයි. දඩිව නො ගැනීමෙන් ආශ්‍රවවලින් මිදෙයි.

මහණෙනි, ඉදින් භික්ෂුව ගේ සිත රූප ධාතුවෙහි... විඤ්ඤාන ධාතුවෙහි නො ඇලුණේ නම් ආශ්‍රවවලින් මිදුණේ වෙයි. මිදුණු හෙයින් සථිරයි. සථිර බැවින් සතුටු වෙයි. සතුටු නිසා බිය නො වෙයි. බිය නො වන්නේ තමා කෙරෙහි ම පිරිනිවෙයි. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිම විය. කළ යුතු දේ කරන ලදි. රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

4. දුතිය අනිච්චතා සූත්‍රය

මහණෙනි, රූපය... විඤ්ඤානය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් එය අනාත්මයි. යමක් අනාත්ම නම් එය මා ගේ නො වෙයි. ඒ මම නො වෙමි. එය මගේ ආත්මය නො වෙයි. මෙසේ යථාභූතය මනා නුවණින් දත යුතු යි.

මෙසේ ඒ යථාභූතය මනා නුවණින් දක්නහුට අතීත භව පිළිබඳ දෘෂ්ටි [1] ඇති නො වෙයි. අනාගත භව පිළිබඳ දෘෂ්ටි [2] ඇති නො වෙයි. අතීත භව පිළිබඳ දෘෂ්ටි නැති හෙයින් අනාගත භව පිළිබඳ දෘෂ්ටි ඇති නො වෙයි. අනාගත භව පිළිබඳ දෘෂ්ටි නොමැති නිසා දෘෂ්ටියෙන් දඩිව ගැනීමක් නො වෙයි. දෘෂ්ටියෙන් දඩිව ගැනීමක් නැති නිසා රූපයෙහි... විඤ්ඤානයෙහි සිත නො ඇලෙයි. දඩිව නො ගැනීමෙන් ආස්‍රවවලින් මිදෙයි. මිදුණු නිසා සථිරය. සථිර නිසා සතුටු වෙයි. සතුටු නිසා බිය නො වෙයි. බිය නො වන්නේ තමා කෙරෙහි ම පිරිනිවෙයි, ජාතිය ක්ෂය විය... රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

5. සමනුපස්සනා සූත්‍රය

මහණෙනි, කිසි යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දෘෂ්ටි වශයෙන් දක්නාහු නා නා ප්‍රකාර ආත්ම දකිති. ඒ හැම දෙනාම පංච උපාදාන ස්කන්ධ හෝ එයින් එකක් හෝ දකිති. කුමන පහක් ද.?

මහණෙනි. මෙහි ආර්යයන් නො දක්නා ආර්ය ධර්මයෙහි අදක්ෂ ආර්ය ධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු නුගත් පෘථග් ජනයා රූපය... විඤ්ඤානය ආත්මය වශයෙන් දකී. ආත්මය රූපවත් කොට දකී.... විඤ්ඤානයෙහි ලා ආත්මය දකී.

මෙසේ මේ දෘෂ්ටි වශයෙන් දැකීම ඇත් නම් ඔහුට මම වෙමි යන්න පහ නො වෙයි. මහණෙනි, මම වෙමි යන්න පහ නො වීමෙන් ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රිය පහළ වෙයි. මහණෙනි, මනස තිබේ, අරමුණු කිබේ. අවිද්‍යාව තිබේ. අවිද්‍යාව හා බැඳුණු ස්පර්ශයෙන් උපන් වෙදනාව යුත් නුගත් පෘථග්ජනයාට

1. පුබ්බන්තානුගත දෘෂ්ටි 18 කි.
2. අපරන්තානුගත දෘෂ්ටි 44 කි

මම වෙමි යන හැඟීම ඇති වෙයි. මහුට මේ මම වේමියි හැඟීම් ඇති වෙයි. අනාගතයෙහි වෙමි යි... නො වෙමියි හැඟීම ඇති වෙයි. අනාගතයෙහි රූපවත් වෙමි යි ද අනාගතයෙහි රූපවත් නො වෙමියි ද, සංඥාව ඇත්තෙක් වෙමි යි ද සංඥාව ඇත්තෙක් නො වෙමි යි ද නෙවසංඥිනාසංඥි වෙමියි ද මහුට හැඟීම ඇති වෙයි.

මහණෙනි, එහිම පංචෙන්ද්‍රිය පවතී. ඒ බැවින් එම ඉන්ද්‍රියවල අවිද්‍යාව උගත් ආර්ය ශ්‍රාවකයාට දුරු වෙයි. විද්‍යාව උපදී. අවිද්‍යාව නැති වීමෙන් විද්‍යාව ඉපදීමෙන් මහුට මම වෙමි යි හැඟීම නො වෙයි. මේ මම වෙමි යි ද නො වෙයි. මම අනාගතයයෙහි වෙමියි කියා ද මම අනාගතයෙහි නො වෙමියි ද, රූප යෙමියි ද, රූපි නො වෙමියි ද සංඥී වෙමියි ද සංඥි නො වෙමියිද, නෙවසංඥිනාසංඥි වෙමියි ද හැඟීම් නො වෙයි.

6. ඛන්ධ සූත්‍රය

මහණෙනි, ස්කන්ධ පහත් උපාදන ස්කන්ධ පහත් දෙශනා කරමි. එය අසව්. ස්කන්ධ පහ කුමක් ද? මහණෙනි, අතීත, අනාගත, වර්තමාන, අධ්‍යාත්මික හෝ බාහිර හෝ රළු හෝ සියුම් හෝ, හීන හෝ ප්‍රණීත හෝ ළඟ හෝ දුර හෝ යම් රූපයක් තිබේ නම් මේ රූප ස්කන්ධය යි කියනු ලැබේ.... යම් වේදනා... විඥානයක් තිබේ නම් මේ වේදනා.. විඥාන ස්කන්ධය යි. මහණෙනි මේ ස්කන්ධ පහයි.

මහණෙනි, උපාදන ස්කන්ධ පහ කුමක් ද? මහණෙනි, ආස්‍රව සහිත උපාදනවලට අරමුණු වූ අතීත අනාගත වර්තමාන.. ළඟ වූ හෝ දුර වූ හෝ යම් රූපයක්... විඥානයක් ඇත් නම් මේ රූප උපාදන ස්කධය... විඥාන උපදන ස්කන්ධය යි කියනු ලැබේ. මහණෙනි, මේ උපාදනස්කන්ධ පහයි.

7. පඨම සොණ සුත්‍රය

එකල සොණ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක වාඩි විය. පසෙක හුන් සොණ ගෘහපති පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ.

සොණ, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අනිත්‍ය වූ, දුක් වූ, වෙනස් වන සුභාව ඇති රූපයෙන් මම උතුම් වෙමි යි දකිත් නම් හෝ සමාන වෙමි යි දකිත් නම් හෝ මම හීන වෙමි යි දකිත් නම් හෝ එය ඇති තතු නො දැක්ම මිස වෙන කුමක් ද? අනිත්‍ය වූ දුක් වූ වෙනස් වන සුභාව ඇති වේදනාවෙන්... විඥානයෙන් මම උතුම් වෙමියි... දකිත් නම් ඇති තතු නො දන්ම මිස වෙන කුමක් ද?

සොණ, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අනිත්‍ය වූ දුක් වූ වෙනස් වන සුභාව ඇති රූපයෙන්... විඥානයෙන් මම උතුම් වෙමි යි හෝ, සමාන වෙමි යි හෝ හීන වෙමියි හෝ නො දකිත් නම් එය ඇති තතු දන්ම මිස වෙන කුමක් ද?

සොණ, කුමක් සිතන්නෙහි ද? රූපය නිත්‍ය ද? අනිත්‍ය ද?
සුභාමිනි, අනිත්‍යයි.
යමක් අනිත්‍ය නම් එය දුක් ද? සැප ද?
සුභමිනි, දුකයි.
යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුලු නම් එය මා ගේ ය, ඒ මම වෙමි ඒ මා ගේ ආත්මයයි දැකීම සුදුසු ද?
සුභාමිනි, එය සුදුසු නො වෙයි.
වෙදනා... විඥානය නිත්‍ය ද? අනිත්‍ය ද?... යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුලු නම් එය මා ගේ ය.. දැකීම සුදුසු ද? සුභාමිනි, එය සුදුසු නො වෙයි.

එහෙම නිසා සොණ, අතීත වූත්, අනාගත වූත්, වර්තමාන වූත්, අධ්‍යාත්මික, බාහිර, රළු වූ, සියුම් වූ, හීන වූ, ප්‍රණීත වූ, දුර වූ, ළඟ වූ, යම් රූපයක්... විඥානයක් ඇත් ද ඒ සියලුම රූප...

විඤ්ඤාන මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි කියා මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දත යුතු ය.

8. දුතිය සොණ සූත්‍රය

පසෙක හුන් සොණ ගෘහපති පුත්‍රයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සොණ, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ රූපය.... විඤ්ඤානය නො දනිත් ද, රූපයේ... විඤ්ඤානයේ ඇති වීම නො දනිත් ද, රූපයේ... විඤ්ඤානයේ නැති වීම නො දනිත් ද, රූප... විඤ්ඤාන නිරොධයට ගමන් මහ නො දනිත් ද, සොණ, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ශ්‍රමණයන් අතර ශ්‍රමණ සම්මත නො වෙති. බ්‍රාහ්මණයන් අතර බ්‍රාහ්මණ සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්වරු ශ්‍රමණ බවේ අර්ථය, බ්‍රාහ්මණ බවේ අර්ථය ඉහාත්මයෙහි ම තෙමේ ම දැන අවබොධ කොට ඊට පැමිණ නො වසත්නෝ ත් වෙති.

සොණ, යම් කිසි මහණ බමුණු කෙනෙක් රූපය... විඤ්ඤානය දනිත් නම්,.. රූප... විඤ්ඤාන නිරොධගාමිනි පටිපදාව දනිත් නම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ... දැන අවබොධ කොට ඊට පැමිණ වසන්නෝත් වෙති.

9. පඨම නන්දික්ඛය සූත්‍රය

මහණෙනි, භික්ෂුව අනිත්‍ය වූ ම රූපය අනිත්‍යය යි දකියි. එය ඔහු ගේ සම්‍යග්දෘෂ්ටිය යි. මනාව දක්නේ කලකිරෙයි තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. නන්දිරාගය[1] නැසීමෙන් සිත මිදීමෙන් මනාව මිදුණේය යි කියනු ලැබේ.

මහණෙනි, භික්ෂුව අනිත්‍ය වූ වේදනා... විඤ්ඤානය අනිත්‍යය යි දකියි. එය ඔහු ගේ සම්‍යග්දෘෂ්ටිය යි. මනාව දක්නේ කලකිරෙයි... නන්දිරාගය නැසීමෙන් සිත මිදෙයි. මිදුණු හෙයින් මනාව මිදුණේය යි කියනු ලැබේ.

1. නන්දි, රාග දෙකින්ම කණ්හාව ගැනෙයි

10. දුතිය නන්දික්ඛය සූත්‍රය

මහණෙනි, රූපය... විඤ්ඤානය නුවණින් මෙනෙහි කරවි. රූප... විඤ්ඤාන අනිත්‍යතාව ඇති සැටියෙන් බලවි. මහණෙනි, භික්ෂුව රූප... විඤ්ඤාන නුවණින් මෙනෙහි කරන්නේ රූප... විඤ්ඤාන අනිත්‍යතාව ඇති සැටියෙන් බලන්නේ රූපයෙහි... විඤ්ඤානයෙහි කලකිරෙයි. නන්දි නම් වූ තණ්හාව නැසීමෙන් රාගය නැසෙයි. රාගය නැසීමෙන් තණ්හාව නැසෙයි. නන්දිරාග නැසීමෙන් සිත මිදුණේ මනාව මිදුණේය යි කියනු ලැබේ.

මජ්ඣිම පණ්ණාසකය

1. උපය වර්ගය

1. උපය සූත්‍රය

මහණෙනි, උපය[1] සහිත නම් යසරින් නො මිදුණේ වෙයි. උපය රහිත වූයේ යසරින් මිදුණේ වෙයි. මහණෙනි, රූපයට පැමිණි කර්ම විඤ්ඤාණය රූපය අරමුණු කොට රූපය පිහිට කොට පවතී තණ්හාවෙන් තෙත්ව වැඩීමට දියුණුවට මහත් බවට පත් වෙයි වේදනාවට සංස්කාරයට පැමිණි විඤ්ඤාණය වේදනා... සංස්කාර... පිහිට කොට පවතී. තණ්හාවෙන් තෙත්ව වැඩීමට... එක් වෙයි.

මහණෙනි, යමෙක් මෙසේ කියයි නම් මේ රූපය හැර, වේදනා හැර, සංඥාව හැර, සංස්කාර හැර විඤ්ඤාණයේ ඊම යාම හෝ මැරීම, ඉපදීම හෝ වැඩීම දියුණුව මහත් බව හෝ පනවමි. මෙය සිදු නො වේ.

මහණෙනි, ඉදින් රූප ධාතුවෙහි... විඤ්ඤාණ ධාතුවෙහි භික්ෂුව ගේ රාගය දුරු වූයේ නම් රාගය දුරු වීමෙන් අරමුණ යිදින ලද බැවින් කර්ම විඤ්ඤාණයට පිහිට නො වෙයි. පිහිට නො ලත් විඤ්ඤාණය වැඩීමට නො පැමිණ ප්‍රතිසන්ධිය ගෙන නො දී මිදෙයි. මිදුණ නිසා නවතී. නැවතුන හෙයින් සතුටු වෙයි. සතුටු වූ නිසා තැති නො ගනී. තැති නො ගෙන තමා කෙරහි ම පිරිනිවෙයි. ජාතිය ක්ෂය විය.... රහත් බව සඳහා අනිකක් නැකැයි දනී.

---

1. තණ්හා -මාන -දිට්ඨි වශයෙන් පංච ස්කන්ධයට පැමිණීම

2. බීජ සූත්‍රය

මහණෙනි, බීජ වර්ග පහකි. පහ කුමක් ද? මුලින් පැල වෙන බීජ, කඳින් පැල වෙන බීජ, පුරුකෙන් පැල වෙන බීජ, අගින් පැල වෙන බීජ, බීජයෙන් පැල වෙන බීජ, යනුයි. මහණෙනි, මේ නො කැඩුණු, කුණු නොවූ, අවූ සුළංවළින් හානි නොවූ, බොල් නො වූ, මනාව තැන්පත් කොට තැබූ මේ බීජ පහ පොළවත් නැත් නම් වතුරත් නැත් නම් වැඩීමට දියුණුවට මහත් බවට පත්වෙයි ද? ස්වාමීනි, එහෙම වන්නේ නැහැ.

මහණෙනි, කැඩුණු කුණුවූ අවූ සුළංවළින් හානි වූ බොල් වූ මනාව තැන්පත් කොට නො තැබූ මේ බීජ පහ පොළව තිබුණත් ජලය තිබුණත් වැඩීමට දියුණුවට මහත් බවට පත් වෙයි ද? ස්වාමීනි, එහෙම වන්නේ නැහැ.

මහණෙනි, නො කැඩුණු කුණු නො වූ, අවූ සුළඟින් හානි නො වූ, බොල් නැති, මනාව තැන්පත් කොට තිබූ මේ බීජ පහ පොළවත් තිබේ නම් ජලයත් තිබේ නම් වැඩීමට දියුණුවට මහත් බවට පත්වේ ද? එසේ ය ස්වාමීනි,

මහණෙනි, පොළව යම් සේද එමෙන් කර්ම විඤ්ඤාණයට අරමුණු වන ස්කන්ධ හතර දත යුතු ය. මහණෙනි, ජලය යම් සේ ද එමෙන් නන්දිරාගය දත යුතු ය. මහණෙනි, බීජ පහ යම් සේ ද එමෙන් ප්‍රත්‍ය සහිත කර්ම විඤ්ඤාණය දත යුතු ය.

මහණෙනි, රූපය... සංස්කාරය වෙත පැමිණි කර්ම විඤ්ඤාණය රූපය අරමුණු කොට රූපය... සංස්කාරය පිහිට කොට ඇති තෘෂ්ණාවෙන් තෙත් වූ කර්ම විඤ්ඤාණය වැඩීමට දියුණුවට මහත් බවට පත් වෙයි.

මහණෙනි, යමෙක් "මම රූපය හැර... සංස්කාර හැර කර්ම විඤ්ඤාණයේ ඊම යාම හෝ මැරීම ඉපිදීම හෝ වැඩීම, දියුණුව, මහත් බව පනවමි" යි කියත් නම් මේ කරුණ සිදු නො වන්නකි.

මහණෙනි, භික්ෂුව ගේ රූපය... සංස්කාරය පිළිබඳ රාගය දුරු වීමෙන් අරමුණු සිඳෙයි. කර්ම විඥානයේ පිහිටීමත් නො වෙයි. නො පිහිටි ඒ විඥානයේ නො වැඩි ප්‍රතිසන්ධිය නොදී මිදෙයි. මිදුණු නියා සථිත වෙයි. එහෙයින් සතුටු වෙයි... රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

3. උදන සූත්‍රය

එවිට භාග්‍යවතුන් වහන්සේ මේ උදන වාක්‍යය ප්‍රකාශ කළ සේක. "ඉදින් මම නො වූ යෙම් නම් අතීත කර්ම රැස් කිරීමකුත් නො වූයේ නම් වර්තමාන ස්කන්ධ පහළ නො වෙයි. අනාගත ස්කන්ධ උපදවන කර්ම රැස් කිරීමක් නො වෙයි. එහෙයින් මට අනාගත ප්‍රතිසන්ධියක් නො වෙයි. මෙසේ මිදෙන භික්ෂුව ඕරම්භාගිය සංයෝජන සිඳින්නේ ය."

මෙසේ ප්‍රකාශ කළ පසු එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ඉදින් මම නුවූයෙමි නම් අතීත කර්ම රැස් කිරීමකුත් නො වී නම් වර්තමාන ස්කන්ධ පහළ නො වෙයි. අනාගත ස්කන්ධ උපදවන කර්ම රැස් කිරීමකුත් නො වෙයි. එවිට මට මතු ප්‍රතිසන්ධියක් නො වෙයි. මෙසේ මිදෙන භික්ෂුව ඕරම්භාගිය සංයෝජන කෙසේ නම් සිඳිදැ"යි මෙය සැලකළේය.

භික්ෂු නම, ආර්යයන් නො දක්නා නුගත් පෘථග් ජනයා රූපය... විඥානය ආත්ම වශයෙන් දකී. ආත්මය රූපවත්.... විඥානවත් කොට දකී. ආත්මයෙහි රූපය... විඥානය දකී. රූපයෙහි... විඥානයෙහි ආත්මය දකී. අනිත්‍ය වූ රූපය... විඥානය අනිත්‍යයයි ඇති සැටියෙන් නො දකී. දුක් වූ රූපය... විඥානය දුක්යයි ඇති සැටියෙන් නො දකී. අනාත්ම වූ රූපය... විඥානය අනාත්මයයි ඇති සැටියෙන් නො දකී. ප්‍රත්‍යයෙන් හටගත් රූපය.... විඥානය ප්‍රත්‍යයෙන් උපන් රූපය... විඥානයයි ඇති සැටියෙන් නො දකී. රූපය... විඥානය බිඳෙයි කියා ඇති සැටියෙන් නො දකී.

මහණෙනි, ආර්යයන් දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපය.... විඥානය ආත්ම වශයෙන් නො දකී. ආත්මය රූපවත්.. විඥානවත් කොට නො දකී. ආත්මයෙහි රූපය.... විඥානය නො දකී. රූපයෙහි විඥානයෙහි ආත්මය නො දකී. අනිත්‍ය වූ රූපය.... විඥානය අනිත්‍යයයි ඇති සැටියෙන් දකී. දුක් වූ රූපය... විඥානය දුක්යයි ඇති සැටියෙන් දකී. අනාත්ම වූ රූපය.... විඥානය අනාත්මයයි ඇති සැටියෙන් දකී. ප්‍රත්‍යයෙන් හටගත් රූපය.... විඥානය බිඳෙයි කියා ඇති සැටියෙන් දකී.

භික්ෂුව මෙසේ රූපයේ.... විඥානයේ විනාශය දැකීමෙන් "ඉදින් මම නො වූයෙමි නම් අතීත කර්ම රැස් කිරීමත් නො වී නම් මට මතු ස්කන්ධ උපදවන කර්ම රැස් කිරීමක් නො වෙයි. එවිට මට මතු ප්‍රතිසන්ධියක් නො වෙයි අදහන මහු ඕරම්භාගිය සංයෝජන නසන්නේ ද ? ස්වාමීනි, මෙසේ මිදෙන භික්ෂුව ඕරම්භාගිය සංයෝජන සිදිනවා ම යි.

ස්වාමීනි, කෙසේ දන්නා කෙසේ දක්නාහට විදර්ශනාවට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි ද ?

භික්ෂුව, මෙහි නුගත් පෘථග්ජනයා බිය නො විය යුතු තැන බිය වෙයි. භික්ෂුව, ඉදින් මම නො වූයෙමි නම් අතීත කර්ම රැස්කිරීමක් නො වී නම් මතු ස්කන්ධ පහළ කරන කර්ම රැස් කිරීමක් නො වෙයි. එවිට මට මතු ප්‍රතිසන්ධියක් නො වෙයි යන මෙය නුගත් පෘථග්ජනයාට බියකි. භික්ෂුව උගත් ආර්ය ශ්‍රාවකයා බිය නො විය යුතු තැන බිය නො වෙයි. ඉදින් මම නො වූයෙමි නම් ප්‍රතිසන්ධියක් නො වෙයි යන මෙය උගත් ආර්ය ශ්‍රාවකයාට බියක් නො වෙයි.

භික්ෂු නම, රූපය.... සංස්කාර වෙත පැමිණි කර්ම විඥානය රූපය... සංස්කාර අරමුණ කොට පිහිට කොට පවතී. තණ්හාවෙන් තෙත්ව වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙයි. භික්ෂු නම, යමෙක් රූපය... සංස්කාර හැර විඥානයේ යාම ඊම පනවමියි කියයි නම් එය සිදුවන්නක් නො වෙයි.

භික්ෂූ නම, ඉදින් රූප ස්කන්ධයෙහි.... විඥාන ස්කන්ධයෙහි භික්ෂුව ගේ රාගය දුරු වුව හොත් රාගය දුරු වීමෙන් අරමුණ දුරු වෙයි. විඥානයට පිහිට නො වෙයි.... අර්හත්ඵය සඳහා අනිකක් නැතැයි දනී. භික්ෂුව මෙසේ දත්නාහට දක්නාහට විදර්ශනාවට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි වදළහ.

4. උපාදන පරිවත්ත සූත්‍රය.

මහණෙනි, මේ උපාදන ස්කන්ධ පහකි. ඒ පහ කුමක් ද ? රූප උපාදන ස්කන්ධය, වේදනා උපාදන ස්කන්ධය, සංඥා උපාදන ස්කන්ධය, සංස්කාර උපාදන ස්කන්ධය විඥාන උපාදන ස්කන්ධය යි. මහණෙනි, යම් තාක් කල් මම මේ පරිවර්ත සතරින් යුතුව ස්කන්ධ පහ ඇති සැටියෙන් අවබෝධ නො කළෙමි ද ඒ තාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව අතර උතුම් වූ සම්මා සම්බෝධිය අවබෝධ කෙළමියි ප්‍රකාශ නො කළෙමි. යම් දක මහණෙනි, මම පරිවර්ත සතරින් යුතුව මේ ස්කන්ධ පහ ඇති සැටියෙන් අවබෝධ කළෙමි ද මහණෙනි, එවිට මම උතුම් වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමියි ප්‍රකාශ කළෙමි.

සතර පරිවර්තය කෙසේ ද ? රූපය අවබෝධ කළෙමි. රූපයේ හට ගැනීම අවබෝධ කළෙමි. රූපය නැසීම අවබෝධ කළෙමි. රූපය නැසීමේ මාර්ගය අවබෝධ කළෙමි. වේදනාව... විඥානය අවබෝධ කළෙමි වේදනා.... විඥාන හට ගැන්ම අවබෝධ කළෙමි. වේදනා.... විඥාන නැසීම අවබෝධ කළෙමි. වේදනා.... විඥාන නැසීමේ මග අවබෝධ කළෙමි.

මහණෙනි, රූපය කුමක් ද ? මහණෙනි, සතර මහාභූතත් සතර මහාභූත නිසා පවතින රූපත් මේ රූපය යි. ආහාර හට ගැන්මෙන් රූප හට ගනී. ආහාර නැසීමෙන් රූප නැසෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය රූප නැසීමේ මාර්ගය යි. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මා සමාධිය යි.

මහණෙනි, යම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙසේ රූපය දැන, රූපසමුදය රූපනිරෝධය දැන, රූප නිරෝධගාමිනී පටිපදව දැන රූපයෙහි කලකිරීම පිණිස, නො ඇල්ම පිණිස, නැති කිරීම පිණිස පිළිපන්නාහු වෙත් නම් ඔවුහු සුපටිපන්නයි. යමෙක් සුපිළිපත් නම් ඔවුහු මේ ශාසනයෙහි මනාව පිහිටියාහුය. මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් රූපය මෙසේ දැන, රූප සමුදය දැන, රූප නිරෝධය දැන, රූප නිරෝධගාමිනී පටිපදව දැන රූපයෙහි කලකිරීමෙන් නො ඇලීමෙන් නැසීමෙන් දැඩිව අල්වා නො ගෙන මිදුණාහු නම් ඔවුහු මනාව මිදුණාහුය. යමෙක් සුවිමුත්ත නම් ඔවුහු කෙවලිහුය[1] ඔවුනට පැනවීමට යසරක් නැත.

මහණෙනි, වේදනාව කුමක් ද ? මහණෙනි, මේ වේදනා රාශි හයකි. ඇසේ ස්පර්ශයෙන් උපන් වේදනාව, කතේ ස්පර්ශයෙන් උපන් වේදනාව, නාසයේ ස්පර්ශයෙන් උපන් වේදනාව, දිවේ ස්පර්ශයෙන් උපන් වේදනාව, ශරීරයේ ස්පර්ශයෙන් උපන් වේදනාව, සිතේ ස්පර්ශයෙන් උපන් වේදනාව යනු මහණෙනි, මේ වේදනාවයි. ස්පර්ශය හට ගැනීමෙන් වේදනාව හට ගනී. ස්පර්ශය නැති වීමෙන් වේදනාව නැති වෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම වේදනා නැති කිරීමේ මාර්ගය යි. එනම්... සම්මා සමාධිය යි.

මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මෙසේ වේදනාව දැන.... පිළිපන්නාහු නම් ඔවුහු සුපටිපන්නයි. ඔවුහු මේ ශාසනයෙහි පිහිටියාහු වෙති. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මෙසේ වේදනාව දැන මිදුණාහු ද ඔවුහු කෙවලී වෙති. ඔවුනට පැනවීමට යසරක් නැත.

මහණෙනි, සංඥාව කුමක් ද? මහණෙනි, මේ සංඥාරාශි හයකි. රූපසංඥා, ශබ්ද සංඥා, ගන්ධසංඥා, රසසංඥා, ස්ප්‍රෂ්ටව්‍ය සංඥා, ධර්ම සංඥායි. මහණෙනි, මේ සංඥායයි කියනු ලැබේ. ස්පර්ශයට හට ගැනීමෙන් සංඥාව හටගනී. ස්පර්ශය නැතිවීමෙන් සංඥාව නැති වෙයි.

---

1. කරන ලද සියලු කටයුතු ඇත්තෝ ය.

මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම සංඥා නැසීමේ මාර්ගය යි. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මෙසේ සංඥා දැන... මවුනට පැනවීමට යසරක් නැත.

මහණෙනි, සංස්කාර කුමක් ද ? මහණෙනි, මේ චේතනා රාශි නයකි. රූප සඤ්චේතනාව, සද්ද සඤ්චේතනාව, ගන්ධ සඤ්චේතනාව රස සඤ්චේතනාව, ඵොටඨබ්බ සඤ්චේතනාව, ධම්ම සඤ්චේතනාව යි මහණෙනි, මේ සංස්කාර යයි කියනු ලැබේ. ස්පර්ශ හට ගැනීමෙන් සංස්කාර හට ගනී. ස්පර්ශය නැති වීමෙන් සංස්කාර නැති වෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය සංස්කාර නැති කිරීමේ මගයි. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මෙසේ සංස්කාර දැන... මතුනට පැනවීමට යසරක් නැත.

මහණෙනි, විඤ්ඤාණය කුමක් ද? මහණෙනි, මේ විඤ්ඤාණ රාශි හයකි. චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය යි. මහණෙනි, මේ විඤ්ඤාණය යි කියනු ලැබේ. නාමරූප හට ගැනීමෙන් විඤ්ඤාණය හට ගනී. නාමරූප නැති වීමෙන් විඤ්ඤාණ නැති වෙයි. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම විඤ්ඤාණය නැති කිරීමේ මහයි... මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මෙසේ විඤ්ඤාන දැන... මවුනට පැනවීමට යසරක් නැත.

5. සත්තට්ඨාන සූත්‍රය

මහණෙනි, සත් කැනක දක්ෂ, තුන් ආකාරයකින් උපපරීක්ෂා කරන භික්ෂුව මේ ශාසනයෙහි නිම කළ සියලු
කටයුතු ඇති විසු බඹසර ඇති උත්තම පුරුෂයා යි කියනු ලැබේ.

මහණෙනි, භික්ෂුව සත් කැනක දක්ෂ වන්නේ කෙසේ ද ? මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව රූපය දනී. රූපයේ හට ගැනීම දනී. රූපයේ නැසීම දනී. රූපය නැසීමේ මග දනී. රූපයේ ආස්වාදය දනී. රූපයේ ආදීනව දනී. රූපයේ නිස්සරණය දනී. වේදනාව... විඤ්ඤාණය දනී. නිස්සරණය දනී.

මහණෙනි, රූපය කුමක් ද ? සතර මහාභූතත් සතර මහාභූත නිසා පවතින උපාදා රූපත් මේ රූපයි කියනු ලැබේ. රූපය නිසා යම් සැපයක් සොම්නසක් උපදී නම් මේ රූපයේ ආස්වාදයයි. රූපයේ යම් අනිත්‍ය බවක් දුක් බවක් වෙනස් වන බවක් ඇද්ද මේ රූපයේ ආදීනවයි. රූපයෙහි යම් ඡන්දරාග විනයක් ඡන්දරාග ප්‍රහාණයක් ඇද්ද මේ රූපයේ නිස්සරණය යි.

මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ රූපය දැන නිරෝධය පිණිස පිළිපන්නාහු නම් දුපටිපන්න වූ ඔවුහු මේ ශාසනයෙහි පිහිටියාහු වෙති. මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් මෙසේ රූපය දැන... මිදුණාහුද, මවුහු කෙවලී වෙති. මවුනට පැනවීමට යසරක් නැත.

මහණෙනි, වේදනාව කුමක් ද? මහණෙනි, වේදනා රාශි හයකි. ඇස ස්පර්ශ වීමෙන් උපන් වේදනාව.. සිත ස්පර්ශ වීමෙන් උපන් වේදනාවයි. වේදනාව නිසා යම් සැපයක් සොම්නසක් උපදී නම් මේ වේදනාවේ ආස්වාදයයි.... මේ වේදනා නිස්සරණයයි.

මහණෙනි, යම් කිසි මහණ බමුණු කෙනෙක් මෙසේ වේදනාව දැන... මිදුණාහු ද මවුහු කෙවලී වෙති. යසරක් නැත.

මහණෙනි, සංඥාව කුමක් ද ? මහණෙනි, මේ සංඥා හයකි. රූප සංඥා... ධර්ම සංඥායි මහණෙනි, යම් මහණ බමුණු කෙනෙක් මෙසේ සංඥාව දැන මිදුණාහු ද.... මවුනට යසරක් නැත.

මහණෙනි, සංස්කාර කුමක් ද? මහණෙනි, මේ චේතනා කාය හයකි. රූපසඤ්චේතනා... ධම්මසඤ්චේතනා යි. මහණෙනි, යම් කිසි මහණ බමුණු කෙනෙක් මෙසේ සංස්කාර දැන මිදුණාහු ද මවුනට යසරක් නැත.

මහණෙනි, විඤ්ඤාණය කුමක් ද? මහණෙනි, මේ විඤ්ඤාණ හයකි. චක්ඛුවිඤ්ඤාණය... මනොවිඤ්ඤාණයයි. මහණෙනි, යම්කිසි මහණ බමුණු කෙනෙක් මෙසේ විඤ්ඤාණ දැන මිදුණාහු ද මවුනට.... පැනවීමට යසරක් නොමැත.

මහණෙනි, භික්ෂුව කෙවදෑරුම් උපපරීක්ෂා ඇත්තේ කෙසේ ද ? මහණෙනි, මේ සසුනෙහි භික්ෂුව ධාතු වශයෙන් විමසා බලයි. ආයතන වශයෙන් විමසා බලයි. පටිච්චසමුප්පාද වශයෙන් විමසා බලයි. මහණෙනි, භික්ෂුව මෙසේ තුන් ආකාරයෙන් විමසා බලන්නේ වෙයි.

මහණෙනි, සත් තැනෙක දක්ෂ වූ කෙවැදෑරුම්ව විමසා බලන්නා වූ භික්ෂුව මේ සසුනෙහි කෙවලී වෙයි. වැස නිම වූයේ වෙයි. උත්තම පුරුෂයායි කියනු ලැබේ.

6. සම්බුද්ධ සූත්‍රය

මහණෙනි, තථාගත අර්හත් සම්බුදුරජාණන් වහන්සේ රූපයෙහි කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් දැඩිව අල්වා නො ගෙන මිදුණු හෙයින් සම්මා සම්බුද්ධ යයි කියනු ලැබේ. මහණෙනි, රූපයෙහි කලකිරීමෙන් නො ඇලීමෙන් දැඩිව අල්වා නො ගෙන මිදුණු භික්ෂුවත් පඤ්ඤා විමුත්ත යයි කියනු ලැබේ.

මහණෙනි, තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ වේදනාවෙහි..... විඤ්ඤාණයෙහි කලකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් දැඩිව නො ගෙන මිදීමෙන් සම්මා සම්බුද්ධ යි කියනු ලැබේ. මහණෙනි, වේදනාවෙහි.... විඤ්ඤාණයෙහි කලකිරීමෙන්.... මිදුණු භික්ෂුවත් පඤ්ඤාවිමුත්ත යි කියනු ලැබේ.

මහණෙනි, එහි ලා තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේත් පඤ්ඤාවිමුත්ත භික්ෂුව ගේත් විශේෂය කුමක් ද ? අදහස කුමක් ද ? වෙනස කුමක් ද ? ස්වාමිනි, අපගේ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන කොට ඇත්තේ ය. මේ දේශනාවේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු ඉගෙන ගනිති.

මහණෙනි, එහෙනම් අසව්. මනාව සිත්හි දරව්. දෙසන්නෙමි. එසේය ස්වාමීනි යි භික්ෂූහු උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. මහණෙනි, තථාගත අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නුපත් මහ උපදවති. නො හට ගත් මහ හට ගන්වති. නො කී මහ කියති. මහ දනිති. මහ අවබෝධ කළහ. මහ නිපුණ වෙති. මහණෙනි, මෙකල ශ්‍රාවකයෝ මහ අනුගමනය කරන්නාහුය. පසුව මාර්ගයෙහි යෙදී වාසය කරන්නාහුය.

මහණෙනි. තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේත් පඤ්ඤාවිමුක්ත භික්ෂුවත් අතර විශේෂය මෙය යි. අදහස මෙය යි. වෙනස මෙයයි.

7. පඤ්චවග්ගිය සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන මිගදයෙහි වසති. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි පස්වග භික්ෂූන් ඇමතූහ. "ස්වාමීනි" යි භික්ෂූහු පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ.

"මහණෙනි, රූපය අනාත්මයි මහණෙනි, මේ රූපය ආත්මය වී නම් මේ රූපය ආබාධ සඳහා නො පවතී. රූපයෙහි ලා මගේ මේ රූපය මෙසේ වේවායි මගේ රූපය මෙසේ නො වේවායි ලැබීමටත් පුළුවනි. මහණෙනි, රූපය අනාත්ම නිසා රූපය ආබාධ සඳහා පවතී. රූපයෙහි ලා මගේ මේ රූපය මෙසේ වේවා මෙසේ නො වේවායි ලබන්නත් බැරිය.

මහණෙනි, වේදනාව.... විඤ්ඤාණය අනාත්මයි. මහණෙනි, මේ වේදනාව.... විඤ්ඤාණය ආත්මය වී නම් මේ වේදනා... විඤ්ඤාණ ආබාධ පිණිස නො පවතී. වේදනාවෙහි..... විඤ්ඤාණයෙහි ලා මගේ මේ වේදනාව.... විඤ්ඤාණය මෙසේ වේවා මෙසේ නො වේවා යි ලබන්නත් පුළුවනි. මහණෙනි, වේදනාව... විඤ්ඤාණය අනාත්ම නිසා ආබාධ පිණිස පවතී. මගේ මේ වේදනාව... විඤ්ඤාණය මෙසේ වේවා මෙසේ නො වේවායි ලබන්නක් බැරිය.

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම් ඒ දුක් ද? සැප ද? දුකයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම් දුක් නම්, වෙනස් වන ස්වභාව ඇත් නම් එය මගේය. මම වෙමි. ඒ මගේ ආත්මයයි. දැකීම සුදුසු ද? ස්වාමීනි, එය නුසුදුසුයි.

මහණෙනි, එබැවින් මෙහි ලා අතීත-අනාගත-වර්තමාන, අභ්‍යන්තර-බාහිර, රළු-සියුම්, හීන-ප්‍රණීත, දුර ළඟ යම් රූපයන් විඤ්ඤාණයක් ඇත් නම් ඒ හැම රූපයක්.... විඤ්ඤාණයක් ම එය මා ගේ නො වෙයි. මම නො වෙමි. මාගේ ආත්මය නො වෙයි කියා මෙය ඇති සැටියෙන් සම්‍යග් ප්‍රඥාවෙන් දැකිය යුතුයි.

මහණෙනි, මෙසේ දකින උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි.... විඤ්ඤාණයෙහි කලකිරෙයි. කලකිරී නො ඇලෙයි. නො ඇලී මිදෙයි. මිදුණේ මිදුණෙමියි ඤාණය ඇති වෙයි. ජාතිය ක්ෂය විය. රහත් බව සඳහා තව යමක් නැතැයි දනී.

8. මහාලි සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාල මහ නුවර ළඟ මහ වනයෙහි කූටාගාර ශාලාවෙහි වසති. එකල මහාලි ලිච්ඡවි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ මෙය සැලකළේය.

ස්වාමීනි, පූරණකාශ්‍යප මෙසේ කියයි. සතුන් ගේ කෙලෙසීමට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව. සත්වයෝ කිලිටි වෙති. සතුන් ගේ පාරිශුද්ධියට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්තු පිරිසිදු වෙති. මේ ගැන භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන්නේ කුමක් ද?

මහාලී, සතුන් ගේ කෙලෙසීමට හේතු තිබේ. ප්‍රත්‍ය තිබේ. හේතු ඇතිව ප්‍රත්‍ය ඇතිව සත්තු කෙලෙසති. සතුන්ගේ පාරිශුද්ධියට හේතු තිබේ. ප්‍රත්‍ය තිබේ. හේතු ඇතිව ප්‍රත්‍ය ඇතිව සත්තු පිරිසිදු වෙති.

ස්වාමීනි, සතුන් ගේ කෙලෙසීමට හේතු කුමක් ද? ප්‍රත්‍ය කුමක් ද? හේතු ඇතිව ප්‍රත්‍ය ඇතිව සත්තු කෙලෙසන්නේ කෙසේ ද?

මහාලි, රූපය.... විඤ්ඤාණය ඒකාන්තයෙන් දුක් වූවක්, දුකෙහි වැටුණක්. දුකෙහි පිවිසගත්තක්, සැපෙහි නො වැදගත්තක් නම් සත්තු රූපයෙහි නො ඇලෙති. රූපය... විඤ්ඤාණය සැපක්, සැපෙහි වැටුණක්, සැපෙහි පිවිස ගත්තක් නිසා සත්තු රූපයෙහි ඇලෙති. ඇලීමෙන් බැඳෙති. බැඳීමෙන් කෙලෙසති. මහාලි, සතුන් ගේ කෙලෙසීමට මේ හේතුයි. මේ ප්‍රත්‍යයි. මෙසේ සත්තු හේතු ඇතිව ප්‍රත්‍ය ඇතිව කෙලෙසති.

ස්වාමීනි, සතුන් ගේ පාරිශුද්ධිය පිණිස හේතු කුමක් ද? හේතු ඇතිව ප්‍රතය දැනිව සත්තු පාරිශුද්ධියට පත්වන්නේ කෙසේ ද?

මහාලි, රූපය... විඤ්ඤාණය ඒකාන්තයෙන් සැපක්, සැපයෙහි වැටුණක්, සැපයෙහි පිවිස ගත්තක් , දුකෙහි නො පිවිසගත්තක් නම් රූපයෙහි.... විඤ්ඤයෙහි නො කලකිරෙති. මහාලී, රූපය.... විඤ්ඤාණය දුකක්, දුකෙහි වැටුණක්, දුකෙහි පිවිස ගත්තක් නිසා සත්තු රූපයෙහි කලකිරෙති. කලකිරී නො ඇලෙති. නො ඇලීමෙන් පිරිසිදු වෙති. මහාලි, සතුන් ගේ පාරිශුද්ධියට මේ හේතුයි. මේ ප්‍රත්‍යයි. මෙසේ සත්තු හේතු ඇතිව ප්‍රත්‍ය ඇතිව පිරිසිදු වෙති.

9. ආදිත්ත සූත්‍රය

මහණෙනි, රූපය ඇවිල ගත්තේ ය. වේදනාව ඇවිල ගත්තේ ය. සංඥාව ඇවිල ගත්තේ ය. සංස්කාර ඇවිල ගත්තේ ය. විඤ්ඤාණය ඇවිල ගත්තේ ය.

මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත් කලකිරෙයි. වේදනාවෙහිත් කලකිරෙයි. සංඥාවෙහිත් කලකිරෙයි. සංස්කාරයෙහිත් කලකිරෙයි. විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරී නො

ඇලෙයි. නො ඇලී මිදෙයි. මිදුණු පසු මිදුණෙමි යි දනී. ජාතිය ක්‍ෂය විය... මේ රහත් බව යදහා වෙන කළ යුත්තක් නැතැයි දනී.

10. නිරුක්තිපථ සූත්‍රය

මහණෙනි, මහණ බමුණන්, තුවණැත්තන් නින්දා නො කළ නො කරන, පෙර බැහැර නො කළ මතු බැහැර නො කරන, දැන් බැහැර නො කරන මේ නිරුක්තිපථ-අධිවචනපථ-ප්‍රඥප්තිපථ[1] තුනක් වෙයි. ඒ තුන කුමක් ද ?

මහණෙනි, යම් රූපයක්... විඤ්ඤාණයක් ඉකුත් වූයේ නම් නැති වූයේ නම්, වෙනසට පත් වූයේ නම් "විය" යනු ඒ රූපයේ.... විඤ්ඤාණයේ සංඥාවයි. "විය" යනු ඒ රූපයේ.... විඤ්ඤාණයේ නමයි.. "විය" යනු ඒ රූපයේ... සංඥාවේ පැනවීමයි. ඇත යන්න ඒ රූපයේ... සංඥාවේ සංඥාව නො වෙයි. වන්නේය යනු ඒ රූපයේ... සංඥාවේ නම නො වෙයි.

මහණෙනි, යම් රූපයක්... විඤ්ඤාණයක් නූපන්නේ නම්, පහළ නුවූයේ නම් වන්නේය යනු ඒ රූප.... විඤ්ඤාණයේ සංඥාවයි. වන්නේය" යනු නමයි. වන්නේය යනු පැනවීමයි. ඇත යනු එහි සංඥාව නො වෙයි. වූයේය යනු සංඥාව නො වෙයි.

මහණෙනි, යම් රූපයක්... සංඥාවක් උපන්නේ නම් පහළ වූයේ නම් "ඇත" යනු ඊට සංඥාවයි. ඇත යනු ඊට නමයි. ඇත යනු ඊට පැනවීමයි. වූයේය යනු ඊට නම නො වෙයි. වන්නේය යනු ඊට නම නො වෙයි.

මහණෙනි, මහණ බමුණන් නැණවතුන් ප්‍රතික්ෂේප නො කළ පෙර බැහැර නො කල මතු බැහැර නො කරන දැන් බැහැර නො කරන මේ නිරුක්ති පථ-අධිවචන පථ-ප්‍රඥප්තිපථ තුනයි.

මහණෙනි, උක්කලා ජනපද වාසී අහේතුක වාදී, අකිරිය

1. පර්යාය වචන තුනකි. ව්‍යවහාර, අර්ථකථන මෙයින් ගැනේ.

වාදී, නාස්තික වාදී යම් ඒ වස්සභඤ්ඤා දෘෂ්ටිගතිකයෝ දෙදෙනෙක් වෙත් ද මවුහුත් මේ නිරුක්තිපථ-අධිවචනපථ-ප්‍රඥප්තිපථ තුන ගැරහිය යුතුයයි, නින්දා කළ යුතුයයි නො සිතුහ. මක්නිසා ද? නින්දා අපහාස, දෝෂාරෝපණ, අපවාද බීය නිසයි.

2. අරහන්ත වර්ගය

1. උපාදිය සූත්‍රය

ඉක්බිති එක්තරා භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ පසෙක හිඳ "ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේගෙන් දසා තනිව සමූහයෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තසන විර්යයෙන් යුතුව නිවනට යොමු කළ සිතින් විසීමට සුදුසු බණක් කෙටියෙන් දෙයනු මැනැවැ"යි මෙය සැල කළේය.

භික්ෂු නම, තණ්හා-දිට්ඨි-මාන වශයෙන් දැඩිව ගැනීමෙන් මාර බැම්මෙන් බැඳෙයි. දැඩිව නො ගැනීමෙන් මරුගෙන් මිදෙයි. "භාග්‍යවතුන් වහන්ස, දැන ගනිමි. සුගතයන් වහන්ස, දැන ගනිමි."

භික්ෂු නම, මා විසින් කොටින් ප්‍රකාශ කළ ධර්මය මබ විස්තර වශයෙන් කෙසේ දන්නෙහි ද? ස්වාමීනි, රූප... විඤ්ඤාණ තණ්හා දිට්ඨි-මාන වශයෙන් දැඩිව ගැනීමෙන් මාර බැම්මෙන් බැඳෙයි. දැඩිව නො ගැනීමෙන් මරුගෙන් මිදෙයි. ස්වාමීනි, කොටින් වදළ ධර්මයේ අර්ථය විස්තර වශයෙන් මම මෙසේ දැන ගනිමි." භික්ෂු නම, මා කොටින් ප්‍රකාශ කළ දහම මබ මෙසේ විස්තර දත යුතුයි. සාධු... සාධු...

එකල ඒ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන අනුමෝදන්ව අසුනෙන් නැගිට වැඳ පැදකුණු කොට ගියහ. ඉක්බිති කනිව.... රහතන් වහන්සේලා අතර එක් නමක් වූහ.

2. මඤ්ඤමාන සූත්‍රය

එකල එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි,

මට... නිවනට යොමු කළ සිතින් විසීමට සුදුසු බණක් කෙටියෙන් දෙයනු මැනැවැයි සැලකළේය.

භික්ෂු නම, තණ්හා-දිට්ඨි-මාතමඤ්ඤනා වශයෙන් ගැනීමෙන් මාර පාශයෙන් බැඳෙයි. මඤ්ඤනා වශයෙන් නො ගැනීමෙන් මරුගෙන් මිදෙයි. භාග්‍යවතුන් වහන්ස, දැන ගනිමි. සුගතයන් වහන්ස, දැන ගනිමි.

භික්ෂු නම, මා කෙටියෙන් දෙසූ දහම ඔබ කෙසේ විස්තර වශයෙන් දැන ගත්තහේ ද? "ස්වාමීනි. රූප... විඤ්ඤාණ මඤ්ඤනා වශයෙන් ගැනීමෙන් මාර බැම්මෙන් බැඳෙයි. මඤ්ඤනා වශයෙන් නො ගන්නේ මරුගෙන් මිදෙයි. ස්වාමීනි, මම මෙසේ දැන ගතිමි. සාධු... සාධු.... භික්ෂු නම තුඹ මා කෙටියෙන් වදළ දහම මෙසේ තේරුම් ගත යුතු යි.

එකල ඒ භික්ෂු නම... රහතන් වහන්සේලා අතර එක් නමක් විය.

3. අභිනන්දන සූත්‍රය

එකල එක් භික්ෂු නමක්.... භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මට... දහමක් කෙටියෙන් දෙයනු මැනැවැ යි සැලකළේය.

භික්ෂු නම, තණ්හාදි වශයෙන් අභිනන්දනය කරන්නේ මාර බැම්මෙන් බැඳෙයි. අභිනන්දනය නො කරන්නේ මරුගෙන් ගැළවෙයි. භාග්‍යවතුන් වහන්ස, දැන ගනිමි. සුගතයන් වහන්ස, දැන ගනිමි.

භික්ෂු නම, මවිසින් කෙටියෙන් ප්‍රකාශ කළ ධර්මය මබ විස්තර වශයෙන් දැන ගත් අන්දම කෙසේ ද? "ස්වාමීනි, රූප... විඤ්ඤාණ අභිනන්දනය කරන්නේ මාර පාශයෙන් බැඳෙයි. අභිනන්දන නො කරන්නේ මරුගෙන් ගැළවෙයි. මෙසේ දැන ගනිමි. සාධු...

සාධු.... භික්ෂු නම විස්තර වශයෙන් දන්නෙහි ය. භික්ෂු නම, මෙසේ විස්තර වශයෙන් දත යුතුය.

ඉක්බිති ඒ භික්ෂු නම, භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන එක් රහත් නමක් විය.

4. අනිච්ච සූත්‍රය

එකල එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, මට... කෙටියෙන් බණක් දෙසනු මැනැවැයි යැලකළේය. භික්ෂු නම, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ තෘෂ්ණාඡන්දය දුර ලිය යුතු යි. "භාග්‍යවතුන් වහන්ස, දැන ගතිමි. සුගතයන් වහන්ස, දැන ගතිමි. භික්ෂු නම, විස්තර වශයෙන් දැන ගත් අන්දම කෙසේ ද ? ස්වාමීනි, රූපය.... විඤ්ඤාණය අනිත්‍යයි. එහි මගේ තණ්හාඡන්දය දුරු කළ යුතුයි. මෙසේ දැන ගතිමි. සාධු... සාධු... භික්ෂු නම, ඔබ විස්තර වශයෙන් දන්නෙහි ය. භික්ෂු නම, මෙසේ විස්තර වශයෙන් දත යුතුය. ඉක්බිති ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන.... එක් රහත් නමක් විය.

5. දුක්ඛ සූත්‍රය

එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මට කෙටියෙන් බණක් දෙසනු මැනැවැ"යි යැලකළේය. භික්ෂු නම, යමක් දුක් නම් එහි ඔබලා ගේ ඡන්දය දුර ලිය යුතු යි. භාග්‍යවතුන් වහන්ස, දැන ගතිමි. සුගතයන් වහන්ස, දැන ගතිමි. භික්ෂු නම, විස්තර වශයෙන් දැන ගත් අයුරු කෙසේ ද? ස්වාමීනි, රූපය... විඤ්ඤාණය දුකයි. එහි ලා මගේ ඡන්දය දුර ලිය යුතුය විස්තර වශයෙන් මෙසේ දැන ගතිමි.. භික්ෂු නම, විස්තර වශයෙන් දන්නෙහි ය. ඉක්බිති ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන.... එක් රහත් නමක් විය.

6. අනත්ත සූත්‍රය

එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ භාග්‍යවතුන් වහන්සේ ට ස්වාමීනි,... මට කෙටි බණක් දෙසනු මැනැවැයි යැලකළේ ය. භික්ෂු නම, යමක් අනාත්ම නම් එහි ලා ඔබලා ගේ තෘෂ්ණා ඡන්දය ප්‍රහීණ කළ යුතුය." භාග්‍යවතුන් වහන්ස, මම තේරුම් ගතිමි. සුගතයින් වහන්ස, තේරුම් ගතිමි. භික්ෂු නම, ඔබ විස්තර වශයෙන් දැන ගත්තේ කෙසේ ද? ස්වාමීනි, රූපය... විඤ්ඤාණය අනාත්මයි, එහිලා මගේ ඡන්දය දුරු ලිය යුතු ය. මම විස්තර වශයෙන් මෙසේ දනිමි. භික්ෂු නම, සාධු... සාධු.... ඔබ.... විස්තර වශයෙන් දන්නෙහිය. භික්ෂු නම, විස්තර වශයෙන් දත යුතුය. ඉක්බිති ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන එක් රහත් නමක් විය.

7. අනත්තනිය සූත්‍රය

එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ස්වාමීනි, මට කෙටි බණක් දෙසනු මැනැවැයි යැලකළේය. භික්ෂු නම, යමක් තමා සතු නො වෙයි නම් එහි ඡන්දය දුරු කළ යුතුය. "භාග්‍යවතුන් වහන්ස, මම දනිමි. සුගතයන් වහන්ස, මම දනිමි. භික්ෂු නම, ඔබ විස්තර වශයෙන් දැන ගත් අයුරු කෙසේ ද? ස්වාමීනි, රූපය... විඤ්ඤාණය තමා සතු නො වෙයි. එහි ලා මගේ ඡන්දය දුරු කළ යුතුයි. මා විස්තර වශයෙන් දැනගත්තේ මේ හැටියටයි. භික්ෂු නම, සාධු.. සාධු... ඔබ විස්තර වශයෙන් දන්නෙහිය. භික්ෂු නම, මෙසේ විස්තර වශයෙන් දත යුතුය. ඉක්බිති ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන... එක් රහත් නමක් විය.

8. රජනීය සූත්‍රය

එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ස්වාමීනි, මට කෙටි බණක් වදළ මැනැවැයි යැලකළේය.

භික්ෂු නම, යමක් ඇලිය යුතු අන්දමින් පවතී නම් එහි ඔබ ගේ ඡන්දය දුරු කළ යුතුයි. භාග්‍යවතුන් වහන්ස, මම දැන ගනිමි. සුගතයන් වහන්ස, දැන ගනිමි. භික්ෂු නම, ඔබ විස්තර වශයෙන් දැන ගත් හැටි කෙසේ ද? ස්වාමීනි, රූපය.... විඥානය ඇලිය යුතු අන්දමින් පවතී. එහි මාගේ ඡන්දය දුරු කළ යුතුය. මා විස්තර වශයෙන් දැනගත් හැටි මෙයයි. භික්ෂු නම, මෙසේ දන යුතුයි. ඉක්බිති ඒ භික්ෂුතම භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනය පිළිගෙන එක් රහත් නමක් විය.

9. රාධ සූත්‍රය

ඉක්බිති ආයුෂ්මත් රාධ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පයෙක හිඳ මෙසේ සැලකළේය. "ස්වාමීනි, කෙසේ දන්නා කෙසේ දන්නාහට මේ විඤ්ඤාණ සහිත කයෙහිත් බාහිර වූ සියලු අරමුණු වලත් මම ය. මා ගේ ය යන හැඟීම් සහ මාන අනුසය ධර්ම නො වන්නේ ද?

රාධ, යම් අතීත-අනාගත - වර්තමාන රූප.. විඥාන ඇද්ද, අභ්‍යන්තර, බාහිර, රළු-සියුම්, පහත්-උසස් දුර-ළඟ යම් රූප... විඥන ඇද්ද, ඒ සියලු රූප... විඥන මේ මම නො වෙමි. මා ගේ නො වෙයි කියා ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී. රාධ, මෙසේ දක්නා තැනැත්තාට විඤ්ඤාණ සහිත මේ කයෙහිත් බාහිර වූ සියලු අරමුණුවලත් අහංකාර මමංකාර මානානුසය නො වෙයි. ඉක්බිති ආයුෂ්මත් රාධ භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව පිළිගෙන.... එක්තරා රහත් නමක් විය.

10. සුරාධ සූත්‍රය

ඉක්බිති ආයුෂ්මත් සුරාධ... "ස්වාමීනි, කෙසේ දන්නා කෙසේ දක්නාහු ගේ සිත මේ සවිඤ්ඤාණක කයෙහිත් බාහිර සියලු අරමුණුවලත් අහංකාරය මමංකාර මානානුසය පහ වූ මනා කොට මිදුණු ශාන්ත සිතක් වෙයි ද? යි සැලකළේය.

සුරාධ, යම් අතීත-අනාගත-වර්තමාන සියලු රූප... විඥන ඇද්ද ඒ සියලු රූප.... විඥන මම නො වෙමි. මා ගේ නො වෙයි කියා මෙසේ ඇති සැටියෙන් මනා තුවණින් දක්නහු ගේ දන්නහු ගේ සිත මනාව මිදුණේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් සුරාධ... එක්තරා රහත් නමක් විය.

3. ඛජ්ජනීය වර්ගය

1. අස්සාද සූත්‍රය

මහණෙනි, නුගත් පෘථග් ජනයා රූපයේ ආස්වාදයත් ආදීනවත්, නිස්සරණයත් ඇති සැටියෙන් නො දනී. වේදනා... විඤ්ඤාණයේ... ඇති සැටියෙන් නො දනී.

මහණෙනි, උගත් ආර්ය ශ්‍රාවකයා රූපයේ... විඤ්ඤාණයේ ආස්වාදයත් ආදීනවත් නිස්සරණයත් ඇති සැටියෙන් දනී.

2. පඨම සමුදය සූත්‍රය

මහණෙනි, නුගත් පෘථග් ජනයා රූපයේ... විඤ්ඤාණයේ ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනව, නිස්සරණය ඇති සැටියෙන් නො දනී. මහණෙනි, උගත් ආර්ය ශ්‍රාවකයා රූපයේ... විඤ්ඤාණයේ ඇති වීම, නැති වීම, ආස්වාදය, ආදීනව, නිස්සරණය ඇති සැටියෙන් දනී.

3. දුතිය සමුදය සූත්‍රය

මහණෙනි, උගත් ආර්ය ශ්‍රාවකයා රූපයේ–විඤ්ඤාණයේ ඇතිවීම, නැතිවීම, ආස්වාදය, ආදීනව, නිස්සරණය ඇති සැටියෙන් දනී.

4. පඨම අරහන්ත සූත්‍රය

මහණෙනි, රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් එය අනාත්මයි. යමක් අනාත්ම නම් ඒ මා ගේ නො වෙයි. ඒ මම නො වෙමි. එය මාගේ ආත්මය නො

වෙයි. මෙය මෙසේ ඇති සැටියෙන් හොඳ නුවණින් දැකිය යුතුයි.

මහණෙනි, මෙසේ දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරෙයි. කලකිරි නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුණු කල මිදුණෙමියි දැනීම වෙයි. මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

මහණෙනි, සත්ත්වාවාස යම් තරම් ද භවාග්‍රය යම් තරම් ද ඒ තරම් ලෝකයෙහි යම් මේ රහත්හු වෙත් ද මොවුහු අග්‍ර වෙති. ශ්‍රේෂ්ඨ වෙති. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. ඉක්බිති සුගත ශාස්තෘන් වහන්සේ මෙයත් වදළහ.

ඒකාන්තයෙන් ම රහතන් වහන්සේලා සැපවත් ය. උන්වහන්සේලාට තණ්හාව නැත. අස්මිමානය මුලිනුපුටා දැමූහ. මොහ දැල ඉරා දැමූ හ.

උන්වහන්සේලා නිවතට පැමිණියහ. උන්වහන්සේලා ගේ සිත නො කැලඹෙයි. උන්වහන්සේලා ලොව නො ඇලෙති. බ්‍රහ්මයෝ ය, ආස්‍රව රහිතය.

පංච ස්කන්ධය නුවණින් දැන සත්සදහම්[1] ගොදුරු කොට ගත්හ. ප්‍රශංසා කටයුත්තාහ. සත්පුරුෂයෝය. බුදුරජාණන් වහන්සේ ගේ ඖරස පුත්‍රයෝ ය.

සත්රුවනින්[2] යුක්තයහ. ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මුණහ. දුරු වූ භය හෙරව ඇතිව හැසිරෙන්නාහ.

දස අංගයෙන් යුක්තයහ. මහා ඇත්කුය. සමාහිතයහ. මුන්වහන්සේලා ලොව ශ්‍රේෂ්ඨයහ. උන්වහන්සේලාට තණ්හාව නැත.

අසෙඛඤාණය[3] උපන්නේ ය. මේ අන්තිම ආත්ම භාවය යි. බ්‍රහ්මචර්ය සාරයෙහි[4] අත් උදවු රහිතයහ.

---

1. සද්ධා හිරි, මත්තප්ප, බාහුසච්ච, ආරද්ධවිරියතා, උපට්ඨිකසතිතා, පඤ්ඤා
2. සප්ත කොට්‍යඩිග
3. රහත්පල නුවණ
4. රහත්බව

මානයෙහි නො සැලෙති. පුනර්භවයෙන් මිදුණාහ. රහත් බිමට පැමිණියහ. උන්වහන්සේලා ලොව දිනූවෝය.

උඩ–හරහ–යට උන්වහන්සේලාට තණ්හාවක් නැත. ලොව උතුම් වූ බුද්ධ වූ උන්වහන්සේලා අභිත නාද කරන්නාහ.

5. දුතිය අරහන්ත සූත්‍රය

මහණෙනි, රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුකයි. යමක් දුක් නම් ඒ අනාත්මයි. යමක් අනාත්ම නම් එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි. මහණෙනි, මෙසේ මෙය ඇති සැටියෙන් සම්‍යග් ප්‍රඥාවෙන් දත යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි.. විඤ්ඤාණයෙහි කලකිරෙයි. කලකිරී නො ඇලෙයි. නො ඇලෙන්නේ මිදෙයි. මිදුණු පසු මිදුණෙමියි දනී. රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

6. සීහොපම සූත්‍රය

මහණෙනි, මෘගරාජ සිංහයා හැන්දෑ ජාමයේ වසන තැනින් නික්මෙයි. ව්‍යායෙන් නික්මී ඇහ කිලිපොළයි. ඇහ කළඹවා හාත්පස හතරවටේ බලයි. හාත්පස හතරවටේ බලා තුන් වරක් සිංහනාද කරයි තුන් වරක් සිංහනාද කොට ගොදුරු පිණිස පිටත් වෙයි.

මහණෙනි,.. යම් කිසි තිරිසන්ගත සතෙක්, කෑගසන සිංහයා ගේ නාදය අසයි ද ඌ හොඳට ම බයට සන්ත්‍රාසයට සංවේගයට පත් වෙයි. බිලවල වසන සත්තු බිලවලට වදිති. දියේ වසන සත්තු දියට වදිති. කැලෑවල වසන සත්තු කැලෑ වදිති. කුරුල්ලෝ අහසට නගිති. මහණෙනි, ගම් නියම්ගම් රාජධානිවල දැඩි වරපටවලින් බැඳුණු රජු ගේ මහ ඇතුනුත් ඒ දැඩි බැම් කඩා බිඳ ගෙන බයේ මළමුත්‍ර හෙල හෙලා ඒ මේ අත පලා යති. මහණෙනි, මෘගරාජ සිංහයා තිරිසන්ගත සතුන් අතර මෙවැනි මහාඍද්ධි ඇත්තෙකි. මහෙශාඛ්‍යයෙකි. මහත් ආනුභාව ඇත්තෙකි.

එමෙන් මහණෙනි, යම් කලෙක අර්හත් සම්‍යක් සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලොකවිදූ වූ අනුත්තර පුරිසදම්මසාරථී වූ දෙවිමිනිසුන්ට ශාස්තෘ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සේක් ද උන්වහන්සේ "මේ රූපයයි... විඤ්ඤානයයි. මේ රූපයේ... විඤ්ඤානයේ හට ගැන්මයි. මේ රූපයේ... විඤ්ඤානයේ නැති වීමයි. කියා දහම් දෙසන සේක.

මහණෙනි, දීර්ඝායු ඇති පැහැපත්, සැප බහුල මහවිමන්වල බොහෝ කල් වසන යම් දෙවිවරු ඇත් ද ඔවුහුත් තථාගතයන් වහන්සේ ගේ බණ අසා අනිශයින් ම බියට සන්ත්‍රාසයට සංවේගයට පැමිණෙති. පින්වතුනි, අපි අනිත්‍යව ම ත් නිත්‍ය වූවෝ වෙමුයි සිතුවෙමු. අපි, සදකාලික නො වූවෝව ම ත් සදකාලික වූවෝ වෙමුයි සිතුවෙමු. පින්වතුනි, අපිත් අනිත්‍ය වෙමු. අස්ථිර වෙමු. සදකාලික වූවෝ නො වෙමු. පංච ස්කන්ධ යුක්ත වූවෝ වෙමු යි බිය වෙති.

මහණෙනි, ශාස්තෘ වූ අසම වූ තථාගතයන් වහන්සේ මෙසේ දෙවියන් සහිත ලෝකයාට මහත් ඍද්ධි ඇත්තාහ. මෙසේ මහෙශාඛ්‍ය වෙති. මහානුභාව වෙතියි මෙසේ වදළහ. සුගත ශාස්තෘන් වහන්සේ මෙසේ වදරා මෙසේත් වදළහ.

දෙවියන් සහිත ලෝකයාට ශාස්තෘ වූ, අසම වූ බුදුරජාණන් වහන්සේ යම් දක විශිෂ්ට ඥානයෙන් දැන පංච ස්කන්ධය පංච ස්කන්ධයේ හට ගැන්ම, නිරෝධය සහ දුක් සනහන ආර්ය අෂ්ටාංගික මාර්ගය ද යන දහම්යක් පැවැත් වූ සේක්ද,

වර්ණවත්, දීර්ඝායු ඇති, කීර්තිමත් යම් දෙවියෝ ඇත් ද ඔවුහු සිංහයා ගේ නාදය ඇසූ මෘගයන් බියවන්නාක් මෙන් "පින්වතුනි, අපි පංච ස්කන්ධය නො ඉක්මවිමු. අනිත්‍ය වෙමු මිදුණා වූ තාදි ගුණ යුත් බුදුරජාණන් වහන්සේගෙන් අසා දැන ගනිමු යයි බිය ත්‍රාසය ඉපද වූහ.

7. බජ්ජනීය සූත්‍රය

මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ පෙර විසූ අනෙක ප්‍රකාර කඳ පිළිවෙළ සිහිකරන්නාහු සිහිකෙරෙත් නම් ඒ හැම දෙන ම පංච ස්කන්ධ හෝ එයින් එකක් හෝ සිහිකරති.

මහණෙනි, අතීතයෙහි මෙබඳු රූප ඇත්තෙක් ව සිටියෙමි යි සිහි කරත්නේ රූපය ම හෝ සිහි කරයි. මෙබඳු වේදනාව.. විඤ්ඤාන ඇත්තෙක් වීමි යි වේදනාව... විඤ්ඤානය ම සිහි කරයි.

මහණෙනි, රූපයයි කියන්නේ කුමක් නිසා ද? මහණෙනි වෙනස් වන හෙයින් රූපය යි කියනු ලැබේ. කුමකින් වෙනස් වෙ ද? සීතලිනුත් වෙනස් වෙයි. උෂ්ණයෙනුත් වෙනස් වෙයි. බඩගින්නෙනුත් වෙනස් වෙයි. පිපාසයෙනුත් වෙනස් වෙයි. ඩැහැ ලේ බොන මැසි, විද ලේ බොන මදුරු, සුළඟ, අව්ව, සර්ප ස්පර්ශයෙනුත් වෙනස් වෙයි. මහණෙනි, වෙනස් වෙනුයි රූපය කියනු ලැබේ.

මහණෙනි, වේදනාව කියන්නේ කුමක් නිසා ද? මහණෙනි, විඳින නිසා වේදනායයි කියනු ලැබේ. කුමක් විඳී ද? සැපය විඳී. දුක විඳී. උපේක්ෂාව විඳී. මහණෙනි, මෙසේ විඳිනුයි වේදනාය යි කියනු ලැබේ.

මහණෙනි, සංඥාව යනු කුමක් ද? මහණෙනි, හඳුනා ගනිනුයි සංඥාවයි. එයින් සංඥායි කියනු ලැබේ. නිල හඳුනයි. කහ හඳුනයි. රතු හඳුනයි. සුදු හඳුනයි. මහණෙනි, මෙසේ හඳුනන හෙයින් සංඥායි කියනු ලැබේ.

මහණෙනි, සංස්කාර කියන්නේ කුමක් නිසා ද? මහණෙනි, හේතු ප්‍රත්‍යයෙන් උපන් දේ පිළියෙළ කෙරේනුයි සංස්කාරයි. කවර හේතු ප්‍රත්‍යයෙන් උපන් දේ පිළියෙළ කෙරේ ද? රූපය රූපය පිණිස පිළියෙළ කෙරේ. වේදනාව... සංඥාව... වේදනාව.. සංඥාව පිණිස පිළියෙළ කෙරේ. මහණෙනි, සංඛතය පිළියෙළ කෙරේනුයි සංස්කාරයි.

මහණෙනි, විඤ්ඤාය කියන්නේ කුමක් නිසා ද? මහණෙනි, විජානනය කෙරේනුයි විඤ්ඤායි කියනු ලැබේ. කුමක් දැනගනී ද?

ඇඹුලත් දැන ගනී. කටුක රසත් දැන ගනී. මිහිරි රසත් දැන ගනී, කර රසත් දැන ගනී. නොකර රසක් දැන ගනී. ලුණු රසත් දැන ගනී. විජානනය කෙරේනුයි මහණෙනි, විඤ්ඤානයයි කියනු ලැබේ.

මහණෙනි, උගත් ආර්ය ශ්‍රාවකයා මෙසේ නුවණින් විමසා බලයි. මම දැන් රූපය... විඤ්ඤය නිසා පීඩා ලබමි. මම අතීතයෙහිත් මෙසේ රූපය... විඤ්ඤය නිසා යම් සේ දැන් වර්තමානයෙහි පීඩා ලබමි ද එසේ මම ම අනාගත රූප... විඤ්ඤවල යකුටු වන්නෙමි නම් පීඩා ලබන්නෙමි. ඔහු මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට අතීත රූප... විඤ්ඤායෙහි බලාපොරොත්තු රහිත වෙයි. අනාගත රූප... විඤ්ඤ නොපතයි. වර්තමාන රූප... විඤ්ඤ පිළිබඳව කලකිරීම පිණිස, නොඇලීම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

මහණෙනි, කෙසේ සිතනන්නහු ද? රූපය... විඤ්ඤය නිත්‍ය ද? අනිත්‍ය ද? "ස්වාමීනි, අනිත්‍යයි." "යමක් අනිත්‍ය නම් දුක් ද? සැප ද?" "දුකයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන ස්වභාව ඇත්නම් එය මගේය, ඒ මම වෙමි, ඒ මගේ ආත්මය යි දැකීමට යෝග්‍ය ද? "එසේ නොවෙයි ස්වාමීනි,"

ඒ නිසා මහණෙනි, අතීත, අනාගත, වර්තමාන, අභ්‍යන්තර, බාහිර, රළු-සියුම්, හීන-ප්‍රණීත, දුර- ළඟ යම් රූප... විඤ්ඤ ඇත්ද ඒ සියලු රූප... විඤ්ඤ ඒ මගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මගේ ආත්මය නොවෙයි. මෙය මෙසේ ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක්ක යුතුය.

මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකයා ඉවත් කරයි. රැස් නොකරයි. දුරු කරයි. නොගනී. විසිරුවා දමයි. කැටි නොකරයි. නිවයි. නොදල්වයි. කියනු ලැබේ. කුමක් ඉවත් කරයි ද? රැස් නොකරයිද? රූප....විඤ්ඤ ඉවත් කරයි. රැස් නොකරයි. කුමක් දුරු කරයි ද? කුමක් නොගනීද? රූප... විඤ්ඤ දුරු කරයි. නොගනී. කුමක් විසුරුවයි ද? කැටි නොකරයි ද? රූප... විඤ්ඤ විසිරුවයි කැටි නොකරයි. කුමක් නිවයි ද? නොදල්වයි ද? රූප... විඤ්ඤ නිවයි. නොදල්වයි.

මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත්... විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරි නො ඇලෙයි. නො ඇලී මිදෙයි. මිදුණේ මිදුණෙමියි දනී. රහත් බව සඳහා අනිකක් නැකැයි තුවණින් දනී. මහණෙනි, මේ භික්ෂු නම රැස් නො කරයි. විනාශ නො කරයි. විනාශ කළේ වෙයි. නො හරී. නො ගනී. හැර දැමුයේ වෙයි. නො විසිරුවයි. රැස් නො කරයි. විසිරුවා සිටියේ වෙයි. නො නිවයි. නො දල්වයි. නිවා සිටීයයි කියනු ලැබේ.

කුමක් රැස් නො කරයි ද? විනාශ නො කරයි ද? විනාශ කළේ වෙයිද? රූපය... විඤ්ඤාය රැස් නො කරයි. විනාශ කොට සිටියෙ වෙයි.

කුමක් නො හරී ද? නො ගනී ද? හැර දැමුයේ ද? රූපය... විඤ්ඤාය නො හරී. නො ගනී. හැර දැමුයේ වෙයි.

කුමක් නො විසිරුවයි ද? රැස් නො කරයි ද? විසිර වූයේ වෙයි ද? රූපය... විඤ්ඤාය නො විසුරුවයි. රැස් නො කරයි. විසිර වූයේ වෙයි.

කුමක් නො නිවයි ද? නො දල්වයි ද? නිවා සිටියේ වෙයි ද? රූපය... විඤ්ඤාය නො නිවයි. නො දල්වයි. නිවා සිටියේ වෙයි.

මහණෙනි, මෙසේ විමුක්ත සිත් ඇති භික්ෂු නමට ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ප්‍රජාපති සහිත දෙවියෝ දුරින් ම නමස්කාර කරති.

යමක් සඳහා ධ්‍යාන කරන සේක් ද ඔබ ගේ ඒ අදහස් අපි නො දනිමු. පුරුෂෝත්තමයාණනි, ඔබට නමස්කාර වේවා. පුරුෂශ්‍රේෂ්ඨයාණනි, ඔබට නමස්කාර වේවා.

8. පිණ්ඩෝල්‍ය සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කපිලවස්තු නුවර නිග්‍රොධාරාමයෙහි වසන සේක. ඉක්බිති භාග්‍යවතුන්

වහන්සේ කිසි යම් කරුණකින් භික්ෂු සංඝයා බැහැර කොට පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන කපිලවස්තුවට පිඬු පිණිස වැඩියහ. කපිලවස්තුවෙහි පිඬු සිහා පිණ්ඩපාතයෙන් වැළක පස්වරු දිවා විහාරය සඳහා මහාවනයට වැඩියහ. මහවනයට වැඩ දිවා විහාරය පිණිස නාඹුල් බෙලිගසක් මූල වැඩ සිටි සේක.

ඉක්බිති තනිව විවේකීව වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් ඇති විය. මම භික්ෂු සංඝයා බැහැර කළෙමි. මෙහි නවක, මහණව නො බෝකල් ඇති සසුනට අලුතින් පැමිණි භික්ෂූහු සිටිති. මා නො දක්නා ඔවුන්ට සිත් පෙරලීමක් වෙනස් වීමක් වෙයිද? යම් සේ වතුර නො මැති ළපටි පැලෑටි පෙරළීමට වෙනස් වීමට පත් වෙයි ද? එමෙන් මේ සසුනෙහි නවක, අලුත මහණ වූ සසුනට ළහදි පැමිණි භික්ෂූහු වෙති. ඔවුන්ට මා නො දැක සිත් පෙරළීමක් වෙනස් වීමක් වෙයි. යම් සේ මම භික්ෂූන්ට ඉස්සර අනුකම්පා කළෙමි ද ඒ විදියට ම දැනුත් භික්ෂූන්ට අනුකම්පා කිරීම මැනවි."

එවිට සහම්පති මහාබ්‍රහ්මයා තම සිතින් භාග්‍යවතුන් වහන්සේ ගේ අදහස දැන යම් සේ බලවත් පුරුෂයෙක් වක් කළ අතක් දික් කරන්නේ ද, දික් කළ අතක් වක් කරන්නේ ද එසේ බඹලොවින් අතරුදහන්ව භාග්‍යවතුන් වහනසේ ඉදිරියෙහි පෙනී සිටියේ ය. ඉක්බිති සහම්පති බ්‍රහ්මයා උතුරු සළුව එකාංශ කොට භාග්‍යවතුන් වහන්සේට ඇදිලි බැඳ "භාග්‍යවතුන් වහන්ස, එය එසේම යි. සුගතයන් වහන්ස, එය එසේම යි, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂුසංඝයා නෙරපනා ලදහ. මේ සසුනෙහි නවක... භාග්‍යවතුන් වහන්සේ දක්නට නැතිව උන්වහන්සේලා ගේ සිත් පෙරළෙයි. වෙනස් වෙයි." සැලකළේය.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට අවවාද කරන සේක්වා. යම් සේ භාග්‍යවතුන් වහන්සේ පෙර භික්ෂුසංඝයාට අනුකම්පා කළ සේක් ද එසේ දැනුත් භික්ෂු සංඝයාට අනුකම්පා කරනු මැනවි. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවෙන් පිළිගත් සේක.

ඉක්බිති යහම්පති බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ ගේ ඉවසීම දැන භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමකින් නැගිට නිග්‍රොධාරාමයට වැඩියහ. වැඩ පැන වූ අසුනෙහි වැඩ හුන්හ. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ යම් සේ ඒ භික්ෂූහු තම දෙතම බැගින් භය පක්ෂපාතව භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණෙක් ද එබඳු සෘද්ධියක් කළ සේක.

ඒ භික්ෂූහු ද නම දෙනම භය පක්ෂපාත ඇතිව භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. පැමිණ සකසා වැඳ පසෙක හුන්හ. පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ජීවිකා අතුරෙන් මේ ජීවිකාව ළාමකයි. ඒ මේ පිඬු සිහිමයි. පාත්‍රයක් අතින් ගෙන පිඬුසිහා යන මෙය ලෝකයේ ශාපයකි. මහණෙනි, වැඩ කැමැති කුලපුත්‍රයෝ වැඩ පිණිස මෙසේ ඒ පිඬු සිගිමටත් පැමිණෙති. රජ අණ කඩා සිරගෙයින් පැන ආවෝ නො වෙති, සොර බියෙන් ආවෝත් නො වෙති. ණය නිසාත් නො වෙති, බිය නිසාත් නො වෙති, ජීවත් විය නො හැකි වූවොත් නො වෙති, එහෙත් ජාතියෙනුත් ජරාවෙනුත් මරණයෙනුත් ශෝකයෙනුත් වැලපීමෙනුත් දුකෙනුත් දෙමනසිනුත් උපායාසයෙනුත් දුකෙහි බැසගත්තෙමු. දුකින් පීඩිතවූවෝ වෙමු. මේ මුළු මහත් දුක් ගොඩේ කෙළවර කිරීමක් ඇත් නම් හොඳය යි පැවිදි වූවෝ ය.

මහණෙනි, මෙසේ පැවිදි වූ මේ කුලපුත්‍රයා දැඩි ලෝභියෙක් කාමයෙහි දඩි රාග ඇත්තෙක්, කිපුණු සිත් අත්තෙක්, දූෂිත අදහස් ඇත්තෙක්, මුළා සිහි ඇත්තෙක්, හොඳ නුවණ නැත්තෙක්, නො තැන්පත් වූ වෙක්, කැලඹුණු සිත් ඇත්තෙක්, ප්‍රකෘති ඉන්ද්‍රිය ඇත්තෙක් වෙයි ද, මහණෙනි, මේ පුද්ගලයා දෙපස ගිනිගත් මැද අශුචි තැවරුණු සොහොන් පෙනහල්ලක් ගම් දර පිණියත් කැලෑවේ දර පිණියත් තුපුදුසු වන්නේ යම් සේ ද එවන් උපමා ඇත්තෙකැයි කියමි. ගිහි යැපතුන් පිරිහුණේය. ශ්‍රමණාර්ථයන් නො පුරයි.

මහණෙනි, මේ අකුසල විතර්ක තුනකි. කාම විතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කයයි. මහණෙනි, ඒ අකුශල විතර්ක තුන යහමූලින් නැසෙන්නේ කොහි ද? සතර සතිපට්ඨානයෙහි මනාව සිහිටි සිත් ඇතිව වසන්නාට හෝ විදර්ශනා භාවනාව වඩන්නාටයි.

මහණෙනි, විදර්ශනා සමාධිය වැඩීමට සුදුසු ම යි. මහණෙනි, විදර්ශනා සමාධිය වඩන ලද්දේ බහුලව කරන ලද්දේ මහත්ඵලයි. මහානිශංසයි.

මහණෙනි, භවදිට්ඨි, විභවදිට්ඨි යනුවෙන් දෘෂ්ටි දෙකකි. එහි ලා මහණෙනි, උගත් ආර්ය ශ්‍රාවකයා යමක් මම දැඩිව අල්වා ගන්නේ නිර්දොෂියෙක් වෙමි දැයි එබඳු දෙයක් ලොව ඇත් දැයි මෙසේ සලකයි. මම යමක් දැඩිව අල්වා ගැනීමෙන් නිර්දෝෂියෙක් වෙමි නම් එබන්දක් ලොව නැතියි නුවණින් මනා දැන ගනී. මමත් දැඩිව ගන්නෙමි නම් රූපය ම ගනිමි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ම ගනිමි. ඒ මට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාති ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස හට ගනී. මෙසේ මුළු මහත් දුක් රැසේ හට ගැනීම වෙයි.

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන ස්වභාව ඇත්නම් එය මා ගේය, ඒ මම වෙමි. ඒ මාගේ ආත්මයයි දැකීමට සුදුසු ද? ස්වාමීනි, සුදුසු නො වෙයි. එබැවින් මහණෙනි, අතීත-අනාගත-වර්තමාන සියලුම රූප... විඤ්ඤාණ මගේ නො වෙයි. මෙය මෙසේ ඇති සිටියෙන් මනා නුවණින් දැක්ක යුතුය. මහණෙනි, මෙසේ දකින උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරෙයි. මිදෙයි... මිදුණෙමියි දනී. රහත්බව සඳහා අනිකක් නැතැයි දනී.

9. පාරිලෙය්‍යක සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ

පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන පිඬු පිණිස කොසැඹෑ නුවරට පිවිසියහ. පිඬුපිණිස හැසිර පස්වරු පිණ්ඩපාතයෙන් ආපසු වැඩ තමන්වහන්සේ ම සේනාසනය අහුරා පා සිවුරු ගෙන උපස්ථායකයන්ට කථා නො කොට භික්ෂූන් ගැන නො බලා තනිව දෙවැන්නෙකු නැතිව වාරිකාවෙහි වැඩි සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි ටික වේලාවකින් එක්තරා භික්ෂු නමක් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වෙත පැමිණ "ආයුෂ්මත් ආනන්ද, එන්න, භාග්‍යවතුන් වහන්සේ යම් දක කමත් ම සෙනසුන අහුරා පාසිවුරු ගෙන උපස්ථායකයන්ට කථා නො කොට භික්ෂු සංඝයා ගැන නො බලා තනිව ම දෙවැන්නෙකු නැතිව වාරිකාවෙහි වඩින සේක් නම් එකල උන්වහන්සේ තනිව ම වසනු කැමැති සේක. ඒ වේලාවට කවුරුවත් භාග්‍යවතුන් වහන්සේ ළඟුබැදිය යුතු නො වේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් වාරිකාවෙහි වඩින සේක් පාරිලෙය්‍යක වනයට පිවිසියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පාරලි වනයෙහි භද්‍රසල්ගසක් මුල වසන සේක. එවිට බොහෝ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද, බොහොම දවසකින් අපි භාග්‍යවතුන් වහන්සේගෙන් බණක් අසන්නට කැමැත්තෙමුයි කීහ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන් සමග පාරලි වනයෙහි භද්‍රසාලමූලයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හුන්හ. පසෙක හුන් ඒ භික්ෂූන්ට වහන්සේ දැහැමි කථාවකින් කරුණු දැක්වූහ. සමාදන් කරවූ සේක. තෙද ගැන්වූ සේක. සතුටු කරවූ සේක.

එකල එක්තරා භික්ෂු නමකට "කොහොම දක්නා කොහොම දක්නා භික්ෂුවට මහනුවණට අනතුරුව කෙලෙස් නැසේ ද යන අදහස ඇති විය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂු තම ගේ අදහස සිතින් දැන භික්ෂූන් අමතා "මහණෙනි, මවිසින් පිරිසිඳ දැන ධර්මය දෙසන ලදී. පිරිසිඳ දැන, සතර සතිපට්ඨානය, සම්‍යක්ප්‍රධාන් සතර,

ඍද්ධිපාද සතර, පංචඉන්ද්‍රිය, පංචබල, බොජ්ඣාඞ්ග සත, ආර්ය අෂ්ටාංගික මාර්ගය දේශනා කරන ලදී. මෙසේ පිරිසිඳ දැන ධර්මය දෙසන ලදී. මහණෙනි, මවිසින් එසේ පිරිසිඳ දැන දහම් දෙසන්දීත් මෙහි සමහර භික්ෂු නමකට කෙසේ දන්නා කෙසේ දක්නා භික්ෂුවට මහනුවණට අනතුරුව කෙලෙස් නැසේදැ"යි චිත්ත විතර්කයක් උපණ.

මහණෙනි, කෙසේ දන්නා කෙසේ දක්නාහට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි ද? මහණෙනි, මෙහි ආර්යයන් නො දක්නා නුගත් පෘථග්ජනයා රූපය තමන් ගේ කොට දකී. මහණෙනි, යම් ඒ දැකීමක් වෙයි ද එය සංඛාරයකි. එම සංඛාරය කුමක් නිදන කොට කුමක් හේතු කොට, කුමක් ප්‍රභව කොට පවතී ද? මහණෙනි, අවිද්‍යා ස්පර්ශයෙන් උපන් වේදනාවෙන් ස්පර්ශය ලැබූ නුගත් පෘථග්ජනයාට උපන් තණ්හාවෙනි. ඒ සංඛාරය හටගන්නේ එයිනි. මහණෙනි, මෙසේ ඒ සංඛාරත් අනිත්‍යයි. සංඛතයි. ප්‍රත්‍යයෙන් උපන්නේ යි. ඒ තණ්හාවත් අනිත්‍යයි. සංඛතයි. ප්‍රත්‍යයෙන් උපන්නේයි ඒ වේදනාවත් අනිත්‍යයි. සංඛතයි. ප්‍රත්‍යයෙන් උපන්නේය. ඒ අවිද්‍යාවත් අනිත්‍යයි. සංඛතයි. ප්‍රත්‍යයෙන් උපන්නේය. මහණෙනි, මෙසේ දක්නා, මෙසේ දන්නා භික්ෂු නමට අනතුරුව කෙලෙසුන් නැසේ.

රූපය ආත්මයයි නො දුටුවත් ආත්මය රූපවත් කොට දකී. මහණෙනි, යම් ඒ දැකීමක් වෙයි ද එයත් සංඛාරයි. ඒ සංස්කාරය එයින් උපන්නේය. මහණෙනි, මෙසේ මේ සංස්කාරයත් අනිත්‍යය, ඒ අවිද්‍යාවත් අනිත්‍යය. මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි.

රූපය ආත්මයයි නො දුටුවත්, ආත්මය රූපවත් කොට නො දුටුවත් ආත්මයෙහි ලා දකී. මහණෙනි, මේ සමානුපස්සනාව සංස්කාරයි. මහණෙනි, මේ සංස්කාර අනිත්‍යයි ඒ අවිද්‍යාවත් අනිත්‍යයි. මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි.

රූපය ආත්මයයි නො දුටුවත්, ආත්මය රූපවත් කොට නො දුටුවත්, ආත්මයෙහි ලා රූපය නො දුටුවත්, ආත්මය රූපයෙහි ලා නො දුටුවත් වේදනා... විඤ්ඤාණවත් කොට දකී. ආත්මයෙහි ලා වේදනා... විඤ්ඤාන දකී. ආත්මය වේදනා... විඤ්ඤාණයෙහි ලා දකී. මහණෙනි, මේ සමනුපස්සනාව සංස්කාරයි. මේ සංස්කාර අනිත්‍යයි. ඒ අවිද්‍යාවත් අනිත්‍යයි. මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි

මහණෙනි, රූප... විඤ්ඤාන ආත්මය යි නො දුටුවත් රූප... විඤ්ඤාන ආත්මයෙහි ලා නො දුටුවත් " ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම පරලොව වන්නෙමි නිත්‍යයි. ඒකාන්තයි. සදකාලිකයි නො වෙනස්වන සුලුයි කියා මෙබඳු දෘෂ්ටි ඇති වෙයි. මහණෙනි, යම් ශාස්වතදෘෂ්ටියක් ඇත්ද ඒ සංස්කාරයි. මේ සංස්කාර අනිත්‍යයි. මහණෙනි, මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි.

මහණෙනි, රූප... විඤ්ඤාන ආත්ම වශයෙන් නො දුටුවත්.... නොවෙනස්වනසුලුයි. කියා මෙබඳු දෘෂ්ටි ඇති නුනත් ඉදින් මම නොවන්නෙමි නම් මාගේ දෙයක් නො වන්නේ ය. ඉදින් මම පරලොව නො වන්නෙමි නම් පරලොවත් මාගේ දෙයක් නො වන්නේයයි මෙබඳු දෘෂ්ටි ඇති වෙයි. මහණෙනි, මේ උච්ඡේද දෘෂ්ටියක් ඇත් ද එයත් සංස්කාරයි. මේ සංස්කාර අනිත්‍යයි. මහණෙනි, මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයම අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි.

රූපය ආත්ම වශයෙන් නො දුටුවත් පරලොවත් මගේ දෙයක් නො වන්නේය යි මෙබඳු දෘෂ්ටි නුනත්, සැක ඇත්තේ වේ. විචිකිච්ඡා ඇත්තේ වෙයි. ධර්මයෙහි නිෂ්ටාවට නො පැමිණියේ වෙයි. මහණෙනි, එය සංස්කාරයකි. මේ සංස්කාර අනිත්‍යයි. මහණෙනි, මෙසේ දන්නා මෙසේ දක්නා භික්ෂු නමට මාර්ගයට අනතුරුව ආස්‍රව ක්ෂය වෙයි.

10. පුණ්ණමා සූත්‍රය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාම මිගාරමාතෘ ප්‍රාසාදයෙහි මහත් භික්ෂු සංඝයා වහන්සේ සමග වැඩ වසති. එකල භාග්‍යවතුන් වහන්සේ එදින පුර පසළොස්වක් පොහෝ දිනයෙහි පිරුණු සඳ යුත් රාත්‍රියෙහි භික්ෂු සංඝයා වහන්සේ පිරිවරා ගෙන එළිමහනෙහි වැඩහුන් සේක. එකල භික්ෂු නමක් හුනස්නෙන් නැගිට උතුරුසළුව ඒකාංශ කොට භාග්‍යවතුන් වහන්සේට ඇදිලි බැඳ "ස්වාමීනි, මට භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසීමට අවසර ලැබෙන සේක් නම් කිසි යම් කරුණක් අසන්නෙමියි සැලකළේය.

භික්ෂු නම, එහෙනම් තමන් ගේ ආසනයෙහි වාඩි වී කැමැති දෙයක් අසන්න. ඒ භික්ෂු නම "එසේය ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී තම අසුනෙහි වාඩිවී "ස්වාමීනි, මේ උපාදන ස්කන්ධ පහ ද? එනම් රූප උපාදනස්කන්ධය... විඤ්ඤාන උපාදන ස්කන්ධයයි. සැලකළේය. භික්ෂු නම, මේ උපාදන ස්කන්ධ පහයි. එනම් රූප... විඤ්ඤාන උපාදන ස්කන්ධයයි.

ඒ භික්ෂු නම ස්වාමීනි, සාධුයි භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව පිළිගෙන අනුමෝදන්ව තවත් ප්‍රශ්නයක් ඇසුවේ ය. ස්වාමීනි, මේ උපාදන ස්කන්ධ පහ කුමක් මුල් කොට ඇත්තේ ද? "භික්ෂු නම, මේ උපාදන ස්කන්ධ පහ ඡන්දය මුල් කොට පවතී. "ස්වාමීනි, මැනැවැ "යි තවත් ප්‍රශ්නයක් ඇසීය. "ස්වාමීනි. පංච උපාදන ස්කන්ධය ම උපාදන වෙයි ද? එහෙම නැත් නම් උපාදන ස්කන්ධවලින් අනිකක් උපාදන වෙයි ද? නැහැ භික්ෂු නම, ඒ පංච උපාදන ස්කන්ධය ම උපාදන නො වෙයි. උපාදන ස්කන්ධවලින් අනෙක් උපාදන නො වෙයි. එහෙත් ඒ උපාදන ස්කන්ධවල යම් ඡන්දරාගයක් වෙයි නම් එයම උපාදනයයි.

ඒ භික්ෂු නම "මැනව ස්වාමීනි" යි පිළිගෙන තවත් ප්‍රශ්නයක් ඇසීය. ස්වාමීනි, පංච උපාදන ස්කන්ධවල ඇතිවන ඡන්දරාගයේ වෙනසක් වන්නේ ද? එසේය භික්ෂු නම මෙහි සමහරෙකුට මෙසේ

සිතෙයි. අනාගතයෙහි රූප ඇත්තෙක් වේමිවා මෙබඳු වේදනා සංඥා සංස්කාර, විඥාන ඇත්තෙක් වේමිවා යි මෙසේ පංච ස්කන්ධයෙහි ඡන්දරාගය වෙනස් බවක් වෙයි" වදළහ. ඒ භික්ෂූ නම මැනැවැයි පිළිගෙන තවත් ප්‍රශ්නයක් ඇසීය. ස්වාමීනි, කොමණකින් ස්කන්ධයයි ව්‍යවහාර කරන්න ලැබේ ද?"

භික්ෂූ නම, යම් කිසි අතීත අනාගත වර්තමාන රූප... විඥානයක් වෙයි ද? මේ රූප... විඥාන ස්කන්ධයයි කියන්න ලැබේ. "ස්වාමීනි, මැනැවැයි පිළිගෙන ඒ භික්ෂූ නම මත්තෙහි තවත් ප්‍රශ්නයක් ඇසීය. "ස්වාමීනි, රූපස්කන්ධය... විඥානස්කන්ධය පැනවීමට හේතු කුමක් ද? ප්‍රත්‍ය කුමක් ද? "භික්ෂූ නම, රූප ස්කන්ධ පැනවීමට සතර මහාභූත හේතු ප්‍රත්‍යයි. වේදනා ස්කන්ධය පැනවීමට ස්පර්ශය හේතුය. ස්පර්ශය ප්‍රත්‍යයි. සංඥා ස්කන්ධය පැනවීමට ස්පර්ශය හේතුය. ස්පර්ශය ප්‍රත්‍යයි. සංස්කාර ස්කන්ධය පැනවීමට ස්පර්ශය හේතුය ස්පර්ශය ප්‍රත්‍යයි. විඥාන ස්කන්ධය පැනවීමට නාමරූප හේතුය. නාමරූප ප්‍රත්‍යයි.

ස්වාමීනි, සාධුයි පිළිගෙන ඒ භික්ෂූ නම තවත් ප්‍රශ්නයක් ඇසුවේ ය. ස්වාමීනි, දෘෂ්ටිය ඇතිවන්නේ කෙසේ ද? භික්ෂූ නම මෙහි ආර්යයන් නොදක්නා නුගත් පෘථග්ජනයා රූපය ආත්මය වශයෙන් දකී. ආත්මය රූපවත් කොට දකී. වේදනා... විඥාන ආත්මය වශයෙන් දකී. භික්ෂූ නම මෙසේ සක්කාය දෘෂ්ටිය ඇති වෙයි.

"මැනව ස්වාමීනි,"යි ඒ භික්ෂූ නම තවත් ප්‍රශ්නයක් ඇසුවේ ය. "ස්වාමීනි, සක්කාය දෘෂ්ටිය ඇති නොවන්නේ කෙසේ ද? භික්ෂූ නම, මෙහි ආර්යයන් දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපය ආත්මය යි නොදකී. වේදනා... විඥාන ආත්මයයි නොදකී. මෙසේ සක්කාය දෘෂ්ටිය නූපදී. මැනවි ස්වාමීනියි පිළිගෙන ඒ භික්ෂූ නම තවත් ප්‍රශ්නයක් ඇසී ය. ස්වාමීනි, රූප... විඥානයෙහි ආස්වාදය කුමක් ද? ආදීනව කුමක් ද? නිස්සරණය කුමක්දැයි විවාළේය. භික්ෂූ නම, රූප... විඥාන නිසා යම් සුවයක් සොම්නසක් ඇත් නම් එය ආස්වාදය යි. යම් රූපයක්... විඥානයක්... අනිත්‍ය ද දුක් ද? වෙනස් වන ස්වභාව ඇත් ද එය ආදීනවයි. රූප... විඥානයෙහි යම් ඡන්දරාග දුරු කිරීමක් ඇද්ද මෙය නිස්සරණයි.

ස්වාමීනි, මැනැවැයි පිළිගෙන ඒ භික්ෂූ නම තවත් ප්‍රශ්නයක් ඇසීය. ස්වාමීනි, කෙසේ දන්නා, කෙසේ දක්නාහුට මේ විඤ්ඤාණ සහිත කයෙහිත් බාහිර සියලු නිමිත්තවලත් අහංකාර මමංකාර මානානුසය නොවෙයි ද?

භික්ෂූ නම, අතීත - අනාගත - වර්තමාන යම් රූපයකුත් වේ ද යම් කිසි වේදනාවක්, සංඥාවක්, සංස්කාරයක්, විඥානයක්, වේ ද. ඒ සියලු රූප.... විඥාන එය මා ගේ නොවෙයි. ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙතැයි මෙසේ මෙය ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී. මෙසේ දන්නා මෙසේ දක්නාහුට අහංකාර මමංකාර මානානුසය ඇති නොවෙයි.

එකල එක්තරා භික්ෂූ නමකට "පින්වතුනි, මේ භැටියට මේ රූපය... විඥානය අනාත්මලු අනාත්මකව කළ කර්ම ආත්මය ස්පර්ශ කරන්නේ කොහොමදැ" යි මෙබඳු අදහසක් ඇති විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූ නම ගේ අදහස සිතින් පිරිසිඳ දැන භික්ෂූන් ඇමතූහ. "මහණෙනි, මේ සසුනෙහි සමහර හිස් පුද්ගලයෙක් අඥානව අවිද්‍යාවෙන් යුක්තව තණ්හාවෙන් මැඩුණු සිතින් "පින්වතුනි, මෙසේ රූපය... විඥානය අනිත්‍ය නම්... අනාත්මව කළ කර්ම තමා වෙත එන්නේ කෙසේදැයි ශාස්තෘ ශාසනය ඉක්ම විය යුතුය යි හඟී නම් ඊට කරුණු ඇත්තේ ය.

මහණෙනි, මා විසින් නුඹලා මාගේ ඒ ඒ ධර්මයෙහි විමසන ලදුව හික්මවන ලද්දාහුය. මහණෙනි, කුමක් සිතත්තහු ද? රූපය... විඥානය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන ස්වභාව ඇත් නම් එය මා ගේය... ආත්මයයි දැකීම සුදුසු ද? සුදුසු නොවෙයි ස්වාමීනි,

මහණෙනි, එබැවින් අතීත අනාගත වර්තමාන රූප... විඥාන ඒ මගේ නොවෙයි ඒ මම නොවෙමි. ඒ මාගේ ආත්මය නොවෙයි. මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක්ක යුතුය. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත්... විඥානයෙහිත් කලකිරෙයි රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

4. ථෙර වර්ගය

1. ආනන්ද සූත්‍රය

එසමයෙහි ආයුෂ්මත් අනඳ තෙරුන් වහන්සේ සැවැත ජේතවන අනාථපින්ඩිකාරාමයෙහි වසති. එහි දී අනඳ තෙරුන් වහන්සේ භික්ෂූන් අමතා "ඇවැත්නි, ආයුෂ්මත් පූණණ මනතානිපුත්‍ත තෙරුන් වහන්සේ නවකයන් වූ අපට බෝහෝ උපකාරී සේක. උන්වහන්සේ අපට මේ අවවාදයෙන් අවවාද කරති. ඇවැත් ආනන්ද, තදින් අල්ලා ගැනීම නිසා "වෙමි"යි ඇති වෙයි. නො ගැනීම නිසා නො වෙයි. කුමක් තදින් අල්ලා ගැනීමෙන් "වෙමි" යි ඇති වෙයි ද? නො ගැනීමෙන් නො වෙයි ද? රූපය... විඤ්ඤානය තදින් අල්ලා ගැනීමෙන් ඇති වෙයි. නො ගැනීමෙන් නො වෙයි.

ආයුෂ්මත් ආනන්ද, කුමක් සිතන්නෙහි ද? රූපය නිත්‍ය ද? අනිත්‍ය ද? ඇවැත්නි, යමක් අනිත්‍ය නම් එය දුක් ද? සැප ද? ඇවැත්නි, දුකයි. යමක් අනිත්‍ය නම්, දුක් නම් පෙරළෙන ස්වභාව ඇත් නම් එය මගේ ය. මම වෙමි. එය මාගේ ආත්මය යි දැකීමට සුදුසු ද? ඇවැත්නි, සුදුසු නො වේ. වෙදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාන නිත්‍ය ද?... එය මගේ ආත්මයයි දැකීමට සුදුසු ද? ඇවැත්නි, සුදුසු නො වේ.

එබැවින් ආනන්ද, මෙහිලා අතීත, අනාගත, වර්තමාන යම් රූපයක්... විඤ්ඤානයක් වෙයි ද එය මගේ නො වෙයි. මම නො වෙමි. මගේ ආත්මය නො වෙ යි මෙය මෙසේ ඇති සැටියෙන්.. දැක්ක යුතුය.. මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤානයෙහි කලකිරෙයි... රහත්බව සඳහා අනිකක් නැතැයි දනී."

ඇවැත්නි, පූණණ මනතානිපුත්‍ත තෙරුන් වහන්සේ නවක වූ අපට බොහෝ උපකාර වෙති. උන්වහන්සේ මේ අවවාදයෙන් අපට අවවාද දෙති. පූණණ තෙරුන් ගේ මේ බණ අසා මම දහම් අවබෝධ කළෙමි යි වදළහ.

2. තිසස සූත්‍රය

එකල භාග්‍යවතුන් වහන්සේ ගේ නැන්දණිය පුත් තිසස තෙරුන් වහනසේ බොහෝ භික්ෂූන්ට මෙසේ කියති. ඇවැත්නි, මගේ ඇහත් බරක් වගෙයි. දිසාවතුත් නො පෙනෙයි. මට ධර්මය වැටහෙත්තේත් නැහැ. ථීනමිද්ධයත් මගේ සිත මැඩ ගෙන තිබෙයි. ඇල්මක් නැතිව ම මහණකම කරමි. ධර්මය ගැන මට සැකත් තිබේ.

එවිට බොහෝ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ " ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ගේ නැන්දණිය පුත් ආයුෂ්මත් තිසස බොහෝ භික්ෂූන්ට මෙසේ කියයි.. මෙය සැලකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ එක් භික්ෂු නමක් අමතා "භික්ෂුනම, එන්න, මගේ වචනයෙන් තිස්සට අවැත්නි, ඔබට ශාස්තෘන් වහනසේ අමතන සේකැයි කියන්න" ස්වාමීනි, එහෙමයි කියා පිළිතුරු දුන් ඒ භික්ෂු නම... ඇවැත්නි, ඔබට ශාස්තෘන් වහන්සේ අමතන සේකැයි කිය. ඇවැත්නි, එසේ ය යි පිළිතුරු දුන් ආයුෂ්මත් තිසස භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස්.. පසෙක හුන් ආයුෂ්මත් තිසසට භාග්‍යවතුන් වහන්සේ සැබෑද තිසස ඔබ බොහෝ භික්ෂූන්ට... මෙසේ කියන්නෙහිදැයි වදළහ. "ස්වාමීනි, එහෙමයි."

තිසස, කුමක් සිතන්නෙහි ද? රූපයෙහි පහ නො වූ රාග ඇති, පහ නො වූ ඡන්දය ඇති, පහ නො වූ ප්‍රේම ඇති, පහ නො වූ පිපාස ඇති, පහ නො වූ පරිදාහ ඇති, පහ නො වූ තණ්හාව ඇති පුද්ගලයාට එම රූපය වෙනස් වීම නිසා සොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස ඇති වෙයි ද? ස්වාමීනි, එසේය. තිසස, සාධු. සාධු. තිසස, රූපයෙහි පහ නො වූ රාග ඇත්තාට යම්සේ

වෙයිද එය එසේ ම ය. වෙදනා... සංඥාවෙහි පහ නො වූ රාග ඇති... යම් සේ වෙයි ද? එය එසේ ම වෙයි.

තිස්‍ස, කුමක් සිතන්නෙහි ද? රූපයෙහි... විඤ්ඤාණයෙහි පහ වූ රාග ඇති, පහ වූ ඡන්දය ඇති පහ වූ ප්‍රෙම ඇති පහ වූ පිපාස ඇති පහ වූ පරිදහ ඇති පහවූ තණ්හා ඇති පුද්ගලයාට එම රූපය වෙනස්වීම නිසා සොක... උපායාස ඇති වෙයි ද? ස්වාමීනි, නො වෙයි. සාධු. සාධු. තිස්ස රූපයෙහි... විඤ්ඤාණයෙහි පහ වූ රාග ඇත්තාට යම් සේ වෙයි ද? එය එ සේ වෙයි.

තිස්‍ස, කුමක් සිතන්නෙහි ද? රූප... විඤ්ඤාන නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි. යමක් අනිත්‍ය නම් එය දුක් ද? සැප ද? දුකයි ස්වාමීනි. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ම ගේ ය. මම වෙමි. මගේ ආත්මය යි කියා දකිමට සුදුසු ද? ස්වාමීනි, සුදුසු නො වෙයි.

එබැවින් තිස්‍ස, මෙහි ලා අතීත අනාගත වර්තමාන.. යම් රූප... විඤ්ඤානයක් වෙයිද එය මගේ නො වෙයි.. මනා නුවණින් දක්ක යුතු යි. මෙසේ දක්නේ තිස්‍ස, මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

තිස්‍ස, මිනිස්සු දෙදෙනෙක් වෙති. එක් මිනිසෙක් පාර නො දනී. එක් මිනිසෙක් පාර දනී. ඔවුන්ගෙන් පාර නො දන්නා මිනිසා පාර දන්නා මිනිසාගෙන් පාර අසයි. ඔහු මෙසේ කියයි. පින්වත් පුරුෂය, මේකයි පාර. එයින් මොහොතක් යන්න. මොහොතක් ගොස් දෙමංහන්දියක් හමු වෙයි. එයින් වමේ පාර අත්හැර දකුණේ පාරෙන් මොහොතක් යන්න. මොහොතක් ගොස් ඝන වනාන්තරයක් හමු වෙයි. එහි ටිකක් යන්න. එයින් මොහොතක් ගියා ම වගුරු ප්‍රපාතයක් හමු වෙයි. එයින් ටිකක් යන්න. එයින් මොහොතක් ගියා ම හෙබක් හමු වෙයි එයින් ටිකක් යන්න. ටිකක් ගියා ම ලස්සණ භූමි භාගයක් හමු වෙයි.

තිස්‍ස, කරුණු වටහා දීමට මා විසින් උපමාවක් දක්වන

ලදි. එහි තේරුම මෙය යි. පාර නො දන්නා මිනිසා යනු පෘථග්ජනයාට නමකි. පාර දන්නා යනු තිස්‍ස, තථාගත අර්හත් සම්මා සම්බුදුරදුන්ට නමකි. දෙමං සංධිය යනු තිස්‍ස, විචිකිච්ඡාවට නමකි, වම් මග යනු ඒ අෂ්ටාංගික මිථ්‍යාමාර්ගයට නමකි. එනම් මිච්ඡා දිට්ඨි, මිච්ඡාසංකප්ප, මිච්ඡාවාචා, මිච්ඡාකම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡාවායාම, මිච්ඡාසති, මිච්ඡාසමාධි යනුයි. දකුණු මග යනු ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයට නමකි. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යනුයි. තිස්‍ස, ගන වන ළැහැබ යනු අවිද්‍යාවට නමකි. වගුරු ප්‍රපාතය යනු ඒ කාම වලට නමකි. හෙබ යනු ක්‍රෝධ උපායාස දෙකට නමකි. තිස්‍ස ලස්සණ භූමිභාගය යනු නිවනට නමකි.

තිස්‍ස, සිත් අලවන්න, තිස්‍ස. සිත් අලවන්න, මම අවවාදයෙන්, අනුකම්පාවෙන්, අනුශාසනයෙන් පිහිට වෙමියි භාග්‍යවතුන් වහන්සේ වදළහ. සතුටු සිත් ඇති ආයුෂ්මත් තිස්‍ස ස්ථවිරයන් වහන්සේ භාගයවතුන් වහන්සේ ගේ දෙශනාව පිළිගත්හ.

3. යමක සූත්‍රය

එකල ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්ස් සැවැත් නුවර ජෙතවනාරාමයෙහි වසන සේක. එසමයෙහි යමක භික්ෂු නමට රහතුන් වහන්සේ කය බිඳීමෙන් සිඳෙනි, වැනසෙනි, මරණින් මතු නො වෙති යි යම් සේ තථාගතයන් වහනසේ විසින් දහමක් දෙසන ලද්දේ ද එසේ මම දනිමි යි මෙවැනි පවිටු මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ ය. බොහෝ භික්ෂූන්ට "යමක භික්ෂුවට... ළාමක මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ ය යි අසන්නට ලැබුණේය. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක වෙත ගොස් පිළිසඳර කථා කොට පසෙක හිඳ "ආයුෂ්මත් යමක, ඔබට... ළාමක මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ ය" යනු සැබෑද යි කීහ. ඇවැත්නි, එසේය, මට.. මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේයයි කිය.

ආයුෂ්මත් යමක, මේහෙම කියන්ට එපා. භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් චොදනා නො කරව., භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් චොදනා කිරීම නුසුදුසු යි. රහතන් වහන්සේ කය බිඳීමෙන් මරණින් මතු නො වෙතැයි භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක. ඒ භික්ෂූන් මෙසේ කියද්දීත් ආයුෂ්මත් යමක "රහතුන් වහන්සේ.. මරණින් මතු නො වෙතැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදළ දහමක් මම දනිමි යන ළාමක මිථ්‍යාදෘෂ්ටිය දැඩිව ම පරාමර්ශ කොට පිවිස ගෙන ම කියයි.

ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක, එම දෘෂ්ටියෙන් මුදවා ගත නො හැකි වූයෙන් නුනස්නෙන් නැඟිට ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත එළඹ " ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්ස, ආයුෂ්මත් යමක භික්ෂුවට "රහතන් වහන්සේ... නො වෙතැයි ළාමක මිථ්‍යාදෘෂ්ටියෙක් උපන්නේ ය යි මෙය සැලකළහ. ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ අනුකම්පා පිණිස ආයුෂ්මත් යමක වෙත යන සේක් නම් මැනවි. ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ නිහඬව පිළිගත්හ.

ඉක්බිති සැරියුත් තෙරුන් වහන්සේ සවස පල සමවතින් නැඟිට ආයුෂ්මත් යමක වෙත වැඩ පිළිසඳර කථා නිමවා පසෙක වැඩ හිඳ "ඇවැත් යමක,... පවිටු මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ ය යනු සැබෑදැයි වදළහ. ඇවැක්නි, මෙසේ මම.. දනිමි.

ඇවැත් යමක, කුමක් සිතන්නෙහි ද ? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍ය යි ඇවැත්නි, යමක් අනිත්‍ය නම්.. මේ මාගේ ආත්මයයි පිළිගැනීම සුදුසු ද? සුදුසු නැත. එබැවින් යමක, යම් අතීත අනාගත වර්තමාන... රූපයක්... විඤ්ඤාණයක් ඇත් ද? මේ මගේ ආත්මය නො වෙයි... මනා නුවණින් දක්ක යුතුය. මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරෙයි... රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

ඇවැත් යමක, කුමක් සිතන්නෙහි ද? රූපය... විඤ්ඤාණය සත්වයා යි සිතන්නෙහි ද? ඇවැත්නි, නැත. යමක,

රූපයෙහි...විඤ්ඤාණයෙහි සත්වයා ය සිතන්නෙහි ද? ඇවැත්නි, නැත. යමක, රූපයෙන්... විඤ්ඤාණයෙන් බැහැර සත්වයා යි සිතන්නෙහි ද? ඇවැත්නි, නැත. ඇවැත් යමක, රූප... විඤ්ඤාන නො වූ ඒ මේ ධර්මය සත්වයා යි දක්නෙහි ද? ඇවැත්නි. එසේ නො වෙයි. ඇවැත් යමකය, මෙහි ලා ඉහාත්මයෙහි ම ඔබට සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් සත්වයකු නො ලැබෙද්දී "රහතන් වහන්සේ කය බිඳීමෙන්.. මරණින් මතු නො වෙයි කියා යම් සේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කළ බණක් මම දනිමියි යන ඔබ ගේ ඒ ප්‍රකාශය සුදුසු ද? ඇවැත් ශාරිපුත්‍රයන් වහන්ස, නුවණ මද මට පෙර මේ පවිටු දෘෂ්ටිය විය. ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ගේ මේ බණ අසා ඒ පවිටු දෘෂ්ටිය දුරු විය. මට ධර්මයත් අවබොධ විය.

ඇවැත් යමක, ඉදින් ඔබෙන් "යමක, ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ කය බිඳී මරණින් මතු කුමක් වේදයි මෙසේ ඇසුවොත් ඔබ කුමකැයි ප්‍රකාශ කරන්නෙහි ද? ඇවැත්නි, ඉදින් මගෙන් ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ... ඇසුවොත් මෙසේ ප්‍රකාශ කරමි. ඇවැත්නි, රූපය... විඤ්ඤානය අනිත්‍යයි. යමක් අනිත්‍යනම්.. නිරුද්ධ වෙයි. දස්තඩ්ගත වෙයි." කියා මම මෙසේ ප්‍රකාශ කරමි. යමක, සාධු සාධු. යමක, එහෙනම් මේ කරුණ ම වඩාත් අවබොධය පිණිස ඔබට උපමාවක් කියන්නෙමි.

ඇවැත් යමක, යම්සේ ආඪ්‍ය වූ මහත් ධන ඇති මහත් භෝග ඇති ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් වෙයි. මහු ආරක්ෂා සම්පන්නත් වෙයි. මහුට අවැඩ කැමති අහිතවත් ආරක්ෂාව නො කැමති දිවි නසනු කැමති කිසි යම් පුරුෂයෙක් උපදී. මහුට මෙසේ සිතෙයි." මේ ගෘහපති හෝ ගෘහපති පුත්‍ර ආඪ්‍ය යි. මහාධනවත් වෙයි. මහාභෝග ඇත්තේ යි. මහු ආරක්ෂා සම්පන්න ත් වෙයි. මැඩ පිවිතය නැසීමත් පහසු නැත. ඇතුළට පිවිස දිවි නසන්නේ නම් හොඳයි." මහු ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා වෙත ගොස් මෙසේ කියයි. "ස්වාමිනි, ඔබට උවටැන් කරමි." ඒ ගෘහපති හෝ ගෘහපති පුත්‍රයා උපස්ථාන කරවා ගනී. මහු උපස්ථාන කරයි.

පළමුව අවදි වෙයි. පසුව නිදයි. කිකරුව මනාව හැසිරෙමින් ප්‍රිය වචන ඇත්තේ වෙයි.

ඒ ගෘහපති හෝ ගෘහපතිපුත්‍රයා බහු මිත්‍රයකු වශයෙන් අදහයි. සහෘදයකු වශයෙන් අදහයි. බහු කෙරෙහි විශ්වාසයට පත් වෙයි. ඇවැත්නි, යම් දක බහුට "මේ ගෘහපති හෝ ගෘපතිපුත්‍රයා මා සමග ඉතා විශ්වාස වත්ය යි අදහස් වෙයි ද එකල බහු තනිව සිටිනු දැන තියුණු ආයුධයෙන් මරා දමයි. ආයුෂ්මත් යමක, කුමක් සිතන්නෙහි ද? යම් දක ඒ මිනිසා මේ ගෘහපති හෝ ගෘහපතිපුත්‍රයා ළඟට ගොස් සිටිමිනි. ඔබට උපස්ථාන කරමි යි මෙසේ කියේද එකල්හිත් බහු වධකයා ම ය. වධකයා ම වූ බහු මගේ වධකයා යි නො දත්තේ ය. යම් දක බහු පළමු නැගී සිට, පසුව නිදමින් කිකරුව මනාපව ප්‍රියවදන් ඇතිව උපස්ථාන කරයි ද එකල්හිත් බහු වධකයා මය. වධක වූ ම බහු මගේ වධකයා යි නො දත්තේ ය. යම් කලෙක බහු තනිව සිටිනු දක තියුණු ආයුධයෙන් මරා දමයි ද එකල්හිත් බහු වධකයා ම ය. වධක වූ ම බහු මගේ වධකයා යි නො දත්තේ ය. ඇවැත්නි, එසේය.

එමෙන් ආයුෂ්මතුනි, ආර්යයන් නො දක්නා .. නුගත් පෘථග්ජනයා රූපය... විඤ්ඤාණය රූප ආත්ම වශයෙන් හෝ... දකියි. අනිත්‍ය වූ රූපය... විඤ්ඤාණය අනිත්‍ය රූප... විඤ්ඤණය යි ඇති සැටියෙන් නො දකී. දුක් වූ, රූපය... විඤ්ඤාණය, අනාත්ම වූ රූප... විඤ්ඤාණය, සංඛත වූ රූප... විඤ්ඤාණය, වධක වූ රූපය... විඤ්ඤාණය ඇති සැටියෙන් නො දකී. බහු රූපය... විඤ්ඤාණය කරා පැමිණෙයි. දැඩිව ගනී. පිහිටයි. බහුට මේ පංච උපාදන ස්කන්ධ පැමිණීමෙන් දැඩිව ගැනීමෙන් බෝහෝ කල් අහිත පිණිස දුක් පිණිස පවතී. ඇවැත්නි, ආර්යයන් දක්නා.. උගත් ආර්ය ශ්‍රාවකයා රූප... විඤ්ඤාන ආත්ම වශයෙන්.... නො දකී. අනිත්‍ය වූ රූප... විඤ්ඤාන.. ඇති සැටියෙන් දකී. බහු රූපයට... විඤ්ඤාණයට නො පැමිණෙයි. දැඩිව නොගනී. නො පිහිටයි. බහුට මේ පංච උපාදන ස්කන්ධ නො පැමිණීමෙන් දැඩිව නො ගැනීමෙන් නො පිහිටීමෙන් බෝහෝ කල් හිත පිණිස සැප පිණිස පවතී.

ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, එය මෙසේය. යමෙකුට ආයුෂ්මතුන් වහන්සේ වැනි අනුකම්පා සහගත, වැඩකැමති, අවවාද අනුශාසනා කරන සබ්‍රහ්මචාරීහු සිටිත් නම් මෙය මෙසේ වෙයි. මගේ සිත ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ගේ බණ අසා උපාදන රහිතව ආස්‍රවවලින් මිදුණේය. ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ මෙය වදළහ. සතුටු සිත් ඇති ආයුෂ්මත් යමක පැරිසුත් තෙරුන් ගේ දෙශනාව පිළිගත්තේ ය.

4. අනුරාධ සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසාලා නුවර මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වසති. එකල ආයුෂ්මත් අනුරාධ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි වන කුටියක සිටිති. එයද බොහෝ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන් වෙත ගොස් පිළිසඳර නිමවා පසෙක හිද අනුරාධ තෙරුන්ට මෙසේ කිහ.

ආයුෂ්මත් අනුරාධයෙනි, උතුම් පුරුෂ වූ, පරම පුරුෂ වූ පරමාර්ථයට පැමිණියා වූ යම් සත්වයෙක් වෙයි නම් ඒ සත්වයා ඔබගේ ශාස්තෘන් වහන්සේ මේ සතර තැන්හිලා ව්‍යවහාර කරත් ද? " සත්වයා මරණින් මතු වෙයි. සත්වයා මරණින් මතු නො වෙයි. සත්වයා මරණින් මතු වන්නේත් වෙයි. නොවන්නේත් වෙයි සත්වයා මරණින් මතු වන්නේත් නො වෙයි, නො වන්නේත් නො වෙයි.

මෙසේ කී කළ ආයුෂ්මත් අනුරාධ තෙරුන් වහන්සේ ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට " ඇවැත්නි, උතුම් පුරුෂ වූ, පරම පුරුෂ වූ පරමාර්ථයට පැමිණි යම් සත්වයෙක් වෙයි නම් ඔහු අපේ ශාස්තෘන් වහන්සේ... මේ සතර තැන් හැර ව්‍යවහාර කරන සේකැයි කිය. මෙසේ කීකල ඒ අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට " මේ භික්ෂූ නම නවකයෙකි. ළහ දී මහණ වූවේකි. පථවිර වූවත් බාලයෙකි. අව්‍යක්තයෙකියි කීහ. ඉක්බිති ඒ

අන්‍යතිර්ථක පරිබ්‍රාජකයෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට නවක වාදයෙන් බාලවාදයෙන් ගරහා හුනස්නෙන් නැගිට ගියහ. පරිබ්‍රාජකයන් ගිය ටික වේලාවකින් අනුරාධ තෙරුන්ට මෙසේ සිත් විය.

ඉඳින් ඒ පරිබ්‍රාජකයන් මගෙන් තවත් ප්‍රශ්න ඇසුවොත් ඔවුන්ට මා කොහොම පිළිතුරු දුන්නොත් භාග්‍යවතුන් වහන්සේ වදාළ දෙය කියන්නෙක් වෙම් ද? භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් දොස් පවරන්නෙක් නොවෙම් ද? ධර්මානුකූලව දහමක් ප්‍රකාශ කරන්නෙම් ද? කරුණු සහිත වූ කිසියම් වාදයක් ගැරහිය යුතු තත්වයට නො පැමිණෙයි ද?.

අනතුරුව ආයුෂ්මත් අනුරාධ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ මෙසේ සැලකළහ.

ස්වාමීනි. මම භාග්‍යවතුන් වහන්සේට කිට්ටුව වන කුටියක වසමි. ස්වාමීනි, එවිට බෝහෝ අන්‍යතිර්ථක පරිබ්‍රාජකයෝ මා වෙත පැමිණ සතුටු සාමීචි කතා නිම කොට " ඇවැත් අනුරාධයෙනි, උත්තමපුරුෂ වූ... පනවත්දැයි මට මෙසේ කීහ. ස්වාමීනි, එසේ කී විට මම ඒ පරිබ්‍රාජකයන්ට... මෙසේ කීවෙමි. ස්වාමීනි, එවිට පරිබ්‍රාජකයෝ.. මට අවමන් කොට ගියහ. ඒ මට ඔවුන් ගිය ටික වේලාවකින්....යි සිත් විය.

අනුරාධ, කුමක් සිතන්නෙහි ද? රූපය... විඥානය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි... යමක් අනිත්‍ය නම්, දුක් නම් වෙනස් වන ස්වභාව ඇත් නම් එය මගේ ය. මම වෙමි. මගේ ආත්මය යි දැකීම සුදුසු ද? "ස්වාමීනි, සුදුසු නො වෙයි. එබැවින් අනුරාධ යම් අතීත අනාගත වරතමාන... රූප... විඥාන ඇත් ද ඒ මගේ නො වෙයි... මෙසේ මෙය ඇති සැටියෙන් හොඳ නුවණින් දැක්ක යුතුයි. මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූප... විඥානයෙහි කලකිරෙයි. මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

අනුරාධ, කුමක් සිතන්නේහි ද? රූපය... විඥානය සත්වයා

යි දක්නෙහි ද? නැත ස්වාමීනි, රූපයෙහි... විඥානයෙහි සත්වයා යි දක්නෙහි ද? ස්වාමීනි, නැත. රූපයෙන්... විඥානයෙන් බැහැර සත්වයා යි දක්නෙහි ද? නැත ස්වාමීනි. අනුරාධ, රූප නො වූ.. විඥාන නො වූ මේ සත්වයායි දක්නෙහි ද? ස්වාමීනි, නො වෙයි.

අනුරාධ මෙහි දී සත්‍ය වශයෙන් ම, සථිර වශයෙන් ම මේ ආත්ම භාවයෙහි ම ඔබලාට නො ලැබෙද්දී උත්තම පුරුෂ වූ පරම පුරුෂ වූ... කියා හෝ මේ සිවු තැනින් වෙන්ව පනවති යි යන ඔබ ගේ විසඳීම සුදුසු ද? ස්වාමීනි, සුදුසු නො වෙයි. අනුරාධ, සාධු, සාධු. මම පෙරත් දැනුත් දුකත්... දුක් නැසීමත් පනවමි.

5. වක්කලි සූත්‍රය

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප නම් වෙළුවානාරාමයෙහි වසන සේක. එකල ආයුෂ්මත් වක්කලි තෙරුන් වහන්සෙ ආබාධිතව දුකට පත්ව දැඩිගිලන්ව කුඹල්හලෙහි වසති. ඉක්බිති වක්කලි තෙරුන් වහන්සේ උපස්ථාකයන් අමතා "ඇවැත්නි, එන්න. ඔබලා භාග්‍යවතුන් වහන්සේ ළඟට ගොස් "ස්වාමීනි, වක්කලි භික්ෂූන් වහන්සේ ආබාධිතව දුකට පත්ව දැඩි ගිලන්ව සිටිති. උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා සිරසින් වඳිතියි මගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා සිරසින් වඳින්න. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාවෙන් වක්කලි තෙරුන් වෙත වඩින සෙක් නම් මැනවැයි මෙහෙමත් සැලකරන්න.

එසේයයි පිළිතුරු දුන් ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් වැඳ පසෙක හිඳ "ස්වාමීනි,.... යි මෙය සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවෙන් පිළිගත්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරව පාසිවුරු ගෙන වක්කලි තෙරුන් වෙත වැඩියහ. දුරින් ම වඩින භාග්‍යවතුන්. වහන්සේ දැක වක්කලි තෙර ඇඳෙන් නැගිටීමට උත්සාහ කළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "වක්කලි, ඔබ ඇඳෙන් නැගිටින්න එපා. පැන වූ ආසන මේ තිබෙනවා. මම එහි වාඩිවෙන්නම් යි පැන වූ අසුනෙහි වැඩ සිටියහ. වැඩ හිඳ "වක්කලි, ඔබට ඉවසිය හැකි ද? යැපිය හැකි ද?

කොහොම ද? දුක් වෙදනා අඩු වෙයි ද? වැඩි වෙයි ද? අඩු වන බවක් පෙනේ ද? වැඩි වන බවක් නො පෙනේ ද?

ස්වාමීනි, මට ඉවසීම අපහසුයි. යැපීමට අපහසුයි. මගේ දුක් වේදනා බොහොමයි. වැඩි වෙයි. අඩු නැහැ. වැඩි වන බව පෙනෙයි. අඩු වන බවක් නො පෙනෙයි" "වක්කලි, ඇයි? ඔබට කිසි පසුතැවිල්ලක් නැද් ද? විපිළිසරක් නැද් ද? "ස්වාමීනි, මගෙ පසුතැවිල්ල බරපතළයි. විපිළිසර බරපතළයි". වක්කලි, ඇයි ඔබට තෙමේ ම තමාට ශීලයෙන් චෝදනා නො කෙරේද?" "ස්වාමීනි, තෙමේ තමාට ශීලයෙන් චෝදනා නො කරයි" "වක්කලි, තෙමේ තමාට ශීලයෙන් චෝදනා නො කෙරේ නම් ඔබට මොන පසුතැවිල්ලක් ද? මොන විපිළිසරක් ද?" "ස්වාමීනි, මට බොහොම කලක පටන් භාග්‍යවතුන් වහන්සේ දක්නට යාමට ආසයි. නමුත් භාග්‍යවතුන් වහන්සේ දකින්ට යාමට තරම් ශක්තියක් මගේ ශරීරයට නැහැ".

"කමක් නැහැ වක්කලි, මේ කුණු ශරීරය දකීමෙන් ඔබට ඇති වැඩේ කුමක් ද? වක්කලි, යමෙක් ධර්මය දකී නම් ඔහු මා දකී. යමෙක් මා දකී නම් ඔහු ධර්මය දකී. වක්කලි, කුමක් සිතන්නෙහි ද? රූපය... විඥානය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි.... මෙය මගේ ආත්මය යි දකීමට සුදුසු ද? ස්වාමීනි, සුදුසු නො වෙයි. වක්කලි, එහෙයින්... රහත් බව පිණිස අනිකක් නැකැයි දනී. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ වක්කලි තෙරුන්ට මේ අවවාදයෙන් අවවාද කොට හුනස්නෙන් නැගිට ගිජ්ඣකූටපර්වතයට වැඩියහ.

ඉක්බිති වක්කලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් උපස්ථායකයන් අමතා "ඇවැත්නි, මා ඇඳක තබා ගෙන ඉසිගිලි පැත්තක කාලයිලාවට ගෙන යන්න. මා වැන්නෙකු ඇතුළගම මිය යාමට කොහොම සිතන්නදැයි කීහ. "ඇවැත්නි, එහෙමයි." ඒ භික්ෂුහු වක්කලි තෙරුන් ඇඳක තබා ගෙන ඉසිගිලි පැත්තක කාලසිලාවට ගෙන ගියහ. එකල භාග්‍යවතුන් වහන්සේ ඒ රැයත් ඒ ඉතිරි දවල් කොටයත් ගිජ්ඣකූට පර්වතයෙහි විසූහ.

ඉක්බිති දෙව්වරු දෙදෙනෙක් පෙරයම ඉක්ම ගිය පසු බබළන ශරීර පැහැයෙන් මුළු මහත් ගිජ්ඣකූටපර්වත බඹුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක සිටියහ. පසෙක සිටි එක් දෙවියෙක් "ස්වාමීනි. වක්කලි භික්ෂූන් වහන්සේ විමොක්ෂය ගැන සිතති" යැලකළේය. අනෙක් දේවතාවා "ස්වාමීනි, එතුමා නියැකයෙන් ම අර්හත් ඵල විමුකතියෙන් විමුක්තට මිදෙන්නේ යයි සැලකළේය. ඒ දෙව්වරු මෙසේ කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට අතුරුදන් වූහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඉක්මීමෙන් පසුව භික්ෂූන් ඇමතූහ. " මහණෙනි, එව්. ඔබලා වක්කලි භික්ෂුව වෙත යන්න. ගොස් "වක්කලි, භාග්‍යවතුන් වහන්සේ ගේ ත් දෙව්වරු දෙදෙනකු ගේ ත් කිම අහන්න. ඇවැත්නි. මේ රාත්‍රියෙහි දෙව්වරු දෙදෙනෙක් එළඹ... මෙසේ සැල කළහ. ඇවැත් වක්කලි භාග්‍යවතුන් වහන්සේ ඔබට වක්කලි, බිය වෙන්න එපා. නුඹේ මරණය අළාමක වෙයි. නුඹේ කාලක්‍රියාව අළාමක වෙයි වදළ සේකැයි මෙසේ කියව්."

එසේය ස්වාමිනියි, පිළිතුරු දුන් භික්ෂූන් වහන්සේලා වක්කලි තෙරුන් වෙත පැමිණ... එය කිහ. එවිට අයුෂ්මත් වක්කලි තෙරණුවෝ උපස්ථායකයන් අමතා "ඇවැත්නි, එන්න, මා ඇදෙන් බස්වන්න. මා වැන්නෙකු උස්අසුනක හිද ඒ භාග්‍යවතුන් වහන්සේගේ පනිවුඩය ඇසිය යුතුය යි සිතන්නේ කොහොම ද 'යි කිය. ඇවැත්නි, එසේය යි පිළිතුරු දුන් උන්වහන්සේලා ආයුෂ්මත් වක්කලි තෙරුන් ඇදෙන් බැස්වූහ. "ඇවැත්නි, මේ රාත්‍රියෙහි දෙව්වරු දෙදෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ.. මෙසේ සැලකළහ. භාග්‍යවතුන් වහන්සේක්... නුඹේ කාලක්‍රියාව අළාමක වෙයි වදළ සේකැයි කිහ.

ඇවැත්නි, එහෙනම් මගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා සිරසින් නමස්කාර කරන්න. ස්වාමීනි, අබාධික..වක්කලි සිරිපා සිරිසින් වඳයි. මෙහෙමත් කියයි. " ස්වාමීනි, රූපය... විඥානය අනිත්‍යයි. මම එය සැක නො කරමි, යමක් අනිත්‍ය නම් එය දුකයි. එහි විවිකිච්ඡා නො කරමි. යමක් අනිත්‍ය නම්.. වෙනස්

වනසුලු නම් එහි මගේ ඡන්දයක්, රාගයක්, ප්‍රේමයක් නැතැයි සැක නො කරමි."

ඇවැත්නි, එසේය යි පිළිතුරු දී ඒ භික්ෂූහු ගියහ. උත්වහන්සේලා වැඩි නොබෝ වේලාවකින් ආයුෂ්මත් වක්කලි තෙරුන් වහන්සේ සැතකින් ගෙල සිඳ ගත්හ.

ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, ආයුෂ්මත් වක්කලි... සැක නොකරමියි කියකි මෙය සැලකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා " මහණෙනි, වක්කලි ගෙල සිඳගත් ඉසිගිලි පාර්ශ්වයේ කාලසිලාවට යමු"යි වදළහ. එසේය ස්වාමීනියි පිළිතුරු දුන්හ. උත්වහන්සේ බොහෝ භික්ෂූන් පිරිවරා ගෙන.. කාලසිලාවට වැඩියහ. පෙරළුණු කඳ ඇතිව ඇදෙහි වැටී සිටි ආයුෂ්මත් වක්කලි දුරදී ම දුටු සේක. එවේලෙහි දුම්දමන බවක් අදුරුබවක් නැගෙන හිරට යයි. බටහිරට යයි. උතුරට යයි. දකුණට යයි. උඩට යයි. යටට යයි. අනුදිශාවලට යයි. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, ඔබලා පෙරදිගට අපරදිගට... අනුදිශාවලට යන මේ දුම් දමන බව අදුරු බව දක්නහු ද? "ස්වාමීනි, එසේය. මහණෙනි, ඒ පවිටු මාරයා ය. වක්කලි කුලපුත්‍රයා ගේ විඤ්ඤාණය කොයි පිහිටියේදැයි විඤ්ඤාණය සොයයි. මහණෙනි, වක්කලි කුලපුත්‍රයා නො පිහිටි විඤ්ඤාණයෙන් පිරිනිවි යේ යයි වදළහ.

6. අසඝපි සූත්‍රය

එසමයෙහි ආයුෂ්මත් අසඝපි තෙරුන් වහන්සේ ආබාධිතව දුක්ඛිතව, දැඩිගිලන්ව අසඝපිකඝපකාරමයෙහි වාසය කරති. ඉකිබිති අසඝපි තෙරුන් වහන්සේ උපස්ථායකයන් අමතා "ඇවැත්නි, එන්න, ඔබලා භග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ සිරිපා සිරසින් වඳින්න. මෙසේත් සැලකරන්න. ස්වාමීනි. අනුකම්පාවෙන් අසඝපී තෙරුන් වෙත වඩින සේක් නම් මැනවි." එසේය. අවැත්තියි පිළිතුරු දී ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත

ගොස් වැඳ පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට... මෙය සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවෙන් පිළිගත්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස පලසමවතින් නැගිට.. අසඝපි තෙරුන් වෙත වැඩියහ. අසඝපි තෙරුන් වහන්සේ දුරින්ම වඩින භාග්‍යවතුන් වහන්සේ දැක ඇඳෙන් නැගිටීමට උත්සාහ කළහ. "අසඝපි ඇඳෙන් නැගිටින්ට එපා. මේ පැන වූ ආසන තිබෙනවා. මම එහි වාඩිවෙන්නෙමැයි පැන වූ අසුනෙහි වැඩහිඳ " අසඝපි, ඔබට ඉවසිය හැකි ද? යැපිය හැකි ද? දුක් වේදනා අඩු ද? වැඩි ද? මේ දුක්වේදනාවල අඩුවීමක් පෙනේ ද? වැඩිවීමක් නො පෙනේදැයි විමසුහ.

"ස්වාමීනි, මට ඉවසන්නට බැහැ. යැපිය නො හැකියි. මා ගේ දුක් වේදනා වැඩියි. අඩුවක් නැහැ. දුක් වේදනා වැඩීම පෙනෙයි. අඩුවක් නො පෙනෙයි."

අසඝපි. ඔබට කිසි පසුතැවිල්ලක් නැද් ද? කිසි විපිළිසරක් නැද් ද? "ස්වාමීනි, මට පසුතැවිලි බොහොමයි. විපිළිසර බොහොමයි. අසඝපි, දැයි තෙමේ ශීලයෙන් තමාට චෝදනා නො කෙරේ ද? ස්වාමීනි, මට තෙමේ ශීලයෙන් චෝදනා නො කරයි. අසඝපි, ඉතින් කෙමේ තමාට ශීලයෙන් චෝදනා නො කරයි නම් ඔබ ගේ පසුතැවිල්ල කුමක් ද? විපිළිසරය කුමක් ද?

ස්වාමීනි. මම පෙර ගිලන් බවෙහි ආශ්වාස ප්‍රශ්වාසය නවත්වා වාසය කරමි. ඒ මම එම සමාධිය නො ලබමි. ඒ සමාධිය නොලබන ඒ මට "මම නො පිරිහෙමිදැයි මේ අදහස වෙයි. අසඝපි, සමාධිය සාර කොට ගත් සමාධිය ශ්‍රමණ බව කොට ගත් යම් ඒ මහණ බමුණෝ වෙත්ද සමාධිය නො ලබන මවුන්ට අපි පිරිහෙන්නෝ වෙමුයි සිතෙයි. අසඝපි, කුමක් සිතත්තෙහි ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද?... අසඝපි, මෙසේ දක්නා... මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනී.

ඔහු සැප වේදනාවක් වීඳීද එහි නො ඇලීම සැප වේදනාව විඳී. ඉදින් දුක් වේදනාවක් නම් නො ඇලීම විඳියි. ඉදින් දුකක්

නැති සැපක් නැති වේදනාවක් විඳි නම් නො ඇලීම විඳි. ඔහු කය කෙළවර කොට ඇති වේදනාවක් විඳි නම් කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමියි දැන ගනියි. දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳි නම් දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳිමියි දැන ගනියි. කය බිඳි මතු දිවි කෙළවර වීමෙන් මෙහිදී ම නො සතුටු වූ ඒ සියලු වේදනා සිසිල් බවට පැමිණෙතියි දැන ගනියි.

ඉදින් ඔහු සැපවේදනාවක් විඳි නම් එය අනිත්‍යයයි දැන ගනියි. තෘෂ්ණාවෙන් නො බැසගත්තා ලැදයි ද දැන ගනී. ඉදින් දුක් වේදනාවක් විඳි නම් එය අනිත්‍යයි දැන ගනියි. නො බැස ගන්නා ලදයි නො සතුටුවන ලදයි දැන ගනියි. ඉදින් දුකත් නැති සැපත් නැති වේදනාවක් විඳි නම් එය අනිත්‍යයි දැන ගනියි. නො බැස ගන්නා ලදයි දැන ගනියි. නො සතුටු වන ලදයි දැන ගනියි.

අසයපි යම් සේ තෙල නිසාත්, වැටිය නිසාත් තෙල්පහන දැල් වෙයි ද එම තෙලත් වැටියත් අවසන් වීමෙන් ප්‍රත්‍ය නැතිව නිවී යන්නේ ද එමෙන් අසයපි, භික්ෂුව කය අවසන් කොට ඇති වේදනාවක් විඳිමින් කය අවසන් කොට ඇති වේදනාවක් විඳිමියි දැන ගනියි. දිවි අවසන් කොට ඇති වේදනාවක් විඳින්නේ දිවි අවසන් කොට ඇති වේදනාවක් විඳිමියි දැන ගනී. කය බිඳී මතු ජීවිතය කෙළවර වීමෙන් නො සතුටු වූ සියලු වේදනා මෙහි ම සංසිඳේය යි දැන ගනියි.

7. ඛෙමක සූත්‍රය

එක් කලෙක බොහෝ ස්ථවිර භික්ෂූන් වහන්සේලා කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වසති. එකල ආයුෂ්මත් ඛෙමක තෙරුන් වහන්සේ ආබාධිතව දුකට පත්ව දැඩිගිලන්ව බදරිකාරාමයෙහි වසති. ඉක්බිති ස්ථවිර භික්ෂූහු සවස පලයමවහින් නැගිට ආයුෂ්මත් දසක තෙරුන් අමතා "ඇවැත් දසකයෙනි, එන්න, ඔබ ඛෙමක තෙරුන් වෙත ගොස් මෙසේ කියන්න. ආයුෂ්මත් ඛෙමකයෙනි, ස්ථවිර භික්ෂූහු ඔබට මෙසේ කියකි." ඇවැත්නි, ඔබට ඉවසිය හැකි ද?... දුක් වේදනාවල වැඩීම නො පෙනේ ද?."

ඇවැත්නි, එසේයයි පිළිතුරු දුන් දසක තෙරුණුවෝ ඛෙමක තෙරුන් වෙත ගොස් " ඛෙමකයෙනි, ඔබට.. මෙය කිහ. " ඇවැත්නි මට ඉවසිය නො හැකිය.. අඩුවක් නො පෙනෙයි, කිහ. ඉක්බිති ආයුෂ්මත් දසක තෙර ස්ථවිර භික්ෂූන් වෙත පැමිණ.. මෙය කිහ.

දසකයෙනි, එන්න. ඔබ ඛෙමක තෙරුන්වෙත ගොස් ඇවැත් ඛෙමක ඔබට ස්ථවිර භික්ෂූහු මෙසේ කිහ. "භාග්‍යවතුන් වහන්සේ විසින් මේ රූප උපාදනස්කන්ධය... විඤ්ඤාන උපාදනස්කන්ධය යි උපාදනස්කන්ධ පහක් දෙසන ලදි. මෙයින් කිසිවක් ආත්මයයි හෝ ආත්මයට අයත්ය කියා හෝ ඔබ දක්නෙහි ද?" එසේයි පිළිතුරු දුන් දසක තෙර ඛෙමක තෙරුන් වෙත ගොස්.. මෙය කිය.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ රූපස්කන්ධ...යි ස්කන්ධ පහක් වදළහ. ඇවැත්නි, මෙයින් කිසිවක් ආත්මයයි හෝ.. මම නො දකිමි. ඉක්බිති දසක තෙර ස්ථවිරවරුන් වෙත ගොස් "ඇවැත්නි, ඛෙමක භික්ෂුව.. මම නො දකිමියි" මෙසේ කියේය යි කිය.

ඇවැත් දසකයෙනි, එන්න. ඔබ ඛෙමක භික්ෂුව වෙත ගොස් මෙසේ කියන්න. ඇවැත් ඛෙමක ඔබට තෙරවරු මෙසේ කියති... ආත්මයට අයත්යයි නො දක්නෙහි නම් ආයුෂ්මත් ඛෙමක අර්හත් ක්ෂීණාස්‍රව කෙනෙකි." ඇවැත්නි, එසේයයි පිළිතුරු දුන් දසක තෙර ඛෙමක තෙරුන් වෙත ගොස් ඇවැත් ඛෙමකයෙනි, ඔබට ස්ථවිරවරු.... එසේ නම් අර්හත් වූ ක්ෂීණාස්‍රවයෙකැයි කියතියි මෙසේ කිය.

ඇවැත්නි, භග්‍යවතුන් වහන්සේ විසින් වදළ... මේ පංච උපාදන ස්කන්ධවලින් කිසිවක් ආත්මය කියා හෝ ආත්මයට අයත්ය කියා හෝ මම නො දකිමි. මම අර්හත් ක්ෂීණාස්‍රවයෙකුත් නො වෙමි. එහෙම වුවත් ඇවැත්නි, මම මේ පංච උපාදන ස්කන්ධවල "වෙමි." කියා පැවති තණ්හාමාන අවබොධ කළෙමි. මේ මම වෙමියි ද නො දකිමි. ඉක්බිති දසක තෙර ස්ථවිර භික්ෂූන් වෙත ගොස් මෙසේ කිය. "ඇවැත්නි, ඛෙමක භික්ෂුව "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වදළ පංච උපාදන ස්කන්ධවලින්.. ආත්මයට අයත්ය කියා හෝ නො දකිමි... මේ මම වෙමියි නො දකිමි."කියති යි කිය.

දසකයෙකි, එන්න. ඔබ ඛෙමක භික්ෂුව වෙත ගොස් මෙසේ කියන්න. " ඛෙමකයෙනි, ඔබට තෙරවරු මෙසේ කීහ. " ඒ යමෙක් වෙමියි කියන්නෙහි නම් ඒ කුමක් වෙයි කියන්නෙහි ද? රූපය... විඤ්ඤාණය මම වෙමි කියන්නෙහි ද? රූපයෙන්... විඤ්ඤාණයෙන් පිටත යමක් මම වෙමි කියන්නෙහි ද? ඛෙමකයෙනි, ඒ යමක් මම වෙමියි කියන්නෙහි ද? ඒ කුමක් මම වෙමියි කියන්නෙහි ද? ඇවැත්නි, එසේයයි පිළිතුරු දුන් දසක තෙර ඛෙමක තෙරුන් වෙත පැමිණ මෙසේ කිය. ඛෙමකයෙනි, ඔබට තෙරවරු මෙසේ කීහ. ඛෙමකයෙනි, ඒ යමක් මම වෙමියි... ඒ කුමක් මම වෙමි කියන්නෙහි ද?

දසකයෙනි, කමක් නැහැ. මේ නැවත නැවත යාමරමේන් වැඩක් නැහැ. ඇවැත්නි, සැරයටිය ගෙන එන්න. මම ම තෙරවරුන් වෙත එන්නම්. ඉක්බිති ඛෙමක තෙර හැරමිටි ගසමින් තෙරවරුන් වෙත ගොස් පිළිසඳර නිමවා පසෙක වාඩි විය. වාඩි වූ ඛෙමක තෙරුන්ට තෙරවරු මෙසේ කීහ. " ඇවැත්නි. ඒ යමකට මම වෙමියි... කියන්නෙහි නම් ඒ කුමකට මම වෙමි කියන්නෙහි ද?

ඇවැත්නි, මම රූපය... විඤ්ඤාණය මම වෙමියි. නො කියමි. රූපයෙන්... විඤ්ඤාණයෙන් බැහැර වූවක් මම වෙමියි නො කියමි. මම පංච උපාදන ස්කන්ධයෙහි වෙමියි පැවති තණ්හාදිට්ඨි අවබොධ කළෙමි. මේ මම වෙමියි ද නො දකිමි.

ඇවැත්නි. යම් සේ උසුල්මලක හෝ රත්පියුමක හෝ, සුදුපියුමක හෝ සුවඳක් තිබේ ද, යමෙක් එය පෙත්තෙහි සුවඳයයි හෝ වණියේ සුවඳයයි හෝ රේණුවල සුවඳයයි මෙසේ කියන්නේ නම් එසේ කියන ඔහු මනාව කියන්නේ ද? ඇවැත්නි, එය මනාව කීමක් නො වෙයි. ඇවැත්නි, මනාව කියන්නෙක් එය කෙසේ කියන්නේ ද? ඇවැත්නි, මනාව කියන්නෙක් මලේ සුවඳ ම යයි කියන්නේ ය. ඇවැත්නි, එමෙන් මම රූපය වෙමියි නොකියමි... විඤ්ඤාණය වෙමියි නො කියමි... මේ මම වෙමියි නො දකිමි.

ඇවැත්නි. ආර්ය ශ්‍රාවකයාට මිරමිභාගිය සංයොජන පහ දුරු වූවත් උපාදනයක්කඩ පිළිබඳ ඔහු ගේ සියුම් වෙමි යන මානයෙන් වෙමි, යන ඡන්දයත්, වෙමි යන අනුසයත් සහමුලින් නො නැසුණේ වෙයි. ඔහු පසු කලෙක රූපය... සංඥාව මෙහෙමයි විඤ්ඤාණය මෙහෙමයි. රූප... විඤ්ඤාණයේ හට ගැනීම මෙහෙමයි. රූප... විඤ්ඤාණයේ නැති වීම මෙහෙමයි. කියා ඇතිවීම නැතිවීම දකිනසුලුව වාසය කරන ඔහුට පංච උපාදන ස්කන්ධවල සහමුලින් නො නැසී අණු සහගතව පවතින මම වෙමි යන මානයත්, වෙමි යන ඡන්දයත්, වෙමි යන අනුසයත් සහමුලින් නැසී යයි.

ඇවැත්නි, යම් සේ කිලිටි කුණු බැදුණු රෙද්දක් අයිකිකරුවෝ රජකයාට දෙති. ඔහු ඒ රෙද්ද අළුදියෙන්, කරදියෙන්, ගොමදියෙන් පොඩි කොට පිරිසිදු වතුරෙන් සෝදයි. ඒ රෙද්ද පිරිසිදු වුවත් සුදෝ සුදු වුවත් එහි අළු ගඳ කරගඳ ගොමගඳ සියුම්ව නො නැසී පවතී. රජකයා එය හිමියන්ට දෙයි. හිමියෝ එය සුවඳවත් කළ කරඬුවක තබති. එහි යම් සියුම් නො නැසුණු අළුගඳක් කරගඳක් ගොමගඳක් තිබුණේ ද එයත් සහමුලින් නැසී යයි.

ඇවැත්නි, එසේ ආර්ය ශ්‍රාවකයා ගේ ඔරම්භාගිය සංයොජන පහ නැසුණත් අණු සහගත වෙමි යන මානයක්... අනුසයන් සහමුලින් නො නැසී පවතී. ඔහු පසුව පංච උපාදන ස්කන්ධ පිළිබඳව රූපයේ... විඤ්ඤාණයේ ඇති වීම මෙසේ ය. නැති වීම මෙසේ යයි උදය ව්‍යය දක්නාසුලුව වසති. එසේ වසන ඔහුගේ සහමුලින් නො නැසී අණු සහගතව පැවති වෙමි යන මානයත්... අනුසයත් සහමුලින් නැසී යයි.

මෙසේ කීකල තෙරවරු ආයුෂ්මත් ඛෙමකයන්ට "අපි ඛෙමකයන් වෙහෙසනු සඳහා නො ඇසුවෙමු. එහෙත් ආයුෂ්මත් ඛෙමක ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ ශාසනය විස්තර වශයෙන් කියන්නට ප්‍රකාශ කරන්නට, පනවන්නට, පිහිටුවන්නට, විවරණය කරන්නට, බෙදන්නට, උඩුකුරු කරන්නට දක්ෂය. අයුෂ්මත් ඛෙමකයන් විසින් විස්තර වශයෙන් කියන ලදි. ප්‍රකාශ කරන ලදි. පනවනලදි. පිහිටුවන ලදි. විවරණය කරන ලදි. බෙදනලදි. උඩුකුරු කරන ලදි.

ආයුෂ්මත් ඛෙමක තෙරුන් වහන්සේ මෙය වදළහ. සතුටු සිත් ඇති තෙරුන් වහන්සේලා ඛෙමක තෙරුන් ගේ දෙශනාව පිළිගත්හ. මේ සූත්‍රය දෙසන වේලෙහි සැටක් පමණ ස්ථවිර, භික්ෂූන් ගේත් ආයුෂ්මත් ඛෙමක තෙරණුවන් ගේත් සිත් උපාදන රහිතව ආස්‍රවවලින් මිදුණේ ය.

8. ඡන්න සූත්‍රය

එක් කලෙක බරණැස ඉසිපතන මිගදයෙහි බොහෝ ස්ථවිර භික්ෂූන් වහන්සේලා වසති. එකල ආයුෂ්මත් ඡන්න සවස් කාලයෙහි විවේකයෙන් නැගිට යතුර ගෙන විහාරයෙන් විහාරයට යමින් "ආයුෂ්මත් තෙරුන් වහන්සේලා මට දහම් දක ගත හැකි පරිදි අවවාද කරනු මැනවි. මට අනුශාසනා කරනු මැනවි මට දැහැමි කතා කරනු මැනවැයි කීය.

මෙසේ කීකල තෙරුන් වහන්සේලා "ආයුෂ්මත් ඡන්නට " ආයුෂ්මත් ඡන්න, රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. රූප... විඤ්ඤාණ අනාත්මයි. මෙසේ කිහ. එවිට ඡන්නට මෙසේ සිත් විය "මටත් මෙය මෙහෙමයි රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. රූපය... විඤ්ඤාණය අනාත්මයි. සියලු සංස්කාර අනිත්‍යයි. සියලූ ධර්ම අනාත්මයි. එහෙත් සියලූ සංස්කාරවල සංසිඳීම වන, සියලු උපධි දුරු කිරීම වන, තෘෂ්ණාක්ෂය වන නො ඇලීම වන, නිරොධය වන, නිවනෙහි මගේ සිත නො වැද ගනී. නො පහදියි, නො සිටියි. නො යෙදෙයි. තැති ගැනීමත් දඩිව ගැනීමත් උපදියි. එහෙනම් මගේ ආත්මය කුමක්දැයි සිත ආපසු හැරෙයි. ධර්මය දකින්නාට එසේ නො වෙයි. මට දහම් දක ගත හැකි පරිදි කවුරු මට ධර්මදෙශනා කරත් ද?"

එවිට ආයුෂ්මත් ඡන්නට මෙසේ අදහස් විය. "බුදුරජාණන් වහන්සේත් වර්ණනා කළ, නුවණැති සබ්‍රහ්මචාරීන් වහන්සේලාත් බුහුමන් කළ, මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වසති. මට ධර්මය දැන ගැනීමට බණ කීමටත් ආනන්ද තෙරුණුවෝ සමර්ථයි. අනඳ තෙරුන් වහන්සේ

පිළිබඳ හොඳ විශ්වාසයකුත් මට තිබේ. මා අනඳ තෙරුන් ළඟට ගියොත් හොඳයි."

ඉන් පසු ආයුෂ්මත් ඡන්න සෙනසුන දඟුරා පාසිවුරු ගෙන කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි අනඳ තෙරුන් වෙත පැමිණ සතුටු සාමීචි කතා අවසන් කොට පසෙක හිඳ "ආයුෂ්මත් ආනන්ද, මම කලෙක බරණැස ඉසිපතන මිගදයෙහි සිටියෙමි. ඇවැත්නි, මම එකල සවස විවේකයෙන් නැගිට.. මට අනුශාසනා කරනු මැනවැයි කීවෙමි. ඇවැත්නි, ස්ථවිර භික්ෂූහු මට... සියලු ධර්ම අනාත්මය යි" කිහ. ඇවැත්නි, ඒ මට මෙසේ සිතුණේ ය. මටත් මෙය මෙහෙමයි.. මට දහම් දක ගත හැකි පරිදි කවුරු බණ කියත් ද? ඇවැත්නි, ඒ මට මෙසේ සිත් විය. මේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ... ළඟට ගියොත් හොඳයි. ආයුෂ්මත් ආනන්දයෙනි, මට දහම් දකගත හැකි පරිදි අවවාද කරනු මැනවි. අනුශාසනා කරනු මැනවි. බණක් කියනු මැනවි.

මෙපමණකිනුත් අපි ආයුෂ්මත් ඡන්න ගැන සතුටු වෙමු. ඡන්න විසින් සතුටු කරන ලද්දේ වෙමු. ඡන්න එය හෙළිකළේය. මානය නැමැති හුළ බිද දැම්මේය. ඡන්න. කන් යොමු කරන්න. දහම් දැකීමට සුදුස්සෙකි. එවිට ආයුෂ්මත් ඡන්නට "දහම් දැකීමට සුදුස්සෙක්මියි එපමණකින්ම බලවත් ප්‍රීති ප්‍රමොදයක් උපන්නේ ය.

"ආයුෂ්මත් ඡන්න, කවවානගොත්‍රය භික්ෂු නමට අවවාද කරන භාග්‍යවතුන් වහන්සේගෙන් මා විසින් මෙය අසන ලදි. පිළිගන්නා ලදි."කවවාන, බොහෝ සෙයින් ලෝකය ඇති බවත් නැති බවත් යන මේ දෙක ඇසුරු කළේය. කවවාන, ලොකයෙහි ඇති වීම මනා නුවණින් බලන්නෙකුට ලෝකයෙහි යම් නැති බවක් වේද එම දෘෂ්ටිය ඇති නො වෙයි. ලොකයෙහි නැති වීම මනා නුවණින් ඇති සැටියෙන් බලන්නේකුට ලොකයෙහි යම් ඇති බවක් වේද එම දෘෂ්ටිය ඇති නො වෙයි. කවවාන, මේ ලෝකයා බොහෝ සෙයින් උපාය. උපාදන ගැනීම වූ බැම්මෙන් බැඳුණේ ය. ඔහු

බොහෝ යෙයින් ඒ උපාය උපාදනවලටත් සිතේ පිහිටීම පිවිසීම අනුසය කොට ඇති බවටත් නො පැමිණෙයි. දැඩිව නො ගනී. මගේ ආත්මයයි නො ගනී. උපදින්නේ දුක ම උපදී. නිරුද්ධවන්නේ දුක ම නිරුදධ වෙයි. සැක නො කරයි. විචිකිච්ඡා නො කරයි. මෙහි ලා ඔහුට පර ප්‍රත්‍ය රහිත බැවින් ඥානය ම ඇති වෙයි. කච්චාන , මෙපමණකින් සම්මාදිට්ඨිය වෙයි.

කච්චාන, සියල්ල ඇත යන්න එක් අන්තයකි. සියල්ල නැත යන්න දෙවැනි අන්තයයි. කච්චාන, මේ අන්ත දෙකට ම නො පැමිණ තථාගතයන් වහන්සේ මධ්‍යයෙන් ධර්මදෙශනා කරති. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වෙයි. මෙසේ සියලු දුක් කදේ හටගැනීම වෙයි. අවිද්‍යා වේම නිරවශෙෂ නිරොධයෙන් සංස්කාර නිරොධය වෙයි.. මෙසේ සියලු දුක් ගොඩේ නිරොධය වෙයි.

ආයුෂ්මත් ආනන්දයෙනි, යමෙකුට අනුකම්පා කරන, වැඩ කැමති, අවවාද අනුශාසනා කරන ආයුෂ්මතුන් වැනි සබ්‍රහ්මචාරීන් ඇකොත් උත්වහන්සේලා මෙබඳුයි. ආයුෂ්මත් ආනන්දයන් ගේ බණ අසා මම ධර්මාවබොධ කර ගනිමි.

9. පඨමරාහුල සූත්‍රය

පසෙක හුන් ආයුෂ්මත් රාහුල භාග්‍යවතුන් වහන්සේට "සවාමීනි, කෙසේ දන්නා කෙසේ දක්නහුට මේ විඤ්ඤාණ සහිත කයෙහිත් බාහිර සියලු අරමුණුවලත් අහංකාර, මමංකාර, මාන අනුසය ධර්ම නො වන්නේදයි සැලකළේය.

රාහුල, අතීත අනාගත වර්තමාන.. යම් රූප... විඥාන ඇත් ද, ඒ සියල්ල මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි කියා මෙසේ මනා නුවණින් ඇති සැටියෙන් දකියි. රාහුල, මෙසේ දන්නහුට., දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් බාහිර සියලු නිමිත්තවලත් අහංකාර මමංකාර මාන අනුසය ධර්ම නො වෙයි.

10. දුතියරාහුල සූත්‍රය

"සවාමීනි, කෙසේ දන්නා කෙසේ දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් බාහිර සියලු අරමුණුවලත් පහ වූ අහංකාර මමංකාර මාන අනුසය ඇති මානය ඉක්ම වූ සන්සුන් මනාව මිදුණු සිත ඇති වේ ද?"

රාහුල, අතීත අනාගත වර්තමාන.. යම්කිසි රූප... විඥානයක් ඇද්ද ඒ සියල්ල මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි කියා මනා නුවණින් ඇති සැටියෙන් ඒ දක උපාදන රහිතව මිදුණේ වෙයි. රාහුල, මෙසේ දන්නා මෙසේ දක්නහුට... මැනවින් මිදුණු සිත ඇති වෙයි.

5. පුප්ඵ වර්ගය

1. නදී සූත්‍රය

මහණෙනි, යම් සේ කන්දෙන් ගලා බසින, වැටුණ වැටුණ දේ පහළට ගෙන යන, දුර ගමන් යන, දුර ගමන් කරන, වේගවත් සැඩපාර ඇති ගඟක් වෙයි. ඉදින් එහි දෙතෙර වැවුණ වැලුක් තණ ඇත. ඒවා ගහට නැමී තිබෙයි. කුසතණ වෙයි. ඒවා ගහට නැමී තිබෙයි. බබුස්තණත් ඇත. ඒවා ගහට නැමී තිබෙයි. බෙරුතණත් ඇත. ඒවා ගහට නැමී තිබෙයි. දුබල ගස් ද ඇත. ඒවා ගහට නැමී ඇත. ඒ ගඟේ සැඩපහරින් ගසා ගෙන යන මිනිසෙක් ඒ වැලුක තණවල එල්ලුණොත් ඒවා මුල් පස් සමග ම ඉදිරෙයි. ඒ හේතුවෙන් මහාවිනාශයට පත් වෙයි. කුසතණවල එල්ලුණොත් ඒවා මුල් පස් සමග ම ඉදිරෙයි. එයින් මහාවිනාශයට පත් වෙයි. බබුස් තණවල එල්ලුණොත් ඒවා මුල් පස් සමග ම ඉදිරෙයි. එයින් මහාවිනාශයට පත් වෙයි. බෙරුතණවල එල්ලුණොත් ඒවා මුල්පස් සමග ම ඉදිරෙයි. එයින් මහාවිනාශයට පත් වෙයි. දුබල ගස්වල එල්ලුණොත් ඒවා මුල් පස් සමග ඉදිරෙයි. එයින් මහාවිනාශයට පත්වෙයි.

එමෙන් මහණෙනි, ආර්යයන් නොදක්නා... තුගත් පෘථග්ජනයා රූපය... විඤ්ඤාණය ආත්ම වශයෙන් දනී. ආත්මය රූපවත්... විඳානවත් කොට දකී. රූපය ආත්මයෙහි ලා දකී. ආත්මය රූපයෙහි ලා දකී. ඔහු ගේ ඒ රූප... විඳාන නැසෙයි. ඒ හේතුවෙන් ඔහු මහාවිනාශයට පත් වෙයි.

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූප... විඳාන නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි... යමක් අනිත්‍ය නම්.. එය මගේ යි. ගැනීම සුදුසු ද? ස්වාමීනි, සුදුසු නො වෙයි. එහිසා මහණෙනි, රූප... විඳාන... මගේ ආත්මය නො වෙයි කියා දක්ක යුතුය... ඔහු මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

2. පුප්ඵ සූත්‍රය

මහණෙනි, මම ලෝකයා සමඟ විවාද නො කරමි. ලෝකයා නම් මා සමඟ විවාද කරති. මහණෙනි, ධර්මවාදියෙක් ලොව කා සමඟ වත් විවාද නො කරයි. මහණෙනි, පණ්ඩිතයන් විසින් යමක් ලොකයෙහි නැතැයි සම්මත කරන ලද නම් මමත් එය නැතැයි කියමි. පණ්ඩිතයන් විසින් යමක් ලෝකයෙහි ඇතැයි සම්මත කරන ලද නම් මමත් එය ඇතැයි කියමි.

මහණෙනි, මම යමක් නැතැයි කිමිද ලොව නැතැයි පණ්ඩිතයන් විසින් එබදු කුමක් සම්මත කරන ලද ද? මහණෙනි, නිත්‍ය, ඒකාන්ත, සදකාලික, නො වෙනස් වන රූපයක්... විඤ්ඤානයක් ලොව නැතැයි පණ්ඩිතයන් විසින් සම්මතය. මමත් එය නැතැයි කියමි. මහණෙනි, මම යමක් නැතැයි කියමි නම් එය ලොකයෙහි පණ්ඩිතයන් විසින් නැතැයි සම්මතයි.

මහණෙනි, මම යමක් ඇතැයි කියමි නම් ඒ කුමක් ලොකයෙහි ඇතැයි පණ්ඩිතයන් විසින් සම්මත ද? මහණෙනි, අනිත්‍ය වූ දුක් වූ වෙනස්වනසුලු රූපයක්... විඤ්ඤානයක් ලොව ඇතැයි පණ්ඩිතයන් විසින් සම්මතය. මමත් එය ඇතැයි කියමි. මහණෙනි, මම යමක් ඇතැයි කියමි නම් මෙය පණ්ඩිතයන් විසින් ලොව ඇතැයි සම්මතයි.

මහණෙනි, තථාගතයන් වහන්සේ යමක් මනාව අවබොධ කරත් ද, මනාව දැනගනිත් ද, මනාව අවබොධ කොට මනාව දැන කියත් ද දෙශනාකරත් ද, පනවත් ද, පිහිටුවත් ද, විවරණය කරත් ද, විභජනය කරත් ද, උඩුකුරු කරත්ද ඒ ලොක ධර්මය [1] තිබෙයි.

1.ලොකධර්මය නම් ප•වස්කන්ධයයි.

මහණෙනි, තථාගතයන් වහන්සේ මනාව අවබොධ කොට දැන ගෙන... ලෝක ධර්මය කුමක් ද? මහණෙනි, රූපය... විඤ්ඤාණය, ලෝක ධර්මයකි. තථාගතයන් වහන්සේ එය මැනවින් අවබොධ කරති... උඩුකුරු කරති. මහණෙනි, තථාගතයන් වහන්සේ මෙසේ කියද්දී දේශනා කරද්දී... උඩුකුරු කරද්දී යමෙක් නො දනී නම් නො දකී නම් මහණෙනි, අන්ධ, වූ ඇස් නැති, නො දන්නා නො දක්නා ඒ මෝඩ පෘථග් ජනයින්ට මම කුමක් කරම් ද?

මහණෙනි, දියෙහි හටගත් දියෙහි වැඩුණු උපුලක් හෝ රතු පියුමක් හෝ සුදු පියුමක් හෝ දියෙන් නැගී දියෙහි නො ගැටී තිබෙන්නාක් මෙන් තථාගතයන් වහන්සේ ලොව ඉපිද ලොව වැඩී ලොව මැඩ' ගෙන ලෝකයා සමඟ නො ගැටී වාසය කරන සේක.

3. ඵෙණපිණ්ඩූපම සූත්‍රය

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ අයොධ්‍යාවෙහි ගංගානදී තීරයෙහි වසති. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මේ ගංගානදිය මහපෙනපිඬක් ගෙන එන්නිය. ඇස් ඇත්තෙක් ඒ පෙන කැටිය දකී. සිතයි. නුවණින් පරීක්ෂා කරයි. දකින, සිතන, පරීක්ෂා කරන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි. නිහර සේම වැටහෙයි. කුමක් ද? මහණෙනි, පෙන පිඬෙහි හරයක් තිබේ ද?

මහණෙනි, එමෙන් අතීත අනාගත වර්තමාන.. යම් රූපයක් වෙයි ද, භික්ෂුව එය දකියි. සිතයි. නුවණින් පරීක්ෂා කරයි. දකින, සිතන,පරීක්ෂා කරන සේ ම වැටහෙයි. මහණෙනි, කුමක් ද? රූපයෙහි හරයක් තිබේ ද?

මහණෙනි, යම් සේ සරත් කාලයෙහි මහපොද ඇති වැහි වසිද්දී දියෙහි මහදිය බුබුළු උපදී. නැතිත් වෙයි. ඇස් ඇති මිනිසෙක් ඒ දිය බුබුළු දකියි. සිතයි, පරීක්ෂා කරයි. දකින සිතන, පරීක්ෂා කරන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි. බොල් වූවක් සේ ම වැටහෙයි. නිහර සේ ම වැටහෙයි. කිම මහණෙනි, දිය බුබුළෙහි හරයක් තිබේ ද?

එමෙන් මහණෙනි, අතීත අනාගත වර්තමාන.. යම් වේදනාවක් වෙයිද භික්ෂුව එය දක.... දකින.. ඔහුට නිහර සේ ම වැට හෙයි. කිමෙක් ද මහණෙනි, වේදනාවෙහි හරයක් තිබේ ද?

මහණෙනි, ග්‍රීෂ්මකාලයේ අවසන් මාසයේ මද්දහනේ යම් සේ මිරිඟු සැලේ ද, ඇස් ඇති මිනිසෙක් එය දකී.. දකින.. ඔහුට... නිහර සේ ම වැටහෙයි. මහණෙනි, මිරිඟුවෙහි කිම හරයක් තිබේ ද? එමෙන් මහණෙනි, අතීත අනාගත වර්තමාන.... යම් සංඥාවක් වෙයි ද භික්ෂුව එය දකී.. දකින... ඔහුට නිහර සේ ම වැටහෙයි. මහණෙනි, කිම, සංඥාවෙහි හරයක් තිබේ ද?

මහණෙනි, යම් සේ හරයෙන් වැඩ ඇති හර සොයන, හර සෙවීමෙහි නිරත මිනිසෙක් තියුණු පොරවක් ගෙන කැලැවට වදී. ඔහු එහි ඇද නැති නාඹුල් නො පීදුණ කෙසෙල් කඳක් දකියි. ඔහු එය මුලින් කපයි. අගිනුත් කපයි. අග කපා පතුරු ගලවයි. ඔහු එහි පතුරු ගසන්නේ ඵලයවත් නො ලබයි. හරයක් කොයින් ද? ඇස් ඇති මිනිසෙක් ඒ කෙසෙල් කඳ දකියි. සිතයි, විමසයි, දකින.. ඔහුට... නිහර සේ ම වැටහෙයි. මහණුනි, කිම, කෙසෙල් කඳෙහි හරයක් තිබේ ද? එමෙන් මහණෙනි, අතීත අනාගත වර්තමාන යම් සංස්කාරයක් ඇද්ද, භික්ෂුව එය දකියි... දකින... ඔහුට එය නිහර සේ ම සිතෙයි. මහණෙනි, කිම සංස්කාරයෙහි හරයක් තිබේ ද?

මහණෙනි, යම් සේ විජ්ජාකාරයෙක් හෝ විජ්ජාකරයකු ගේ ගෝලයෙක් හතරමං සන්ධියක මායාවක් දක්වයි. එය ඇස් ඇති මිනිසෙක් දකියි... දකින.. ඔහුට එය නිහර සේ ම වැටහෙයි. මහණෙනි, මායාවෙහි ඇති හරය කුමක් ද? එමෙන් මහණෙනි, අතීත අනාගත වර්තමාන යම් විඤ්ඤාණයක් වෙයිද, භික්ෂුව එය දකියි... දකින.. ඔහුට එය නිහර සේ ම වැටෙහෙයි. මහණෙනි, කිම විඤ්ඤාණයෙහි හරයක් තිබේ ද?.

මහණෙනි, මෙසේ දකින ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත්... විඤ්ඤාණයෙහිත් කලකිරෙයි... රහත් බව සඳහා අනිකක් නැකැයි නුවණින් දැන ගනියි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදරා මෙසේත් වදළහ.

රූපය පෙනපිඩක් බඳුය. වේදනා දියබුබුළක් සමානය. සංඥාව මිරිඟුවක් මෙනි, සංස්කාර කෙසෙල් ගසක් සමානය. විඥානය මායාවක් වැන්නැයි සූර්යබන්ධු බුදුරජාණන් වහන් සේ වදාළ සේක.

යමෙක් එය නුවණින් දකී ද, යම් යම් පරිදි එය සිතයිද, නුවණින් පරීක්ෂා කරයි ද, හිස් වූවක් බොල් වූවක් වෙයි.

මහාප්‍රාඥයන් වහන්සේ විසින් දෙසූ, ගැරහිය යුතු මේ කය, කරුණු තුනක ඇවෑමෙන් විසි කොට දමන රූපය ආයුෂ, උෂ්ණ, විඥාන යම් දක මේ කය හැර දමයි ද එකල අහක දමූ එය පණුකෘමීන්ට බත්ව අචෙතනව සයනය කරයි.

මේ ප්‍රවෙණිය මෙසේ ය. මේ විඥානය මෝඩයන් කතා කරවන මායාවකි. පංච ස්කන්ධය වධකයෙකැයි කියන ලදි මෙහි සාරයක් නැත.

පටන්ගත් වීර්යය ඇති භික්ෂු නම රැදවල් මනා නුවණින් සිහි පෙරදැරිව ස්කන්ධ මෙසේ බැලිය යුතුය.

අච්චුත නම් නිවන පතන්නා සියලු සංයොජන දුරු කළ යුතු ය. තමාට පිහිට විය යුතු ය. හිස ගිනි ගත්තකු මෙන් ක්‍රියා කළ යුතු ය.

4. ගොමය පිණ්ඩ සූත්‍රය

පසෙක් හුන් ඒ භික්ෂු නම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, යම් රූපයක්... විඥානයක් නිත්‍යව, ඒකාන්තව, නො පෙරළෙනසුලු ස්වභාව ඇතිව සදකාලික වස්තු හා සමානව පවතී නම් එබඳු රූපයක්... විඥානයක් ඇත්ද"යි මෙය සැලකළේය "භික්ෂු නම, යම් රූපයක්... විඥානයක් නිත්‍යව.. සදකාලිකවස්තු හා සමානව පවතී නම් එබඳු රූපයක්... විඥානයක් නැත."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගොමපිඩු ස්වල්පයක් අතින් ගෙන ඒ භික්ෂුවට "භික්ෂු නම, නිත්‍ය, ස්ථිර සදකාලික නො වෙනස් වන ගති තිබෙන මෙතරම් වූත්, ඉපදීම ලැබූ ආත්මභාවයක් නැත. භික්ෂු නම, නිත්‍ය... ආත්ම භාවය ලැබීමක් තිබේ නම් මනාව දුක්

නැසීම පිණිස මාර්ග බ්‍රහ්මචර්ය වාසය පනවන්නේ නැත. භික්ෂු නම, නිත්‍ය... ආත්ම භාවය ලැබීමක් නැති නිසා මනාව දුක් නැසීම පිණිස මාර්ග බ්‍රහ්මචර්ය වාසය පනවයි.

භික්ෂු නම, පෙර පුවතක් කියමි. මම ඔටුනු පළන් ක්ෂත්‍රිය රජෙක් විමි. ඔටුනු පළන් ක්ෂත්‍රිය රජකු වූ ඒ මට කුසාවතී රාජධානිය ප්‍රධාන නගර අසූහාර දහසක් විය. මට ධර්මප්‍රාසාදය ප්‍රධාන ප්‍රාසාද අසූහාර දහසක් විය. මහාව්‍යුහ කූටාගාරය ප්‍රධාන කූටගාර අසූහාර දහසක් විය. දළමුවා, හරමුව, රන්මුවා, රිදීමුවා, සුදු එළුලොම්මුවා පලස් දමූ, කෙසෙල් මුවසම්මුවා උතුම් ඇතිරිලි ඇතුරු උඩ රතුවියන් බැඳි, දෙපස තැබූ රතු කොට්ට ඇති පර්යංක අසූහාර දහසක් විය. රන් අබරණ, රන්දද ඇති රන්දලින් වැසූ උපොසථ ඇත්රජ ප්‍රමුඛ අසූහාර දහසක් ඇත්තු සිටියහ. රන් අබරණ රන්දද ඇති රන්දලින් වැසූ වලාහක අස්රජ ප්‍රධාන අශ්වයෝ අසූහාර දහසක් සිටියහ. රන්අබරණ, රන්දද ඇති රන්දලින් වැසූ රථ අසූහාර දහසක් විය. මණිරත්නය ප්‍රධාන මාණික්‍ය අසූහාර දහසක් විය. සුභද්‍ර දෙවිය ප්‍රධාන සත්‍රිහු අසූහාර දහසක් වූහ. මට අනුකූල පුත්‍රරත්නය ප්‍රමුඛ ක්ෂත්‍රියයෝ අසූහාර දහසක් වූහ. දුහුල් අතුරුණු ඇති රිදීමුවා දෝනා බඳුන් ඇති කිරිදෙන්නු අසූහාර දහසක් වූහ. සියුම් කොමුපිළි, සියුම් කසීසළු, සියුම් කම්බිලි, සියුම් කපුපිළි අසූහාර දහසක් විය. උදේ හවස බත් එළවීම කරනු ලැබූ බත්තලි අසූහාර දහසක් විය.

භික්ෂු නම, ඒ සුවාසූ දහසක් නගර අතුරෙන් මා විසූ එකම නගරය කුසාවතී රාජධානියයි. මා විසූ එකම ප්‍රාසාදය ධර්ම ප්‍රාසාදය යි. මා විසූ එකම කූටාගාරය මහාව්‍යුහයයි. පාවිච්චි කළ එකම පර්යඩ්කය දළමුවා හෝ හරමුවා හෝ රන්මුවා හෝ රිදීමුවා හෝ වෙයි. මා නැගි ඇතා උපොසථ ඇත් රජය. එකම අස් රජ වලාහක අශ්වරාජයා යි. එකම රථය වෛජයන්ත රථයයි.

මට උවටැන් කළ එකම ස්ත්‍රිය ක්ෂත්‍රිය හෝ වෙලාමික වෙයි. එකම වස්ත්‍ර යුගලය සියුම් කොමුපිළි, සියුම් කසීසළු, සියුම් කපුපිළි හෝ වෙයි. එකම අහර තලිය නැලියක පමණ බතුත් ඊට අනුරූප සූපත් ගන්නා හැළියයි.

භික්ෂු නම, මෙසේ ඉක්ම ගිය ඒ හැම සංස්කාරම නැති විය. වෙනස් විය. භික්ෂු නම, මෙසේ සංස්කාර අනිත්‍යයි. සථිර නො වෙයි. සැනසිලි නැත්තේ වෙයි. භික්ෂු නම, සියලු සංස්කාරවල කලකිරෙන්නට අතිශයින් සුදුසුමයි. නො ඇලෙන්නට සුදුසුමයි. මිදෙන්නට සුදුසුමයි.

5. නඛසිඛොපම සූත්‍රය

පසෙක හුන් ඒ භික්ෂු නම 'ස්වාමීනි, යම් රූපයක්... විඤ්ඤාණයක් නිත්‍ය සථිර සදකාලික නො වෙනස්වන සභාවය ඇත්තේ ද සදකාලික වස්තු භා සමානව පවතී ද එබඳු රූපයක්... විඤ්ඤාණයෑ කිබේද'යි සැලකළේය.

භික්ෂු නම, යම් රූපයක්... විඤ්ඤාණයක්... සදකාලික වස්තු භා සමව පවතී ද එබුදු රූපයක්... විඤ්ඤාණයක් නැත්තේ ම ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිය අඟින් පස් ටිකක් ගෙන ඒ භික්ෂු නමට 'භික්ෂු නම, යම් රූපයක්... විඤ්ඤාණයක්.. සමව පවතී ද එවැනි මෙ තරම්වත් රූපයක්... විඤ්ඤාණයක් නැත. භික්ෂු නම, ඉදින් නිත්‍ය වූ... රූපයක්... විඤ්ඤාණයක් වී නම් මනාව දුක් නැසීම සඳහා මේ බඹසර විසීම පනවන්නේ නැත. යම් හෙයකින් නිත්‍ය වූ.. රූපයක්, විඤ්ඤාණයක් නැත් ද එබැවින් මනාව දුක් නැසීම සඳහා මේ බඹසර විසීම වෙයි.

භික්ෂු නම, කුමක් සිතන්නේහි ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? භික්ෂු නම, එබැවින් මෙහි ලා.. මෙය මගේ ආත්මය නො වෙයි දකිය යුතුය. එසේ දක්නා ආර්ය ශ්‍රාවකයා.. මේ රහත් බව පිණිස අනිකක් නැතැයි දනියි.

6. සුද්ධික සූත්‍රය

සසෙක හුන් ඒ භික්ෂු නම 'ඛාමීනි, යම් රූපයක්... විඤ්ඤාණයක් සමව පවතී ද එබඳු රූප... විඤ්ඤාණයක් නිබේදයි සැලකළේය. භික්ෂු නම, යම් රූපයක්... විඤ්ඤාණයක් නිත්‍යව.. සදකාලික වස්තු භා සමව පවතී ද එබඳු රූපයක්... විඤ්ඤාණයක් නැත්තේ ම ය.

7. ගද්දුලභද්ද සූත්‍රය

මහණෙනි, අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, නැවත නැවත දුවන, නැවත නැවත සැරිසරන සතුන් ගේ මේ සසර නො දන්නා අක්මුල් ඇත්තේ ය. මුල් කෙළවර නො පෙනෙයි. මහණෙනි, යම් හෙයකින් මේ මහමුහුදු සිදෙන්නේ ද වියලෙන්නේ ද, නැති වන්නේ ද එබඳු කාලයක් වන්නේ ය. මහණෙනි, අවිද්‍යාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු, දුවන සැරිසරන සතුන් ගේ දුක් කෙළවර කිරීම මම නො කියමි. මහණෙනි, යම් කලක මේ සිනෙරු පර්වත රාජයා දැවේ ද වැනසේ ද නැතිවේ ද එබඳු කාලයක් වන්නේ ය. මහණෙනි, අවිද්‍යාවෙන් වැසුණු... සතුන්ගේ දුක් කෙළවර කිරීම මම නො කියමි. මහණෙනි, යම් දක මේ මහපොළව දැවේ ද, නැති වේ ද වැනසේ ද එබඳු කාලයක් වන්නේ ය. මහණෙනි, අවිද්‍යාවෙන් වැසුණු.. සතුන්ගේ දුක් කෙළවර කිරීම මම නො කියමි.

මහණෙනි, බලවැදුමින් බැඳි ඝනඛයා දැඩි වූ උළක හෝ කණුවක බඳිනා ලද්දේ එම උළ හෝ ටැඹ හෝ වටේ නැවත නැවත දිවේ ද වටේ කරකැවේ ද එමෙන් ආර්යයන් නො දක්නා... නුගත් පෘථග් ජනයා රූපය... විඤ්ඤාණය ආත්මය වශයෙන් දකී. ආත්මය රූපවත්... විඤ්ඤාණවත් කොට දකී. ආත්මයෙහි ලා රූපය... විඤ්ඤාණය දකී. රූපයෙහි ලා ආත්මය දකී. මහු රූපය... විඤ්ඤාණය ම අනුව දුවයි. රූපය... විඤ්ඤාණය අනුව ම පෙරළෙයි. මහු රූපය... විඤ්ඤාණය අනුව ම දුවන්නේ, පෙරළෙන්නේ රූපයෙන්... විඤ්ඤාණයෙන් නො මිදෙයි. ජාතියෙන් ජරාමරණයෙන් සොකයෙන් වැලපීමෙන් දුකෙන් දෙමනසින් උපායාසයෙන් නො මිදෙයි. දුකින් නො මිදේය යි කියමි.

මහණෙනි, ආර්යයන් දකින.. උගත් ආර්ය ශ්‍රාවකයා රූපය... විඤ්ඤාණය ආත්ම වශයෙන් නො දකී.. මහු රූපය... විඤ්ඤාණය අනුව නො දුවයි. නො පෙරළෙයි. රූපය... විඤ්ඤාණය අනුව නො දුවන්නේ නො පෙරළෙන්නේ රූපයෙන්... විඤ්ඤාණයෙන් මිදෙයි... දුකින් මිදේය යි කියමි.

8. දුනිය ගද්දූලබද්ධ සූත්‍රය

මහණෙනි, මේ සංසාරය නො පෙනෙන අක්මුල් ඇත්තේ ය. අවිද්‍යාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුණු දුවන සැරිසරන සතුන් ගේ මුල් කෙළවර නො පෙනෙයි. මහණෙනි, යම් හෙයකින් බලවත්තු බැඳුණු සුනඛයෙක් දැඩි උළක හෝ කණුවක බදනා ලද්දේ ද, ඉදින් ඔහු යන්නේ නම් ඒ උළ හෝ වැඹ ළඟට ම යයි, ඉදින් සිටී නම් ඒ උළ හෝ කණුව ළඟම සිටී. හිඳී නම් ඒ උළ හෝ කණුව ළඟම හිඳී. ලඟී නම් ඒ උළ හෝ කණුව ළඟම ලඟී.

මහණෙනි, එමෙන් නුගත් පෘථග්ජනයා රූපය... විඤ්ඤාණය මගේය.. දකී. ඔහු යන්නේ නම් පංච උපාදාන ස්කන්ධ වෙත ම යැ. සිටී නම් පංච උපාදාන ස්කන්ධ වෙත ම සිටී. හිඳී නම් පංච උපාදාන. ස්කන්ධ වෙත ම හිඳී. නිදයි නම් පංච උපාදාන ස්කන්ධය වෙත ම නිදයි.

එබැවින් මහණෙනි, භික්ෂු තම විසින් බොහෝ කලක් මේ සිත රාගයෙන් ද්වේෂයෙන් මොහයෙන් කෙලෙසුණේය යි නිතර තමා ගේ සිත ප්‍රත්‍යවෙක්ෂා කළ යුතුය. මහණෙනි, සිත කෙලෙසීමෙන් සත්තු කෙලෙසෙති. සිත පිරිසිදු වීමෙන් සත්තු පිරිසිදු වෙති. මහණෙනි, නුඹලා වරණවිත්‍රය දක තිබේ ද? සවාමීනි, එහෙමයි.

මහණෙනි, ඒ වරණවිත්‍රයත් සිතින් ම විසිතුරු කරන ලද්දකි. මහණෙනි, ඒ වරණවිත්‍රයටත් වඩා සිත විසිතුරුයි. එබැවින් මහණෙනි, භික්ෂු තම විසින් මේ සිත බොහෝ කලක් රාගයෙන් දෝෂයෙන් මෝහයෙන් කෙලෙසුණේය යි තමා ගේ සිත මොහොතක් පාසා ප්‍රත්‍යවෙක්ෂා කළ යුතුයි. මහණෙනි, සිත කෙලෙසීමෙන් සත්තු කෙලෙසෙති. සිත පිරිසිදුවීමෙන් සත්තු පිරිසිදු වෙති.

මහණෙනි, මේ තිරිසන්ගත සත්තු යම් ආකාර වෙත් ද එතරම් විසිතුරු එකම කොටසක් මම නො දකිමි. මහණෙනි, ඒ තිරිසන්ගත සත්තු ද සිතින් ම විසිතුරු වෙති. මහණෙනි. ඒ තිරිසන්ගත සතුන්ටත් වඩා සිත විසිතුරුය. මහණෙනි, එබැවින් මෙහි ලා භික්ෂු තම විසින්... ප්‍රත්‍යවෙක්ෂා කළ යුතුයි.... සිත පිරිසිදු වීමෙන් සත්තු පිරිසිදු වෙති.

මහණෙනි, රජකයෙක් හෝ සිත්තරෙක් හෝ සායම්, ලාකඩ, කහ, නිල්, මදට පාට ඇති විට හොඳට මට්ටම් වූ සුවරුවක, බිත්තියක, රෙදිකඩක සත්‍රී රූපයක් හෝ පුරුෂ රූපයක් සියලු අහපසඟින් යුක්තව මනාව නිර්මාණය කරන්නේ ද එසේ නුගත් පෘථග් ජනයා නිපදවන්නේ රූපයම... විඤ්ඤාණයම නිපදවයි. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යය සවාමීනි,.. මහණෙනි, එහෙයින් මෙහිලා මෙසේ දක්නේ... මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

9. වාසිජටොපම සූත්‍රය

මහණෙනි, දන්නාහට දක්නාහට මම ආස්‍රවක්ෂය කියමි නො දන්නහුට නො දක්නාහට නො කියමි. මහණෙනි, කුමක් දක්නහුට කුමක් දන්නාහට ආස්‍රව ක්ෂය වේ ද ? රූපය... විඤ්ඤාණය මෙසේය, රූපය... විඤ්ඤාණයේ නැසීම මෙසේ ය. මහණෙනි, මෙසේ දන්නා මෙසේ දක්නා පුද්ගලයාට ආස්‍රව ක්ෂය වෙයි.

මහණෙනි, භාවනානුයොගයෙහි යෙදී සිටින භික්ෂු නමට "මගේ සිත දැඩිව අල්වා නො ගෙන ආස්‍රවවලින් මිදෙන්නේ නම් යෙහෙකැ" යි මෙබඳු කැමැත්තක් ඇති වෙයි. එහෙත් ඔහු ගේ සිත දැඩිව අල්වා නො ගෙන ආස්‍රවවලින් නො මිදෙයි. ඒ කුමක් නිසා ද? නො වැඩූ නිසාය යි කිව යුතු ය. කුමක් නො වැඩූ නිසා ද? සතර සතිපට්ඨාන නොවැඩූ හෙයිනි. සතර සම්‍යක් ප්‍රධන් නො වැඩූ හෙයිනි. සතර ඍද්ධිපාද නො වැඩූ හෙයිනි. පඤ්චෙන්ද්‍රිය නො වැඩූ හෙයිනි. පංචබල නො වැඩූ හෙයිනි. සප්තබොද්ධ්‍යඞ්ග නො වැඩූ හෙයිනි. අරිඅටහිමහ නො වැඩූ හෙයිනි.

මහණෙනි, යම් සේ කිකිළියකට බිත්තර අටක් හෝ දහයක් හෝ දෙළහක් හෝ වෙයි ද? කිකිළිය ඒ උඩ ලැග මනාව නො රැක්කොත්, උණුසුම් නො කොළොත්, කුකුළුගද නො ගැන්වුව හොත් ඒ කිකිළියට මගේ කුකුළු පැටව් පා නිය අගින් හෝ මුව තුඩින් හෝ බිත්තර පළාගෙන සුවසේ නික්මෙත් නම් හොඳය'යි ආශාව

ඇති වුවක් ඒ පැටව් පා නිය අඟින් හෝ මුවතුඩින් හෝ බිත්තර පළා ගෙන යුවසේ නික්මෙන්ට අසමත් වෙති. මහණෙනි, ඒ කුමක් නිසා ද? මහණෙනි, එසේ කිකිළිය ඒ බිත්තර මනාව නො රැක්ක හෙයිනි. උණුසුම් නො කළ හෙයිනි. කුකුළුගද නො ගැන්වූ හෙයිනි.

මහණෙනි, එමෙන් භාවනානුයොගයෙහි යෙදුණු භික්ෂු නමට මගේ සිත උපාදන රහිතව ආස්‍රවවලින් මිදුණොත් යනපතැයි යන කැමැත්ත ඇති වුවත් ඔහු ගේ සිත ආස්‍රවවලින් උපාදන රහිතව නො මිදෙයි ඊට හේතු කුමක් ද... අරිඅටඟිමග නො වැඩූ නිසා ය.

මහණෙනි, භාවනානුයොගී භික්ෂු නමට "මගේ සිත උපාදන රහිතව ආස්‍රවවලින් මිදුණොත් යනපතැ'යි යන කැමැත්තක් නූපන්නත් ඔහුගේ සිත ආස්‍රවවලින් මිදෙයි. ඒ කුමක් නිසා ද? වඩන ලද නිසාය යි කිව යුතු ය. කුමක් වැඩූ නිසා ද? සතරසතිපට්ඨාන.. අරිඅටඟිමඟ වැඩූ නිසාය.

මහණෙනි, යම් සේ කිකිළියකට බිත්තර අටක් හෝ.. වෙයි. එවා කිකිළිය මනාව රකිනා ලද්දේ වෙයි... ඒ කිකිළියට මගේ පැටවූ... මැනවැ'යි මෙබඳු අදහසක් නූපන්නත්... සුව සේ උපදිති. ඒ කුමක් නිසා ද?... මනාව වැඩූ හෙයිනි.

මහණෙනි, එමෙන් භාවනානුයෝගී භික්ෂු නමට.. ආස්‍රවවලින් මිදෙයි. කුමක් නිසා ද? වැඩූ නිසාය යි කිව යුතු ය. කුමක් වැඩූ නිසා ද?.. අරිඅටඟිමඟ වැඩූ නිසා ය.

මහණෙනි, යම් සේ වඩුවකු ගේ හෝ වඩු ගෝලයකු ගේ වැම්ටෙහි ඇහිලි පාරවල් හෝ මහපට ඇඟිලිපාරවල් හෝ දක්නට ලැබෙයි. ඔහුට මගේ වැම්ට අද මෙතරම් ගෙවුණේ ය. ඊයේ මෙතරම් ගෙවුණේ ය. පෙරේදා මෙතරම් ගෙවුණේය යි නො දනෙයි. එහෙත් ඔහුට ගෙවුණු පසු ගෙවුණු බව දනෙයි. මහණෙනි, එමෙන් භාවනානුයොගී භික්ෂු නමට ආස්‍රව අද මෙපමණ ක්ෂය විය. ඊයේ මෙපමණ ක්ෂය විය. පෙරේදා මෙපමණ ක්ෂය වීය යි දැනුමක් නො වෙයි. එහෙත් ක්ෂය වූ පසු ක්ෂය වීය යි දැනුම වෙයි.

මහණෙනි, වේවැල් බැම්මෙන් බඳින ලද හය මසක් දියේ තිබුණ හේමන්ත කාලයෙහි ගොඩට ගත් මුහුදු නැවක අවුසුළං කැ බැමි වැසි කල වැස්සෙන් තෙමී ලෙහෙසියෙන් දුබල වෙයි. දිරායයි. මහණෙනි, එමෙන් භාවනානුයොගීව වසන භික්ෂු නම ගේ සංයොජන ඉතා පහසුවෙන් සංසිඳෙයි. දිරාපත් වෙයි.

10. අනිච්චසඤ්ඤා සූත්‍රය

මහණෙනි, වඩන ලද බහුලව කරන ලද අනිච්ච සඤ්ඤාව සියලු කාමරාගය ක්ෂය කරයි. සියලු අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ ගොවියෙක් සරත් කාලයෙහි මහනහුලෙන් සාත්තේ පැකිර ගිය සියලු මුල් කඩමින් සායි ද, එමෙන් වඩන ලද බහුලව කරන ලද අනිච්චසඤ්ඤාව සියලු කාමරාගය ක්ෂය කරයි. සියලු රූප රාගය ක්ෂය කරයි. සියලු භව රාගය ක්ෂය කරයි. සියලු අවිද්‍යාව ක්ෂය කරයි. සියලු අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි.

මහණෙනි, යම් සේ බබුස්තණ කපන්නෙක් බබුස්තණ කපා අඟින් අල්වා යටට සලයිද පොළොයිද, පොළා පයෙක දමයි ද එමෙන් වඩන ලද බහුලව කරන ලද අනිච්චසඤ්ඤාව සියලු කාම රාගය. අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ අඹකැනක නැට්ට කැපූ කල නැට්ටෙහි ඇති සියලු අඹ ඒ අනුව වැටේ ද එමෙන් වඩන ලද... සියලු අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ කූටාගාරයක යම් කිසි පරාළ තිබේ ද ඒ සියල්ල කැණිමඩලට ගොස් කැණිමඩලට යොමුව කැණිමඩල අනුව රැස්ව පවතී ද, ඒ පරාළවලට කැණිමඩල අග්‍රයයි කියනු ලැබේ. එමෙන් මහණෙනි, වඩන ලද.. සියලු අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි.

මහණෙනි, යම් සේ යම් මුල් සුවඳ තිබේද කලුඅඟිල් මුල් සුවඳ එයින් අග්‍ර වෙයි. මහණෙනි, එසේ වඩන ලද.. අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ යම් හර සුවඳ

තිබේද රන්සදුන් පයින් අග්‍ර වෙයි. මහණෙනි, එමෙන් වඩන ලද.. අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ යම් මල් සුවඳ තිබේද දැසමන් එයින් අග්‍ර වෙයි. එමෙන් වඩන ලද... අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ යම් කුඩා රජවරු සිටිත් ද ඒ සියලු දෙන චක්විති රජුට අනුකූල වෙති. චක්විතිරජ ඔවුන්ගෙන් අග්‍රයයි කියනු ලැබේ. එමෙන් වඩන ලද... අස්මිමානය ක්ෂය වෙයි. සහමුලින් නසයි. මහණෙනි, යම් සේ තාරකාවල යම් ඵලියක් තිබේ ද ඒ සියලු ආලෝකය චන්ද්‍රාලෝකයෙන් දහසයෙන් පංගුවකුත් නො වටී. එයින් චන්ද්‍රාලෝකය අග්‍රය යි කියනු ලැබේ. එමෙන් වඩන ලද.. අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි.

මහණෙනි, යම් සේ සරත් කාලයෙහි වලාකුළු, වැස්ස පහ වූ කල්හි ඉර අහසට නැගෙන්නේ අහස්ගත සියලු අඳුර නසා බබළයි ද, දීප්තිමත් වෙයි ද, ඵලිය කරයි ද එමෙන් වඩන ලද... අස්මිමානා ය ක්ෂය කරයි. සහමුලින් නසයි.

මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුලව කරන ලද අනිච්චසඤ්ඤාව... සහමුලින් නසයි ද? රූපය... විඤ්ඤානය මෙසේය. රූපයේ විඤ්ඤානයේ ඇති වීම මෙසේ ය. රූපය... විඤ්ඤානයේ නැති වීම මෙසේය. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුලව කරන ලද අනිච්චසඤ්ඤාව අස්මිමානය ක්ෂය කරයි. සහමුලින් නසයි.

3. උපරි පණ්ණාසකය

1. අනත්ත වර්ගය

1. අන්ත සූත්‍රය

මහණෙනි, මේ අනත්ත[1] සකරකි. කවර සතරක් ද? සක්කාය අන්තය, සක්කාය සමුදය අන්තය, සක්කාය නිරොධ අන්තය, සක්කාය නිරොධ ගාමිනි පටිපද අන්තයයි. මහණෙනි, සක්කාය අන්තය කුමක් ද? පංච උපාදන ස්කන්ධයයි කිව යුතු යි. කවර පහක් ද? මෙසේයි. රූප උපාදන ස්කන්ධය, වෙදනා උපාදන ස්කන්ධය, සංඥා උපාදන ස්කන්ධය, සංස්කාර උපාදන ස්කන්ධය, විඤ්ඤාන උපාදන ස්කන්ධය යි. මහණෙනි, මේ සක්කාය අන්තයයි කියනු ලැබේ.

මහණෙනි, සක්කායසමුදය අන්තය කුමක් ද? පුර්නභවය ඇති කරන නන්දිරාගය සහිත ඒ ඒ තන්හි ඇලීම ඇති කරන යම් ඒ තණ්හාවක් තිබේ ද? එනම් කාමතණ්හා භවතණ්හා විභවතණ්හාවයි. මහණෙනි, මේ සක්කාය සමුදය අන්තයයි.

මහණෙනි, සක්කාය නිරොධ අන්තය කුමක් ද? ඒ තණ්හාවේ ම සහමුලින් දුරුකිරීමක්, නැසීමක්, හැරදැමීමක්, නො ඇල්මක් වේ ද මේ සක්කායනිරොධ අන්තයයි කියනු ලැබේ.

මහණෙනි, සක්කායනිරොධගාමිනී පටිපද අන්තය කුමක් ද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ය. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධිය යි. මහණෙනි, මේ සක්කායනිරොධගාමිනී පටිපද අන්තයය යි. කියනු ලැබේ. මේ මහණෙනි, අන්ත සතරයි.

---

1. කොටස්

2. දුකඛ සූත්‍රය.

මහණෙනි, ඔබලාට දුකත්, දුකට හේතුවත්, දුක් නැති කිරීමත්, දුක් නැති කිරීමේ මහත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, දුක කුමක් ද? පංච උපාදන ස්කන්ධය යි කිව යුතු යි. කුමන පහක් ද? රූප උපාදනස්කන්ධ... විඤාන උපාදනස්කන්ධය යි.

මහණෙනි, දුකට හේතුව කුමක් ද? පුනර්භවය ඇති කරන නන්දි රාගය සහිත ඒ ඒ තැන ඇලෙන යම් මේ තෘෂ්ණාවක් වෙයි ද? එනම් කාම තෘෂ්ණා, භව තෘෂ්ණා, විභව තෘෂ්ණාවයි. මහණෙනි, මේ දුක් ඇති වීමේ හේතුවයි.

මහණෙනි, දුක් නැති කිරීම කුමක් ද? ඒ මේ තණ්හාවේ ම යම් නිරවශෙෂ නිරොධයක්, දුරලීමක්, බැහැර කිරීමක්, මිදීමක්, නො ඇල්මක් වේ ද මහණෙනි, මේ දුක් නැසීම ය යි කියනු ලැබේ.

මහණෙනි, දුක් නැති කිරීමේ මහ කුමක් ද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම යි. එනම්, සම්මාදිට්ඨි... සම්මාසමාධිය යි. මහණෙනි, මේ දුක් නැසීමේ මහයි.

3. සක්කාය සූත්‍රය

මහණෙනි, ඔබලාට සක්කායත්, සක්කාය සමුදයත් සක්කාය නිරොධයත්, සක්කාය නිරොධගාමිනී පටිපදවත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, සක්කාය කුමක් ද? පංච උපාදන ස්කන්ධය යි කිව යුතු ය, කුමන පහක් ද? රූප... විඤානස්ඤධයයි. මහණෙනි, මේ සක්කාය යි කියනු ලැබේ.

මහණෙනි, සක්කාය සමුදය කුමක් ද? පුනර්භවය ඇති කරන යම් තණ්හාවක් වේද එනම්... විභව තණ්හාවයි. මේ සක්කාය සමුදය යි කියනු ලැබේ. සක්කාය නිරොධය කුමක් ද? ඒ තණ්හාවේ ම,.. නො ඇල්මක් වේ ද, මහණෙනි, මේ සක්කාය නිරොධය යි කියනු ලැබේ. මහණෙනි, සක්කාය නිරොධගාමිනී පටිපදව කුමක් ද? මේ අරි අටහි මහ ම ය. එනම්... සම්මාසමාධිය යි. මහණෙනි, මේ සකකාය නිරොධගාමිනී පටිපදවය යි කියනු ලැබේ.

4. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය

මහණෙනි, පිරිසිඳ දත යුතු ධර්මත්, පිරිසඳ දැනීමත්, පිරිසිඳ දත් පුද්ගලයාත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, පිරිසිඳ දත යුතු ධර්ම මොනවා ද? රූපය... විඤානය පිරිසිඳ දත යුතු ධර්මය යි. මහණෙනි, මේ පිරිසිඳ දතයුතු ධර්මයි.

මහණෙනි, පිරිසිඳ දැනීම කුමක් ද? යම් රාගය නැසීමක්, දෙවෂය නැසීමක්, මොහය නැසීමක් වෙයි ද, මහණෙනි, මේ පිරිසිඳ දැනීමය යි කියනු ලැබේ.

මහණෙනි, පිරිසිඳ දත් පුද්ගලයා කවරෙක් ද? රහතන් වහන්සේ යි කිව යුතු යි. මෙබඳු නම් ඇති මෙබඳු ගොත්‍ර ඇති යම් ආයුෂ්මත් කෙනෙක් වෙත්ද, මේ පිරිසිඳ දත් පුද්ගලයා යි කිව යුතු ය.

5. සමණ සූත්‍රය

මහණෙනි, මේ උපාදන ස්කන්ධ පහකි. කුමන පහක් ද? ඒ මෙසේ යි. රූප ස්කන්ධය.. විඤාන ස්කන්ධය යි. මහණෙනි, යම් ශ්‍රමණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ උපාදන ස්කන්ධවල ආස්වාදයක් ආදීනවත්, නිස්සරණයත් තතු සේ නො දනිත් නම් මහණෙනි, ඒ මේ මහණ බමුණෝ මහණ බමුණන් අතර මහණ බමුණුයයි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්වරු මහණ ඵලය හෝ බමුණු ඵලය ඉහාත්මයෙහි ම තුමූ ම හොඳින් දැන පසක් කොට ඊට පැමිණ වසන්නෝත් නො වෙති.

මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මේ උපාදන ස්කන්ධවල ආස්වාදයත්, ආදීනවත්, නිස්සරණයත් තතු සේ දනිත් ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහමණයෝ ශ්‍රමණයන් අතර ශ්‍රමණය යි ද බ්‍රාහමණයන් අතර බ්‍රාහමණය යි ද සම්මත වූවෝ වෙති. ඒ ආයුෂ්මත්වරු මහණකමේ ඵලයත් බමුණුකමේ ඵලයත් ඉහාත්මයෙහි ම තුමූ ම හොඳින් දැන පසක් කොට ඊට පැමිණ වසන්නෝත් වෙති.

6. දුතිය සමණ සූත්‍රය

මහණෙනි, මේ උපාදන ස්කන්ධ පහකි. කවර පහක් ද? රූප උපාදන ස්කන්ධය.. විඤ්ඤාන උපාදන ස්කන්ධයයි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ... මේ උපාදන ස්කන්ධවල ඇති වීම, නැති වීම, ආස්වාදය ආදීනව, නිස්සරණය තතු සේ නො දනික් ද,.. එළඹ වසන්නෝ නො වෙති. යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක්... දනිත් ද?... එළඹ වසන්නෝ වෙති.

7. සොතාපන්න සූත්‍රය

මහණෙනි, මේ උපාදන ස්කන්ධ පහකි.. මහණෙනි, යම් හෙයකින් ආර්ය ශ්‍රාවකයා මේ පංචොපාදන ස්කන්ධවල ඇති වීමත්, නැති වීමත්, ආස්වාදයත්, ආදීනවත්, නිස්සරණයත් තතු සේ දනි ද මහණෙනි, මේ ආර්ය ශ්‍රාවකයා සතර අපායේ නො වැටෙන නියත වශයෙන් ම සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වූවෙකැයි කියනු ලැබේ.

8. අරහන්ත සූත්‍රය

මහණෙනි, මේ උපාදන ස්කන්ධ පහකි. කවර පහක් ද? රූප උපාදන ස්කන්ධය... විඤ්ඤාන උපාදන ස්කන්ධයයි. මහණෙනි, යම් හෙයකින් භික්ෂූ තම මේ පංචඋපාදන ස්කන්ධවල ඇති වීමත් නැති වීමත් ආස්වාදයත් ආදීනවත් නිස්සරණයත් ඇති සැටියෙන් දන උපාදන රහිතව මිදුණේ ද මහණෙනි, මේ භික්ෂූ තම අර්හත්ය. ක්ෂීණාශ්‍රව ය. විසූ බඹසර ඇත්තේ ය. කළ කෘත්‍ය ඇත්තේ ය. බහා කැබූ බර ඇත්තේ ය. පැමිණි යහපත් අර්ථ ඇත්තේ ය. ක්ෂය වූ භව සංයොජන ඇත්තේ ය. මනාව දන මිදුණේය යි කියනු ලැබේ.

9. පඨම ඡන්දරාග සූත්‍රය

මහණෙනි, රූපයෙහි යම් ඡන්දයක්, යම් රාගයක්, යම් නන්දියක්, යම් තණ්හාවක් ඇත් නම් එය දුරු කරව්. මෙසේ ඒ

රූපය මූලුසුන් වූයේ කරටි කැපූ තල්ගසක් මෙන් කරන ලද්දේ නැවත හට නො ගන්නාක් කරන ලද්දේ මත්තෙහි නූපදනා බවට පත් කරන ලද්දේ ප්‍රහීණ වූවක් වෙයි. වෙදනාවෙහි... විඤ්ඤානයෙහි යම් ඡන්දයක්.. තණ්හාවක් ඇත් නම් එය දුරු කරව්. මෙසේ ඒ වෙදනා... විඤ්ඤාන.. ප්‍රහාණ වූවක් වෙයි.

10. දුතිය ඡන්දරාගසූත්‍රය

මහණෙනි, රූපයෙහි යම් ඡන්දයක්, යම් රාගයක් යම් නන්දියක්, යම් තණ්හාවක්, සිතේ යම් අධිට්ඨාන, අභිනිවෙස, අනුසය වන උපය උපාදන ඇත් නම් එය දුරු කරව්. මෙසේ ඒ රූපය මූලුසුන් වූයේ කරටි කැපූ තල් ගසක් මෙන් වූයේ නැවත හට නො ගන්නා බවට පත් වූයේ මත්තෙහි නූපදිනා සවභාව ඇත්තේ ප්‍රහීණ වූයේ වෙයි. වෙදනාවෙහි... විඤ්ඤාණයෙහි යම් ඡන්දයක්.. උපාදනයක් වෙයි ද එය දුරු කරව්. මෙසේ ඒ වෙදනා.. විඤ්ඤාන.. ප්‍රහීණ වූයේ වෙයි.

2. ධම්මකථික වර්ගය

1. අවිජ්ජා සූත්‍රය

පසෙක හුන් ඒ භික්ෂු නම ස්වාමීනි, අවිජ්ජා, අවිජ්ජාය යි කියනු ලැබේ. අවිද්‍යා නම් වෙයි ද? කොපමණකින් අවිද්‍යාගත වේදයි සැලකළේය. භික්ෂු නම, මෙහි නුගත් පෘථග්ජනයා රූපය... විඤ්ඤාණය නො දනී. රූප... විඤ්ඤාණයේ ඇති වීම නො දනී. රූප... විඤ්ඤාණයේ නැති වීම නො දනී. රූප...විඤ්ඤාණ නිරොධගාමිනී පටිපදව නො දනී. භික්ෂු නම, මේ අවිද්‍යාව යි. මෙපමණකින් අවිද්‍යාගත වූයේ වෙයි.

2. විජ්ජා සූත්‍රය

පසෙක හුන් ඒ භික්ෂු නම ්ස්වාමීනි, විජ්ජා විජ්ජායි කියනු ලැබේ. ස්වාමිනි, විජ්ජා කුමක් ද? කොපමණකින් විජ්ජාගතවේදයි සැලකළේය. භික්ෂු නම, මෙහි උගත් ආර්ය ශ්‍රාවකයා රූපය... විඤ්ඤාණය දනියි නම්, රූප... විඤ්ඤාණ සමුදය දනී නම්, රූප... විඤ්ඤාණ නිරොධය දනී නම්, රූප විඤ්ඤාණ නිරොධගාමිනිපටිපදව දනී නම් මේ විජ්ජායි කියනු ලැබේ. මෙපමණකින් විජ්ජාගතත් වෙයි.

3. පඨම ධම්මකථික සූත්‍රය

පසෙක හුන් ඒ භික්ෂු නම ්ස්වාමීනි, ධර්ම කථික, ධර්මකථික යි කියනු ලැබේ. ස්වාමීනි, කොපමණකින් ධර්මකථික වෙයි ද?්යි සැලකළේය. භික්ෂු නම, ඉදින් රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීම සඳහා, නො ඇලීම සඳහා නැති කිරීම සඳහා දහම් දෙසන්නේ නම් ඒ භික්ෂු නම ධර්ම කථිකය යි කීමට සුදුසුයි. භික්ෂු නම, රූපයෙහි... විඤ්ඤාණයෙහි කල කිරීම පිණිස, නො ඇල්ම පිණිස, නැති කිරීම පිණිස පිළිපන්නේ නම් ඒ භික්ෂු නම ධම්මානුධම්මපටිපන්න යයි

කීම සුදුසුයි. භික්ෂු නම, ඉදින් රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීමෙන්, නො ඇලීමෙන්, නැසීමෙන් උපාදන රහිතව මිදුණොත් ඒ භික්ෂු නම ඉහාත්මයෙහි නිවනට පැමිණියේ යයි කීමට සුදුසු යි.

4. දුතිය ධම්මකථික සූත්‍රය

ඒ භික්ෂු නම ස්වාමීනි, ධර්මකථික, ධර්මකථිකය යි කියනු ලැබේ. ස්වාමිනි, කොපමණකින් ධර්මකථික වේ ද, කොපමණකින් ධම්මානුධම්මපටිපන්න වේ ද, කොපමණකින් ඉහාත්මයෙහි නිවන් පැමිණියේ වෙයිදයි විවාළේය.

භික්ෂු නම, ඉදින් රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීම සඳහා නො ඇල්ම සඳහා දහම් දෙසයි නම් ඒ භික්ෂු නම ධර්මකථික යයි කීමට සුදුසුයි. භික්ෂු නම, රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීම සඳහා නො ඇල්ම සඳහා නැති කිරීම සඳහා පිළිපන්නේ නම් ඒ භික්ෂු නම ධම්මානුධම්මපටිපන්න යයි කීමට සුදුසුයි. භික්ෂු නම,රූපයෙහි.. විඤ්ඤාණයෙහි කලකිරීමෙන් නො ඇල්මෙන්, නැති කිරීමෙන් දැඩිව නො ගෙන මිදුණේ ද ඉහාත්මයෙහි නිවනට පැමිණි භික්ෂු නමැයි කීමට සුදුසු යි.

5. බන්ධන සූත්‍රය

මහණෙනි, ආර්යයන් නො දක්නා.. නුගත් පෘථග් ජනයා රූපය... විඤ්ඤාණය ආත්මය යි දකියි. ආත්මය රූපවත්... විඤ්ඤාණවත් කොට දකියි. ආත්මයෙහි රූපය... විඤ්ඤාණය දකියි. රූපයෙහි... විඤ්ඤාණයෙහි ආත්මය දකියි. මහණෙනි, මේ නුගත් පෘථග් ජනයා රූප... විඤ්ඤාන බැම්මෙන් බැඳුණේ අභ්‍යන්තර බාහිර බැම්මෙන් [1]

1. උඩුම්භාගිය ඕරම්භාගිය සංයෝජන

බැඳුණේ එතෙර තො දක්තේ පර කෙර නො දක්තේ උපදියි. බැඳි මිය යයි. බැඳී මෙලොවින් පරලොවට යතැයි කියනු ලැබේ.

මහණෙනි, ආර්යයන් දකින... උගත් ආර්ය ශ්‍රාවකයා රූපය... විඳානය ආත්මය යි නොදකී යි... මහණෙනි, මේ උගත් ආර්ය ශ්‍රාවකයා රූප... විඳාන බැම්මෙන් නො බැඳුණේ අභ්‍යන්තර බාහිර බැම්මෙන් නො බැඳුණේ එතෙර දක්තේ පර තෙර දක්තේ දුකින් මිදුණේය යි කියමි.

6. පඨම පරිපුච්ඡිත සූත්‍රය

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඳානය මෙය මගේ ය. ඒ මම වෙමි යි දකින්නහු ද? "ස්වාමීනි, එය එසේ නො වෙයි.

මහණෙනි, හොඳයි, රූපය... විඳානය "මේ මගේ නො වෙයි ඒ මම නො වෙමි"යි මෙය ඇති සැටියෙන් හොඳ නුවණින් දක්ක යුතුය. මහණෙනි, මෙසේ දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඳානයෙහි කලකිරෙයි.. මේ රහත් බව සඳහා අනිකක් නැකැයි දනියි.

7. දුතිය පරිපුච්ඡිත සූත්‍රය

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඳානය "මෙය මගේ නො වෙයි. මේ මම නො වෙමි යි දකින්නහු ද? "ස්වාමීනි, එසේය. මහණෙනි, හොඳයි රූපය... විඳානය මෙය මගේ නො වෙයි. ඒ මම නො වෙමි"යි මෙය ඇති සැටියෙන් මනා නුවණින් දක්ක යුතුය. මහණෙනි, මෙසේ දක්නා උගත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඳානයෙහි කලකිරෙයි.. මේ රහත් බව සඳහා අනිකක් නැකැයි දකියි.

8. සඤ්ඤොජනිය සූත්‍රය

මහණෙනි, සංයොජනවලට හිතකර ධර්මත්, සංයොජනත් දෙශනා කරමි. එය අසව් මහණෙනි, සංයොජනවලට හිතකර ධර්ම මොනවා ද? සංයොජන මොනවා ද? මහණෙනි, රූපය... විඳානය සංයොජනවලට හිතකර ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයි නම් එය එහි සංයොජනයයි. මහණෙනි, මේ සංයොජනවලට හිතකර ධර්මයි. මේ සංයොජනයි.

9. උපාදනීය සූත්‍රය

මහණෙනි, උපාදනවලට හිතකර ධර්මත් උපාදනත් දෙශනා කරමි. එය අසව්. මහණෙනි, උපාදනවලට හිතකර ධර්ම මොනවා ද? උපාදන මොනවා ද? මහණෙනි, රූපය... විඳානය උපාදන වලට හිතකර ධර්මයකි. එහි යම් ඡන්දරාගයක් වෙයි නම් එය එහි උපාදනයයි. මහණෙනි, මේ උපාදනවලට හිතකර ධර්මයි. මේ උපාදනයි.

10. සීල සූත්‍රය

එක් සමයක ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේත් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් වහන්සේත් බරණැස ඉසිපතන මිගදයෙහි වසති. ඉක්බිති ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් වහන්සේ සවස විවේකයෙන් නැගිට ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත පැමිණ පිළිසඳර නිමවා "ඇවැත් ශාරිපුත්‍රයෙනි, සිල්වත් භික්ෂුව විසින් කවර ධර්ම නුවණින් මෙනෙහි කළ යුතුද"යි විමසූහ.

ඇවැත් කොට්ඨිත, සිල්වත් භික්ෂුව විසින් රූප... විඳාන යන මේ උපාදන ස්කන්ධ පහ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන්, රෝග වශයෙන්, තමන් ගේ නො වන්නක් වශයෙන්, නැසෙන්නක් වශයෙන්, ශූන්‍ය වශයෙන්, ආනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. සිල්වත් භික්ෂුව මේ උපාදන ස්කන්ධ පහ අනිත්‍ය වශයෙන්... නුවණින් මෙනෙහි කරන්නේ සෝවාන් ඵලය ලබන්නේ ය යන මෙය පවක්තේ ය.

ඇවැත් ශාරීපුත්‍රයෙනි, සෝවාන් භික්ෂුව විසින් කුමන ධර්ම නුවණින් මෙනෙහි කළ යුතු ද? ඇවැත් කොටඨිත, සෝවාන් භික්ෂුව විසිනුත් මේ උපාදාන ස්කන්ධ පහ අනිත්‍ය වශයෙන්... මෙනෙහි කළ යුතු ය. සෝවාන් භික්ෂුව.. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නේ සකෘදගාමී ඵලය ලබන්නේ ය යන මෙය සිදුධ වන්නේ ය. ශාරීපුත්‍රයෙනි, සකෘදගාමී භික්ෂුව විසින් කවර ධර්මයක් නුවණින් මෙනෙහි කළ යුතු ද? කොටඨිත, සකෘදගාමී භික්ෂුව විසිනුත් මේ.. අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය.. අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ අනාගාමී ඵලය ලබන්නේ ය යන මෙය පවත්නේ ය. ශාරීපුත්‍රයෙනි, අනාගාමී භික්ෂුව විසින් කවර ධර්මයක් මෙනෙහි කළ යුතු ද? කොටඨිතයෙනි, අනාගාමී භික්ෂුව විසිනුත්.. අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය..මෙනෙහි කරන්නේ අර්හත් ඵලය ලබන්නේය යන මේ කරුණ විද්‍යමාන යි. ශාරීපුත්‍රයෙනි, රහත් භික්ෂුව විසින් කවර ධර්මයක් නුවණින් මෙනෙහි කළ යුතු ද? කොටඨිතයෙනි, රහත් භික්ෂුව විසිනුත් මේ... අනාත්ම වශයෙන් මෙනෙහි කළ යුතු ය. ඇවැත්නි, රහතන් වහන්සේට ඉන් එහා කළ යුත්තක් නැත. කළ දේ නැවත කිරීමක් ද නැත. එහෙත් මේ ධර්ම වඩන ලද්දේ බහුලව කරන ලද්දේ ඉහාත්මයෙහි සැප විහරණය පිණිසත් සිහිනුවණ පිණිසත් පවති.

11. සුනවන්ත සූත්‍රය

පසෙක හුන් ආයුෂ්මත් කොටඨිත තෙරුන් වහන්සේ සැරියුත් තෙරුන්ට "ආයුෂමත් ශාරීපුත්‍රයෙනි, උගත් භික්ෂුව විසින් කවර ධර්ම නුවණින් මෙනෙහි කළ යුතුද"යි විමසූහ. කොටඨිත, උගත් භික්ෂුව විසින් රූප... විඥාන යන මේ උපාදාන ස්කන්ධ පහ... අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. මෙනෙහි කරන්නේ... සෝවාන් ඵලය... සකෘදගාමී ඵලය,.. අනාගාමී ඵලය... ආර්හත් ඵලය ලබන්නේ ය යන මෙය විද්‍යාමාන වූවකි. ශාරීපුත්‍රයෙනි, රහත් භික්ෂුව විසින් කවර ධර්ම මෙනෙහි කළ යුතු ද? කොටඨිතයෙනි, රහක් භික්ෂුව විසිනුත් .. අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතු ය. ඇවැත්නි, රහතන් වහන්සේට ඉන් එපිට කළ යුත්තක් නැත... සිහිනුවණ පිණිස පවති.

12. පඨම කප්ප සූත්‍රය

එකල ආයුෂමත් කපප, භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, කෙසේ දන්නා, දක්නා තැනැත්තාට මේ විඤ්ඤාණ සහිත කයෙහිත් බාහිර සියලු අරමුණුවලත් අහංකාර මමංකාර මාන අනුසය ඇති නො වන්නේද"යි සැලකළේය.

කපප, අතීත අනාගත වර්තමාන.. යම් රූපයක්... විඥානයක් තිබේ ද ඒ හැම රූපය... විඥානය එය මගේ නො වෙයි. ඒ මම නො වෙමි. ඒ මගේ ආත්මය නො වෙයි කියා මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දකී. කප්ප, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට.. අහංකාර මමංකාර මානානුසය නො වෙයි.

13. දුතිය කප්ප සූත්‍රය

පසෙක හුන් ආයුෂමත් කපප, භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, කෙසේ දන්නා කෙසේ දක්නහු ගේ සිත මේ සවිඤ්ඤාණක ශරීරයෙහිත් බාහිර සියලු අරමුණුවලත් අහංකාර මමංකාර මානවලින් පහව මාන ඉක්ම වූ සන්සුන් මිදුණු එකක් වන්නේදයි සැලකළේය.

කපප, යම් කිසි අතීත අනාගත වර්තමාන රූප... විඥානයක් තිබේ ද? ඒ සියලු රූප... විඥාන.. මගේ ආත්මය නො වෙයි කියා මෙසේ ඇති සැටියෙන් හොඳ නුවණින් දක උපාදාන රහිතව මිදුණේ වෙයි. කපප, මෙසේ දන්නහු ගේ.. සිත.. මැනවින් මිදුණේ වෙයි.

3. අවිජ්ජා වර්ගය

1. පඨම සමුදයධම්ම සූත්‍රය

ඉක්බිති එක් භික්ෂු නමක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, අවිජ්ජා අවිජ්ජා යි කියනු ලැබේ. ස්වාමීනි, අවිජ්ජාව කුමක් ද? කොපමණකින් අවිජ්ජාගත වෙයි ද? යි සැල කළේය. භික්ෂු නම, මෙහි නුගත් පෘථග් ජනයා ඉපදීම ස්වාභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය ඉපදීම ස්වාභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය යි තතු සේ නො දනියි. නැසීම ස්වභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය නැසීම ස්වභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය යි තතු සේ නො දනි. ඇති වීම නැති වීම ස්වභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය ඇති වීම නැති වීම ස්වභාව කොට පවත්නා රූපය... විඤ්ඤාණය යි තතු සේ නො දනී. භික්ෂු නම, මෙය අවිද්‍යාවයි. මෙපමණකින් අවිද්‍යාවට පැමිණියේ වෙයි.

මෙසේ වදළ කල ඒ භික්ෂුව "ස්වාමීනි, විජ්ජා විජ්ජා යි කියනු ලැබේ. ස්වාමීනි, විද්‍යාව කුමක් ද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වෙයි ද"යි සැලකළේය. භික්ෂු නම, මෙහි උගත් ආර්ය ශ්‍රාවකයා ඉපදීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණය ඉපදීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණය යි තතු සේ දනියි. නැසීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණය නැසීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණය යි තතු සේ දනියි. ඉපදීම නැසීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණය ඉපදීම නැසීම ස්වභාව කොට ගත් රූපය... විඤ්ඤාණයයි තතු සේ දනියි. භික්ෂු නම, මේ විද්‍යාවයි. මෙතෙකින් විද්‍යාවට පැමිණියේ වෙයි.

2. දුතිය සමුදයධම්ම සූත්‍රය

පසෙක හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරුන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේට "ශාරිපුත්‍රයෙනි, අවිද්‍යාව අවිද්‍යාවයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කුමක් ද? කොතෙකින් අවිද්‍යාවට පැමිණියේ වෙයිද"යි විචාළහ.

ඇවැත්නි, මෙහි නුගත් පෘථග් ජනයා ඇති වන සැටියාව ඇති රූපය... විඤ්ඤාණය... තතු සේ නො දනියි. නැති වන සැටියාව ඇති රූපය, විඤ්ඤාණය.. තතු සේ නො දනියි. ඇති වන නැති වන සැටියාව ඇති රූපය.... විඤ්ඤාණය තතු සේ නො දනියි. ඇවැත්නි, මේ අවිද්‍යාවය යි කියනු ලැබේ. මෙතෙකින් අවිද්‍යාවට පැමිණියේ යි කියනු ලැබේ.

3. තතියසමුදයධම්ම සූත්‍රය

පසෙක හුන් මහාකොට්ඨිත තෙරුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේගෙන් "ශාරිපුත්‍රයෙනි, විද්‍යාව විද්‍යාවය යි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කුමක් ද? කොපමණකින් විද්‍යාවට පැමිණියේ වෙයි "දැයි විචාළහ.

ඇවැත්නි, මෙහි උගත් ආර්ය ශ්‍රාවකයා ඇති වනසුලු රූපය... විඤ්ඤාණය.. තතු සේ දනියි. නැති වනසුලු රූපය... විඤ්ඤාණය තතු සේ දනියි. ඇති වන නැති වනසුලු රූපය... විඤ්ඤාණය තතු සේ දනියි. ඇවැත්නි, මේ විද්‍යාවයි. මෙතෙකින් විද්‍යාවට පැමිණියේ වෙයි.

4. පඨමඅස්සාද සූත්‍රය

පසෙක හුන් මහාකොට්ඨිත තෙරුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේ ගෙන් "ශාරිපුත්‍රයෙනි, අවිද්‍යාව අවිද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, මේ අවිද්‍යාව කුමක් ද? කොපමණකින් අවිද්‍යාගත වෙයිද"යි විමසූහ.

ඇවැත්නි, මෙහි නුගත් පෘථග් ජනයා රූපයේ... විඤ්ඤාණයේ ආස්වාදය, ආදීනව, නිස්සරණය තතු සේ නො දනියි. ඇවැත්නි, මෙය අවිද්‍යාවයි කියනු ලැබේ. මෙපමණකින් අවිද්‍යාගත වෙයි.

5. දුතිය අස්සාද සූත්‍රය

පසෙක හුන් මහකොටඨිත තෙරුන් වහන්සේ "ශාරිපුත්‍රයෙනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කුමක් ද? කොපමණකින් විද්‍යාගත වෙයිද"යි විමසී ය. ඇවැත්නි, මෙහි උගත් ආර්ය ශ්‍රාවකයා රූපයේ... විඤ්ඤාණයේ ආස්වාද ආදීනව නිස්සරණ තතු සේ දනියි. ඇවැත්නි, මෙය විද්‍යාව යි. මෙපමණකින් විද්‍යාගත වෙයි.

6. පඨමසමුදය සූත්‍රය

පසෙක හුන් මහකොටඨිත තෙරුන් වහන්සේ "ශාරිපුත්‍රයෙනි, අවිද්‍යාව අවිද්‍යාවය යි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කුමක් ද? කොතෙකින් අවිද්‍යාගත වෙයිදයි විමසුහ. ඇවැත්නි, නුගත් පෘථග් ජනයා රූපයේ.. විඤ්ඤාණයේ ඇති වීම, නැති වීම, ආස්වාදය, ආදීනව, නිස්සරණ තතු සේ නො දනී. ඇවැත්නි, මේ අවිද්‍යාවයි. මෙතෙකින් අවිද්‍යාගත වෙයි.

7. දුතිය සමුදය සූත්‍රය

පසෙක හුන් මහාකොටඨිත තෙරුන් වහන්සේ "ශාරිපුත්‍රයෙනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. මේ විද්‍යාව කුමක් ද? කොපමණකින් විද්‍යාගත වෙයිදයි විමසුහ. ඇවැත්නි, මෙහි උගත් ආර්ය ශ්‍රවකයා රූපයේ... විඤ්ඤානයේ ඇති වීම නැති වීමත්, ආස්වාදයත්, ආදීනවත්, නිස්සරණයත් තතු සේ දනියි. ඇවැත්නි, මේ විද්‍යාවයි කියනු ලැබේ. මෙතෙකින් විද්‍යාගත වෙයි.

8. කොට්ඨිත සූත්‍රය

එක් කලෙක සැරියුත් තෙරුන් වහන්සේත් මහාකොටඨිත තෙරුන් වහන්සේත් බරණැස ඉසිපතන මිගදයෙහි වසති. ඉක්බිති සැරියුත් තෙරුන් වහන්සේ සවස් කාලයෙහි පල සමවතින් නැගිට මහාකොටඨිත තෙරුන් වෙත ගොස් පිළිසඳර නිමවා "කොටඨිතයෙනි, අවිද්‍යාව අවිද්‍යාව යි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව කුමක් ද? කොතෙකින් අවිද්‍යාගත වෙයිදයි විමසුහ.

ඇවැත්නි, මෙහි අවියත් පෘථග් ජනයා රූපයේ... විඤ්ඤානයේ ආස්වාද, ආදීනව, නිස්සරණ තතු සේ නො දනියි. ඇවැත්නි, මෙය අවිද්‍යාවයි කියනු ලැබේ. මෙතෙකින් අවිද්‍යාගත වෙයි.

මෙසේ කී කල සැරියුත් තෙරුන් වහන්සේ "කොටඨිතයෙනි, විද්‍යාව විද්‍යාව යි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව කුමක් ද? කොතෙකින් විද්‍යාගත වෙයි ද? ඇවැත්නි, මෙහි වියත් ආර්ය ශ්‍රාවකයා රූපයේ... විඤ්ඤානයේ ආස්වාදයත්, ආදීනවත්, නිස්සරණයත් තතු සේ දනියි. ඇවැත්නි, මේ විද්‍යාවයි කියනු ලැබේ. මෙතෙකින් විද්‍යාගත වෙයි.

9. දුතිය කොටඨික සූත්‍රය

පසෙක හුන් සැරියුත් තෙරුන් වහන්සේ "කොටඨිතයෙනි, අවිද්‍යා අවිද්‍යායි කියනු ලැබේ. මේ අවිද්‍යාව කුමක් ද ? කොතෙකින් අවිද්‍යාගත වෙයි ද? ඇවැත්නි, නො වියක් පෘථග් ජනයා රූපයේ... විඤ්ඤානයේ ඇති වීම, නැති වීම, ආස්වාදය, ආදීනව, නිස්සරණ තතු සේ නො දනියි. මේ අවිද්‍යාවයි මෙතෙකින් අවිද්‍යාගතත් වෙයි.

මෙසේ පැවසූ කල සැරියුත් තෙරුන් වහන්සේ "කොටඨිතයෙනි, විද්‍යා විද්‍යායි කියනු ලැබේ. කුමක් ද මේ විද්‍යාව ? කොතෙකින් විද්‍යාගත වෙයි ද?යි විමසුහ. ඇවැත්නි, මෙහි වියත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤානයෙහි ඇති වීම, නැති වීම, ආස්වාදය, ආදීනව, නිස්සරණ තතු සේ දනියි. මේ විද්‍යාවයි. මෙතෙකින් විද්‍යාගතත් වෙයි

10. තතියකොට්ඨිත සූත්‍රය

පසෙක හුන් සැරියුත් තෙරුන් වහන්සේ "කොටඨිතයෙනි, අවිද්‍යා අවිද්‍යායි කියනු ලැබේ. මේ අවිද්‍යාව කුමක් ද? කොතෙකින් අවිද්‍යාගතත් වෙයි ද? ඇවැත්නි, මෙහි අවියත් පෘථග් ජනයා රූපය... විඤ්ඤානය නො දනියි. රූප... විඤ්ඤාන සමුදය නො දනියි. රූප... විඤ්ඤාන නිරොධය නො දනියි. රූප... විඤ්ඤාන නිරොධගාමිනී පටිපදව නො දනියි. ඇවැත්නි, මේ අවිද්‍යාවයි. මෙතෙකින් අවිද්‍යාගතත් වෙයි.

මෙසේ පැවසූ පසු සැරියුත් තෙරුන් වහන්සේ කොටඨිතයෙනි, විද්‍යා විද්‍යායි කියනු ලැබේ. මේ විද්‍යාව කුමක් ද? කොතෙකින් විද්‍යාගත වෙයි ද? ඇවැත්නි, මෙහි ආර්ය ශ්‍රාවකයා රූප... විඤ්ඤාන දනියි. රූප... විඤ්ඤාන සමුදය දනියි. රූප... විඤ්ඤාන නිරොධය දනියි. රූප... විඤ්ඤාන නිරොධගාමිනී පටිපදව දනියි. ඇවැත්නි, මේ විද්‍යායි කියනු ලැබේ. මෙතෙකින් විද්‍යාගතත් වෙයි.

4. කුක්කුළ වර්ගය

1. කුක්කුළ සූත්‍රය

මහණෙනි, රූපය උණු අළු ගොඩකි. වේදනාව... විඤ්ඤාණය උණු අළු ගොඩකි. මහණෙනි, මෙසේ දක්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. මේ රහත් බව පැතූ අනිකක් නැතැයි දනියි.

2. පඨම අනිච්ච සූත්‍රය

මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් අනිත්‍ය ද? රූපය... විඤ්ඤාණය අනිත්‍යය. එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතු ය. මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුය.

3. දුතිය අනිච්ච සූත්‍රය

මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් අනිත්‍ය ද? රූපය... විඤ්ඤාණය අනිත්‍යය. එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතු ය. මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතු ය.

4. තතිය අනිච්ච සූත්‍රය

මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුයි. මහණෙනි, කුමක් අනිත්‍ය ද? රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුයි. මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුයි.

5. තතිය අනිච්ච සූත්‍රය

මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතු ය. මහණෙනි, කුමක් අනිත්‍ය ද? රූපය... විඤ්ඤාණය අනිත්‍යයි. එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුයි මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුයි.

6. පඨම දුක්ඛ සූත්‍රය

මහණෙනි, යමක් දුක් නම් එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුයි. මහණෙනි, කුමක් දුක් ද? රූපය... විඤ්ඤාණය දුක්ඛ. එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුය.

7. දුතියදුක්ඛ සූත්‍රය

මහණෙනි, යමක් දුක් නම් එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් දුක් ද? රූපය... විඤ්ඤාණය දුක්ඛ. එහි ලා ඔබලා ගේ රාගය දුරු කළ යුතු ය.

8. තතිය දුක්ඛ සූත්‍රය

මහණෙනි, යමක් දුක් නම් එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් දුක් ද? රූපය... විඤ්ඤාණය දුක් ය. මහණෙනි, එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතු ය.

9. පඨම අනන්ත සූත්‍රය

මහණෙනි, යමක් අනාත්ම නම් එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් අනාත්ම ද? රූපය... විඤ්ඤාණය අනාත්මයි. එහි ඔබලා ගේ ඡන්දය දුරු කළ යුතුය.

10. දුතිය අනත්ත සූත්‍රය

මහණෙනි, යමක් අනාත්ම නම් එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් අනාත්ම ද? රූපය... විඤ්ඤාණය අනාත්මයි. එහි ඔබලා ගේ රාගය දුරු කළ යුතුයි.

11 තතිය අනත්ත සූත්‍රය

මහණෙනි, යමක් අනාත්ම නම් එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතුය. මහණෙනි, කුමක් අනාත්ම ද? රූපය... විඤ්ඤාණය අනාත්මයි. එහි ඔබලා ගේ ඡන්දරාගය දුරු කළ යුතු යි.

12. නිබ්බිදබහුල සූත්‍රය

මහණෙනි, රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීම් බහුලව යම් වාසය කිරීමක් වෙයි ද? මෙය ශ්‍රද්ධාවෙන් මහණ වූ කුලපුත්‍රයාට අනුරූප ධර්මයකි. ඔහු රූපයෙහි... විඤ්ඤාණයෙහි කලකිරීම් බහුලව වසන්නේ රූපය... විඤ්ඤාණය පිරිසිඳ දනියි. රූපය... විඤ්ඤාණය පිරිසිඳ දන්නේ රූපයෙන්... විඤ්ඤාණයෙන් අත මිදෙයි. ජාති ජරාමරණ සොක පරිදෙව දුක් දොම්නස් උපායාසවලින් අත මිදෙයි. දුකින් අත මිදෙයි කියමි.

13. අනිච්චානුපස්සනා සූත්‍රය

මහණෙනි, රූපයෙහි... විඤ්ඤාණයෙහි අනිත්‍යය අනුව දකිමින් යම් විසීමක් වෙයි ද මෙය ශ්‍රද්ධාවෙන් මහණ වූ කුලපුත්‍රයාට අනුරූප ධර්මයකි. ඔහු රූපයෙහි... විඤ්ඤාණයෙහි අනිත්‍ය අනුව දකිමින් වසන්නේ රූපය... විඤ්ඤාණය පිරිසිඳ දනියි. රූපය... විඤ්ඤාණය පිරිසිඳ දන්නේ රූපයෙන් විඤ්ඤාණයෙන් අතමිදෙයි. සෝක... උපායාසවලින් අතමිදෙයි. දුකින් අතමිදෙයි කියමි.

14. දුක්ඛානුපස්සී සූත්‍රය

මහණෙනි, රූපයෙහි... විඤ්ඤාණයෙහි දුක අනුව දකිමින් යම් විසීමක් වෙයි ද මෙය සැදැහැයෙන් මහණ වූ කුලපුත්‍රයාට අනුරූප දහමයි. ඔහු රූපය... විඤ්ඤාණය දුක අනුව බලමින් වසන්නේ රූපය... විඤ්ඤාණය පිරිසිඳ දනියි. රූපය... විඤ්ඤාණය පිරිසිඳ දන්නේ රූපයෙන්... විඤ්ඤාණයෙන් අත මිදෙයි. සොක... උපායාසවලින් මිදෙයි. දුකින් අත මිදෙයි කියමි.

15. අනත්තානුපස්සන සූත්‍රය

මහණෙනි, රූපයෙහි... විඤ්ඤාණයෙහි අනාත්මය අනුව දකිමින් යම් විසීමක් තිබේ නම් මෙය සැදැහැයෙන් මහණ වූ කුල කුලපුත්‍රයාට අනුරූප දහමකි. ඔහු රූපය... විඤ්ඤාණය අනාත්ම වශයෙන් දකිමින් වසන්නේ රූපය... විඤ්ඤාණය පිරිසිඳ දනියි. රූපය... විඤ්ඤාණය පිරිසිඳ දකින්නේ රූපයෙන්... විඤ්ඤාණයෙන් අත මිදෙයි. සොක... උපායාස වලින් අත මිදෙයි. දුකින් අත මිදෙයි කියමි.

5. දිටඨී වර්ගය

1.අජඣත්ත සූත්‍රය

මහණෙනි, කුමක් තිබෙන විට කුමක් නිසා තමා තුළ සැප දුක හට ගන්නේ ද? සවාමීනි, අපේ ධර්මය භාග්‍යවතුන් වහන්සේ මූල් කොට පවතී. සවාමීනි, මේ කියමනෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සෙ විසින් ම දෙශනා කරන්නේ නම් මැනවි.

මහණෙනි, රූපය... විඤ්ඤාණය තිබෙන විට රූපය... විඤ්ඤාණය නිසා තමා තුළ සැප දුක උපදී. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? සවාමීනි, අනිත්‍යයි. යමක් අනිත්‍ය නම් එය දුක් ද? සැප ද? සවාමීනි, දුකයි. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ඇසුරු නො කොට තමා තුළ සැප දුක් උපදී ද? සවාමීනි, එසේ නො වෙයි.

මහණෙනි, මෙසේ දක්නා වියන් ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත්... විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරෙමින් නො ඇලෙයි.... මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

2. එතං මම සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට කුමක් නිසා කුමකට පිවිස මෙය මගේ ය. මේ මම වෙමි. මේ මගේ ආත්මය යි දකී ද? සවාමීනි, අපේ දහම් භාග්‍යවතුන් වහන්සේ මූල් කොට පවතී. සවාමීනි, මේ කියමනෙහි අර්ථය දෙශනා කරන්නේ නම් මැනවි.

මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇතිවිට රූපය... විඤ්ඤාණය නිසා රූපයට... විඤ්ඤාණයට පිවිස මේ මගේය , මේ මම වෙමි. මේ මා ගේ ආත්මය යි දකී. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය...

විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම් දුක් ද? සැප ද? ස්වාමීනි, දුකයි. යමක් අනිත්‍ය නම්, වෙනස් වනසුලු නම් එය ඇසුරු නො කොට මෙය මගේ ය, මේ මම වෙමි. මේ මගේ ආත්මය යි නො දකි ද? ස්වාමීනි, එය එසේ නො වෙයි.

මහණෙනි, මෙසේ දක්නා වියත් ආර්ය ශ්‍රාවකයා රූපයෙහිත්... විඤ්ඤාණයෙහිත් කලකිරෙයි. කලකිරෙමින් නො ඇලෙයි... මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

3. සෝ අත්තා සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට කුමක් නිසා කුමකට පිවිස ඒ මම ආත්මය වෙමි, ඒ මම ලෝකය වෙමි, ඒ මම නිත්‍ය, ස්ථිර, සදාකාලික, වෙනසට පත් නො වන පරලොව වන්නෙමියි මෙසේ දෘෂ්ටිය උපදී ද ? ස්වාමීනි, අප ගේ දහම් භාග්‍යවතුන් වහන්සේ මුල් කොට පවතී.. මෙහි අදහස දෙශනා කරන්නේ නම් මැනවි.

මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට රූපය... විඤ්ඤාණය නිසා රූපයට... විඤ්ඤාණයට පිවිස ඒ මම ආත්මය වෙමි. ඒ මම ලෝකය වෙමි. ඒ මම නිත්‍ය, ස්ථිර, සදාකාලික, වෙනස් නොවන, පරලොව වන්නෙමියි මෙසේ දෘෂ්ටිය උපදී, මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි. යමක් අනිත්‍ය නම්... එය ඇසුරු නො කොට ඒ මම ආත්මය වෙමි.. මෙසේ දෘෂ්ටිය උපදනේ ද? ස්වාමීනි, එය නො වේම යි. මහණෙනි, මෙසේ වියත් ආර්ය ශ්‍රාවකයා මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

4. නොව මෙ සියා සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට කුමක් නිසා කුමකට පිවිස මම නො වෙමි නම් මගේ නො වෙයි, මම නො වන්නෙමි නම් මගේ නොවන්නේ ය යි මෙවැනි දෘෂ්ටියක් උපදී ද? ස්වාමීනි,... භාග්‍යවතුන් වහන්සේ මෙහි අර්ථය දෙශනා කරන්නේ නම් මැනවි.

මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට රූපය... විඤ්ඤාණය නිසා රූපයට... විඤ්ඤාණයට පිවිස මම නො වෙමි නම් මගේ නො වෙයි, මම නො වන්නෙමි නම් මගේ නො වන්නේය යි මෙසේ දෘෂ්ටිය උපදී. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි. යමක් අනිත්‍ය නම්.. එය ඇසුරු නො කොට මම නො වෙමි නම් මගේ නොවෙයි.. කියා මෙවැනි දෘෂ්ටියක් උපදී ද? ස්වාමීනි, එසේ නො වන්නේ ම ය. මහණෙනි, මෙසේ දක්නා වියත් ආර්ය ශ්‍රාවකයා.. මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දකියි.

5. මිච්ඡාදිට්ඨි සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට... මිථ්‍යාදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි අර්ථය දෙශනා කරන සේක් නම් මැනවි. මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට රූපය... විඤ්ඤාණය නිසා.. මිථ්‍යා දෘෂ්ටිය උපදී.

මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි. යමක් අනිත්‍ය නම්... එය ඇසුරු නො කොට මිථ්‍යාදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි, එය නො වේ ම ය. මහණෙනි, මෙසේ දක්නා වියත් ආර්ය ශ්‍රාවකයා.. මේ රහත් බව සඳහා අනිකක් නැතැයි දනියි.

6. සක්කායදිට්ඨි සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට... සත්කායදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි,... භාග්‍යවතුන් වහන්සේ මෙහි අර්ථය දෙශනා කරතොත් මැනවි. මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට.. සත්කායදෘෂ්ටිය උපදී. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි.. යමක් අනිත්‍ය නම්.. එය ඇසුරු නො කොට සත්කායදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි, එය නො වෙයි. මෙසේ දක්නේ... රහත් බව සඳහා අනිකක් නැතැයි දකියි.

7. අත්තානුදිට්ඨි සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට,. ආත්මානුදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි,.. මෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදළොත් හොඳයි. මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට.. ආත්මානුදෘෂ්ටිය උපදී. මහණෙනි,.. කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි... යමක් අනිත්‍ය නම්.. එය ඇසුරු නො කොට ආත්මානුදෘෂ්ටිය උපදී ද? ස්වාමීනි. එය නො වෙයි. මෙසේ දක්නේ.. රහත් බව සඳහා අනිකක් නැනැයි දකියි.

8. පඨම අභිනිවෙස සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට සංයොජන, වෙළීම් බැඳීම් ඇති වෙයි ද? ස්වාමීනි,.. මෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදළොත් හොඳ යි. මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට... සංයොජන... වෙළීම්, බැඳීම් ඇති වෙයි. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? ස්වාමීනි, අනිත්‍යයි යමක් අනිත්‍ය නම්..එය ඇසුරු නො කොට සංයෝජන වෙළීම්, බැඳීම් ඇති වෙයි ද? ස්වාමීනි, එය නො වෙයි.... මෙසේ දක්නේ මේ රහත් බව සඳහා අනිකක් නැනැයි දකියි.

9. දුතිය අභිනිවෙස සූත්‍රය

මහණෙනි, කුමක් ඇති විට සංයොජන වෙළීම්, බැඳීම් ගිලගැනීම් ඇති වෙයි ද? ස්වාමීනි, මෙහි අර්ථය භාග්‍යවතුන් වහන්සේ වදළොත් මැනවි. මහණෙනි, රූපය... විඤ්ඤාණය ඇති විට සංයොජන වෙළීම් බැඳීම් ගිලගැනීම් ඇති වෙයි. මහණෙනි, කුමක් සිතන්නහු ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද ? ස්වාමීනි, අනිත්‍ය යි.. යමක් අනිත්‍ය නම්... එය ඇසුරු නො කොට සංයොජන වෙළීම්, බැඳීම්, ගිලගැනීම් ඇති වෙයි ද? ස්වාමීනි, එය නො වෙයි. මෙසේ දක්නේ... මේ රහත් බව සඳහා අනිකක් නැනැයි දනියි.

10. ආනන්ද සූත්‍රය

පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ ‘ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගෙන් අසා තනිව සමූහයෙන් වෙන්ව නො පමාව කෙලෙස් තවන වීර්යය ඇතිව නිවනට යොමු කළ සිතින් වාසය කිරීම සඳහා කෙටියෙන් බණක් මට දෙශනා කරනු මැනවැ’යි සැලකළහ.

ආනන්ද, කුමක් සිතන්නෙහි ද? රූපය... විඤ්ඤාණය නිත්‍ය ද? අනිත්‍ය ද? අනිත්‍යයි ස්වාමීනි, යමක් අනිත්‍ය නම්... එය මෙය මගේ ය. මේ මම වෙමි. මේ මගේ ආත්මයයි දකිම සුදුසු ද? ස්වාමීනි, එය සුදුසු නො වෙයි. එබැවින් ආනන්ද, මෙහි ලා අතීත අනාගත වර්තමාන... යම් රූප... විඤ්ඤාණයක් වෙයි ද එය මෙය මගේ නොවෙයි. මේ මම නො වෙමි. මේ මගේ ආත්මය නො වෙයි කියා දකිය යුතුය. ආනන්ද, මෙසේ දක්නා වියන් ආර්ය ශ්‍රාවකයා... මේ රහත් බව සඳහා අනිකක් නැනැයි දකියි.